**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**දසවැනි පාර්ලිමේන්තුව**
**(පළමුවැනි සභාවාරය)**

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 545

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල තෙවැනි වාර්තාව

**(2025.02.07 සිට 2025.03.05 දක්වා)**

**නියෝජ්‍ය කාරක සභා සභාපති**
**ගරු හේමාලි වීරසේකර මහත්මිය**
**විසින්**
**2026 ක් වූ ජුනි මස 25 වැනි දින ඉදිරිපත් කරන ලදී.**

අනුමතිය ලැබීම මත වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| අනු අංකය | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01. | ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.07 |
| 02. | විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.18 |
| 03. | තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.19 |
| 04. | ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.21 |
| 05. | කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.21 |
| 06. | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.27 |
| 07. | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.28 |
| 08. | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.04 |
| 09. | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.05 |
| 10. | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.05 |

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්යමණ්ඩලය (2025.02.07 – 2025.03.05)**

- ඩී. ඩී. යූ. කේ. මුණසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභාවේ ලේකම්
- චන්දිමා සුහසිංහ මහත්මිය, ප්‍රධාන නිලධාරී
- ඩී. ආර්. ඒ. එම්. ඩී. සෙව්වන්ති රණසූරිය, සහකාර ප්‍රධාන නිලධාරී
- උදේශිකා තත්සරණි වීරසිරි මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ඩබ්. පී. යූ. හංසනී මුණසිංහ මිය, පාර්ලිමේන්තු නිලධාරී
- මාධවී අර්ථනායක මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ඩබ්. එම්. මධුෂාණි වීරසේකර, පාර්ලිමේන්තු නිලධාරී
- ප්‍රභා හෙට්ටිආරච්චි මෙනෙවිය, පාර්ලිමේන්තු නිලධාරී
- රුක්මණී දේවී මහත්මිය, ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තක
- එම්. එල්. මුහම්මදු පත්හුල්ලා මහතා, පරිගණක ක්‍රියාකරු

**අමාත්‍යාංශ ලේකම්වරුන්**

- එච්. එස්. එස්. තුයියකොන්නා මහතා - ආරක්ෂක අමාත්‍යාංශය
- කේ. එම්. එම් සිරිවර්ධන මහතා - මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
- වරුණ ශ්‍රී ධනපාල මහතා (වැ.බ) - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
- කේ. එම්. ජී. එස්. නාලක කළුවැව මහතා - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
- ඩී. පී. වික්‍රමසිංහ මහතා - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
- අරුණි රණරාජ මහත්මිය - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
- එම්. ඒ. එල්. එස්. එන්. කේ. මන්ත්‍රිනායක මහතා - ධීවර, ජලජ, සහ සාගර සම්පත් අමාත්‍යාංශය
- ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා මහතා - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
- බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා - වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
- වෛද්‍ය අනිල් ජාසිංහ මහතා - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
- කේ. ඒ. විමලේන්තිරරාජා මහතා - වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
- එස්. එම්. පියතිස්ස මහතා - කම්කරු අමාත්‍යාංශය
- යූ. ජී. රංජිත් ආරියරත්න මහතා - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
- එස්. ආලෝකබණ්ඩාර මහතා - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
- මලර්මතී ගංගාදරන් මහත්මිය - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

- වයි. එල්. මොහොමඩ් නවවි මහතා - විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
- ඩී. ඩබ්ලිව්. ආර්. බී. සෙනෙවිරත්න මහතා - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
- මහාචාර්ය කේ. ටී. එම්. උදයංග හේමපාල මහතා - බලශක්ති අමාත්‍යාංශය
- ඒ. එච්. එම්. යූ. අරුණ බණ්ඩාර මහතා - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
- කේ. ඩී. ආර්. ඔල්ගා මහත්මිය - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
- කේ. ආර්. උඩුවාවල මහතා - පරිසර අමාත්‍යාංශය
- ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා - බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය - අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

## ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

## පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 07

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (සභාපති)
ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍ය)
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු උපුල් කිත්සිරි මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු අජිත් ගිහාන් මහතා
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු මුහම්මද් ෆයිසාල් මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු වසන්ත සමරසිංහ මහතා
ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු නලින් හේවගේ මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
ගරු කන්දසාමි ප්‍රභු මහතා
ගරු සංජීව රණසිංහ මහතා
ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2021 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව**
(2024.12.06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2023 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාව සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාවට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

ධීවර කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය සතුව ඍජු වැඩපිළිවෙළක් පවතින බවත් එය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය තුළ දක්ෂ නිළධාරීන් පිරිසක් සිටින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිරි අයවැය තුළින් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් වන බැවින්, එම මුදල් යොදා ගනිමින් ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා කටයුතු කරන බවත් ඒ සඳහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහාය බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, නීති විරෝධී ලෙස ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා ලාංකීය මුහුදු තීරය වෙත පැමිණීම වැළැක්වීම සඳහා ඉන්දියානු මහකොමසාරිස් ඇතුළු නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් මෙකී ගැටලුව විසඳමින් ධීවර කර්මාන්තය සුභවාදී දිශාවකට යොමු කරවීම සඳහා කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙහිදී, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධව කෙටි හැඳින්වීමක් සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් එම ආයතනවල ප්‍රධානීන් වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව, ලංකා ධීවර සංස්ථාව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය, සී/ස සීනෝර් පදනම සහ නොර්ත් සී ලිමිටඩ් යන ආයතන සහ ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් එම ආයතනවල සභාපතිවරු විසින් ද ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ද දැනුවත් කිරීම් සිදුකරන ලදී.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් අදහස් පළ කරන ලදී.

එහිදී, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කර ඇති බවත් මෙකී සම්බන්ධීකාරක මන්ත්‍රීවරුන් හා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු අනෙකුත් ආයතන ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ මාස 3කට වරක් සම්බන්ධීකරණ කමිටුව රැස්වෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, සියලුම දිස්ත්‍රික්කවලට අදාළව දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු පැවැත්වෙන බවත් ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්, රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නිලධාරීන්, ධීවර ක්ෂේත්‍රයට අදාළ සියලු ප්‍රාදේශීය ආයතනවල නිලධාරීන්, නාවික හමුදා නිලධාරීන්, එම ප්‍රදේශවල පොලිස් නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික්කය තුළ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ ධීවර සමිති නියෝජිතයින් ඇතුළු 200ක පමණ පිරිසක් ඒ සඳහා සහභාගි වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී, මෙම කමිටුව මාස 03කට වරක් කැඳවීමට නියමිත බවත් එමඟින් ධීවර වරාය පිරිසිදු කිරීම සඳහා "ක්ලීන් ශ්‍රී ලංකා" වැනි වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම වැනි කාර්යයන් ඉටු කරන බැවින් තම දිස්ත්‍රික්කවල පැවැත්වෙන මෙම කමිටු සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සති 02කට වරක් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හමුවක් පැවැත්වෙන බවත් රට තුළ මිරිදිය ධීවර කර්මාන්තය නඟා සිටුවීම අරමුණු කර ගනිමින් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ මැදිහත්වීමෙන් පළාත් ධීවර අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හමුවක් මාස 03කට වරක් පැවැත්වෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

පළාත් ධීවර අමාත්‍යාංශය සතුව විශාල මුදලක් පවතින බැවින්, එම මුදල් භාවිතයෙන් විශාල වැඩ ප්‍රමාණයක් කළ හැකි බවත් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා සම්බන්ධීකරණයෙන් එම මුදල්, රේඛීය අමාත්‍යාංශයේ මුදල් සහ සම්පත් දායකත්වය යන සියල්ලෙහිම එකතුවෙන් සාර්ථක වැඩපිළිවෙළක් ඉදිරියේ දී දියත් කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මිරිදිය ජල මූලාශ්‍ර බහුල අනුරාධපුරය, පොළොන්නරුව සහ බදුල්ල වැනි දිස්ත්‍රික්කවල ගරු මන්ත්‍රීවරුන්ට මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ වීමෙන් තම ප්‍රදේශය තුළ විශාල වැඩ ප්‍රමාණයක් කර ගත හැකි වනු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3. වෙනත් කරුණු

### 3.1 ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා

#### 3.1.1 අඬ්ඩාලච්චේන ප්‍රදේශයෙන් මුහුදු ගොස් විපතට පත් වූ ධීවරයින්ට වන්දි මුදල් ලබා දීම

අඬ්ඩාලච්චේන ප්‍රදේශයේ ධීවර කටයුතු සඳහා මුහුදු ගිය ධීවරයින් දෙදෙනෙකුගෙන් එක් අයෙකු ජීවිතක්ෂයට පත්ව අනෙක් ධීවරයා නැවත පැමිණ ඇති බවත් ඔවුන්ගේ ධීවර බෝට්ටුව ද විනාශයට පත්ව ඉන්දියාවේ රඳවාගෙන ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම මියගිය ධීවරයාට සහ විපතට පත් බෝට්ටුව සඳහා හිමි වන්දි මුදල් සහ නැවත පැමිණි ධීවරයාට යම් ජීවනාධාරයක් ද ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම විනාශයට පත් වූ ධීවර බෝට්ටුව සඳහා වන්දි ලබාදීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම දැනුවත් කර ඇති බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 3.1.2 ඉන්දියාවේ තිරුච්චි සිරගෙදර රඳවාගෙන සිටින ධීවරයින් නිදහස් කරගැනීම

පසුගිය ජූලි මාසයේ පේදුරුතුඩුවෙන් මුහුදු ගිය ධීවරයින් 04 දෙනෙකු ඉන්දියාවේ තිරුච්චි සිරගෙදර රඳවාගෙන සිටින බවත් ඔවුන්ට අවශ්‍ය ආහාර ලබාගැනීම සඳහා ද සිරගෙදරට මුදල් ගෙවීමට සිදුව ඇති බැවින් ඔවුන් ගැටලුවලට මුහුණපා සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔවුන්ව නිදහස් කිරීමට අවශ්‍ය ලේඛන තමා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය වෙත මින් පෙර භාර දී ඇති නමුත් මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, මෙම ධීවරයින්ට එරෙහිව ඉන්දියානු අධිකරණයේ පවරා ඇති නඩු කටයුතු අවසාන බැවින් එම ධීවරයින් නිදහස් කරගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ධීවරයින්ට එරෙහිව ඉන්දියානු අධිකරණයේ නඩු පවරා ඇති බැවින් ඒ සම්බන්ධයෙන් මැදිහත් නොවූ නමුත්, මේ පිළිබඳ කරුණු සොයා බලා එම ධීවරයින් මෙරටට ගෙන ඒමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 3.2 ගරු වසන්ත සමරසිංහ මහතා

### 3.2.1 සතොස වෙළෙඳසැල් තුළ ධීවර සංස්ථාවට අයත් ශීතකළ මත්ස්‍ය අලෙවිසැල් පිහිටුවීම

සතොස වෙළඳසැල් ප්‍රමාණය 600ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇති බවත් එම වෙළෙඳසැල් තුළ ශීතකළ මත්ස්‍ය අලෙවිසැල බැගින් ස්ථාපිත කිරීමට හැකියාවක් පවතින බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙකී ක්‍රියාවලිය ලංකා ධීවර සංස්ථාව සමඟ ඒකාබද්ධව හවුල් ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් එතුළින් ජනතාවට අඩු මුදලට මාලු ලබා දීමට හැකියාවක් පවතින බවත් ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම මත්ස්‍ය අලෙවිසැල් තුළ ක්ෂණිකව පිසගත හැකි පරිදි පෙර සැකසූ, කුඩා ඇසුරුම් (sachet packets) ආකාරයට ඇසුරුම් කරන ලද මාලු අලෙවි කිරීමට යෝජනා කරන බවත් එම මාලු ඇසුරුම් කිරීම සඳහා රික්ත ඇසුරුම්කරණය (vacuum packaging) භාවිත කළ යුතු බවත් ගරු අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙකී යෝජනා සම්බන්ධයෙන් සතොස සභාපති දැනුවත් කර ධීවර සංස්ථාව සමඟ සාකච්ඡා ආරම්භ කිරීමටත් නව අවුරුදු සමය වන විට මෙය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය ලෙස මෙම යෝජනාව සම්බන්ධයෙන් සතොස ආයතනය සමඟ සාකච්ඡා කිරීමට සැලසුම් කර තිබූ බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මත්ස්‍ය අලෙවිය සඳහා ලංකා ධීවර සංස්ථාව මඟින් අලෙවිසැල් ආරම්භ කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් එයට පිළියමක් ලෙස සතොස වෙළෙඳසැල් තුළ ලංකා ධීවර සංස්ථාවට අයත් ශීතකරණ ස්ථානගත කොට මත්ස්‍ය අලෙවිය සිදු කිරීම වඩා ඵලදායී බවත් අවශ්‍යතාවය අනුව ලංකා ධීවර සංස්ථාවේ සේවකයෙකු මේ සඳහා අනුයුක්ත කිරීමට හැකියාවක් පවතින බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙකී ශීතකරණ තුළ විවිධ මිල මට්ටම්වල මත්ස්‍ය විශේෂ වර්ග අලෙවි කිරීමට බලාපොරොත්තු වන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ප්‍රාදේශීය අවශ්‍යතාවය අනුව මෙකී ශීතකරණ තුළ අලෙවි කිරීමට බලාපොරොත්තු වන මත්ස්‍ය විශේෂ පිළිබඳව ලංකා ධීවර සංස්ථාව මඟින් සමීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ඉදිරියේ දී එකී වාර්තා සමඟින් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, අකුරැස්ස, දෙනියාය වැනි ප්‍රධාන සමූපකාර ආයතනවල පවතින කෝප් සිටි (Co-op city) වෙළෙඳසැල් තුළ ලංකා ධීවර සංස්ථාවට අයත් මත්ස්‍ය අලෙවිසැල් ස්ථාපිත කිරීම සඳහා සාකච්ඡා පවත්වන බවත් දැනටමත් දකුණු පළාතේ සමූපකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ලංකා ධීවර සංස්ථාව මඟින් රටෙහි විවිධ ප්‍රදේශවල ධීවර අලෙවිසැල් ස්ථාපිත කිරීමට සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් යටතේ සතොස සහ සමූපකාර වෙළෙඳසැල් තුළ ලංකා ධීවර සංස්ථාවට අයත් ශීතකරණයන් ස්ථානගත කිරීමටත් බලාපොරොත්තු වන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර අමාත්‍යාංශය සමඟ එක්ව මත්ස්‍ය අලෙවිය සඳහා ජංගම අලෙවි රථ යෙදවීමටත් සැලසුම් කර තිබෙන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගරු වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා පැවසූ පරිදි, ඉතා පහසුවෙන් ක්ෂණිකව පිසගත හැකි පරිදි සකසන ලද මාලු සැකසුම් සම්බන්ධයෙන් මේ වන විටත් අවධානය යොමු කර ඇති බවත් එම ඇසුරුම් කටයුතු සිදු කිරීම සඳහා රික්තක ඇසුරුම් යන්ත්‍රයක් මේ වන විටත් තම ආයතනය සතුව ඇති බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙවර උත්සව සමය ඉලක්ක කරමින් මෙම කටයුතු දියත් කිරීම සඳහා සතොස ආයතනය සමඟ එක්ව කටයුතු කිරීමට ඉතා උනන්දුවෙන් බලාපොරොත්තු වන බව ද ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ අතර ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය තත්ත්වය ඉතා අවම මට්ටමක පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.2.2 වැව් ආශ්‍රිතව ධීවර කර්මාන්තයේ නියැළෙන්නන් සහ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැළෙන්නන් සම්බන්ධ කරගනිමින් සමූපකාර සමිති ගොඩනැගීම

ඉදිරියේ දී, වැව් ආශ්‍රිතව ධීවර කර්මාන්තයේ නියැළෙන්නන්ගේ සමූපකාර සමිති ගොඩනැගීමට බලාපොරොත්තු වන බවත් ඒ යටතේ මිරිදිය සමූපකාර මෙන්ම විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සම්බන්ධ පුද්ගලයන්ගේ සමූපකාර ගොඩනැගීමට පියවර ගන්නා බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ලංකාවේ ධීවර කර්මාන්තය තුළ වාර්ෂික මත්ස්‍ය අස්වැන්න, වාර්ෂික මත්ස්‍ය පරිභෝජනය, මත්ස්‍ය අපනයන ප්‍රමාණය සහ එම ප්‍රමාණය වැඩි කර ගැනීමට ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඉලක්කගත වැඩසටහන් පවතී ද යන්න පිළිබඳව ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

## 3.3 ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

### 3.3.1 ධීවර සමිති සතු මුදල් විධිමත්ව කළමනාකරණය කිරීම

රටෙහි මහා පරිමාණ ජලාශ 54ක් පමණ පවතින බවත් ඒවා ආශ්‍රිතව පවතින ධීවර සමිති මඟින්, ධීවරයන් විසින් අල්ලනු ලබන එක් මාලු කිලෝග්‍රෑමයක් සඳහා මුදලක් අය කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, මෙම ධීවර සමිති සතුව විශාල මුදල් ප්‍රමාණයක් පවතින අතර එම මුදල් පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් අවභාවිතා කරන බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.3.2 මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය විධිමත් කිරීම

අනුරාධපුරය වැනි ප්‍රදේශවල පවතින වාරි පද්ධති ආශ්‍රිතව මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහනය සම්බන්ධව ගැටලු පවතින බැවින් මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා මත්ස්‍ය අභිජනනාගාර (හැචරි) ව්‍යාප්ත කිරීම සඳහා වැඩපිළිවෙළක් සකසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, ගල්කුලම ප්‍රදේශයේ මෙවැනි අභිජනනාගාරයක් පිහිටා තිබුණ ද තවමත් එහි වැඩ කටයුතු ආරම්භ කර නොමැති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැව් ආශ්‍රිතව ධීවර සමිති මඟින් මාළු කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කරන මුදලින් නැවත එම වැව් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම සිදුකරන බවත් මෙම ක්‍රියාවලිය සඳහා ධීවර සමිති සතු මුදල් ආයෝජනය කර අවුරුදු දෙක තුනකට පසු එමඟින් විශාල ආදායමක් ලබන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් සිදු කළ ද මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහනයේ දී ඇතිවන ගැටලු සලකා බලා මෙම ක්‍රියාවලිය ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙන් බාහිරට ලබාදීමට සැලසුම් කර ඇති බව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඒ අනුව, පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කර සෑම වැවක් සඳහාම පොකුණු එකක් හෝ දෙකක් සාදා එම පොකුණු තුළට මාළු ඇසිත්තන් මුදා හැරීමට සැලසුම් කර ඇති බවත් එම පොකුණු කොන්ක්‍රීට් කර ඇත්නම් ඒවා සඳහා මාලු කීටයන් ලබා දී එම වැව් ආශ්‍රිතව ලාභදායී ලෙස මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කිරීමට හැකියාවක් පවතින බවත් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.4 ගරු අබූබකර් අතම්බාවා මහතා

### 3.4.1 ඔලුවිල් වරාය සංවර්ධනය කිරීම

අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළ ප්‍රදේශවල ධීවර පවුල් 15,000ක් පමණ ධීවර කටයුතුවල නිරතව සිටින අතර එහි බහු දින යාත්‍රා 450ක් සහ එක්දින යාත්‍රා 1,500ක් පමණ තිබෙන බවත් ඔවුන් රටේ මත්ස්‍ය ඉල්ලුමට උපරිම දායකත්වයක් ලබා දෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, මෙම ධීවරයින්ට ධීවර වරායක් නොමැති වීම හේතුවෙන් එතැන් සිට කිලෝමීටර් 250ක් පමණ දුරින් පිහිටා ඇති ත්‍රිකුණාමලය වරාය වෙත ගමන් කිරීමට සිදුව ඇති බැවින් මෝය කටේ වැලි පිරීම නිසා දැනට වසර 06ක් පමණ ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ ඇති ඔලුවිල් වරාය ප්‍රතිසංස්කරණය කිරීමට කඩිනමින් කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඔලුවිල් වරාය සංවර්ධනය කිරීමෙන් දකුණේ ධීවර ජනතාවට ද උතුරේ ධීවර කටයුතුවල යෙදිය හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවරයින් ධීවර කටයුතු සඳහා ත්‍රිකුණාමලය වරාය වෙත යාමේ දී ඔවුන්ගේ බෝට්ටුවලට අවශ්‍ය ඉන්ධන රැගෙන යාමට අවසර නොදීමෙන් ධීවර ජනයා අපහසුතාවයට පත්වන බැවින් ඒ සඳහා ඔවුන්ට අවසර ලබා දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඩෙන්මාර්ක් රජයේ ආධාරයෙන් නිසි සැලසුමක් ඇතිව ආරම්භ කරනු ලැබූ ඔලුවිල් ධීවර වරාය සම්බන්ධයෙන් පසුගිය රජයන් කිහිපයක්ම නොසැලකිලිමත්ව කටයුතු කිරීමත් ඔලුවිල් වරාය ඉදිකරනු ලැබූ කාල වකවානුවේ දී හම්බන්තොට වරායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමත් හේතුවෙන් ඔලුවිල් වරායේ කටයුතු අසාර්ථක වූ බව ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙමඟින් එම ප්‍රදේශයේ මුහුදු ඛාදනය වැඩි වී සාමාන්‍ය ධීවර ජනයාගේ ධීවර කටයුතු අසාර්ථක වූ බව ද ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම ඔලුවිල් වරාය ගැටලුව සම්බන්ධයෙන් රජයේ නිසි අවධානය යොමු විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඔලුවිල් වරායේ 01 සහ 04 යන ලොට් අංක ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් පවරා ගැනීමට ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය මඟින් කටයුතු කරන ලද බවත් ලොට් අංක 04හි මත්ස්‍ය පිරිසැකසුම් ඒකකයක් පවතින බවත් අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සැමන් සහ මත්ස්‍ය අපනයනය සඳහා නිෂ්පාදනාගාරයක් ලෙස භාවිතා කිරීමට මෙම පිරිසැකසුම් ඒකකය “ටෙස්”නම් පුද්ගලික ආයතනයට බදු දී තිබුණ ද මෝය කටෙහි වැලි පිරී ඔලුවිල් වරාය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ආයතනය තම නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නොමැති බැවින් එම ගිවිසුම නැවතත් සමාලෝචනය කළ යුතු

තත්ත්වයට පත්ව ඇති බව අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

මෝය කටෙහි වැලි ඉවත් කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත් මෝය කටෙහි ගේට්ටුවක් යෙදීම මඟින් එය වළක්වා ගැනීමට යෝජනා වී ඇති බවත් අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තව ද, මොරටුව විශ්වවිද්‍යාලය වැනි ආයතන මඟින් අභිලාෂ කැඳවා (EOI) මෝය කටෙහි වැලි පිරීමේ ගැටලුව සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඒ සඳහා ස්ථිර විසඳුමක් ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමතිය ලැබී ඇති බව අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ඔලුවිල් වරායේ ලොට් අංක එක, අත්පත් කරගැනීමේ නඩු කටයුත්තක් පවතින බවත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් නිසි පරිදි එය පවරාදී නොමැති බවත් අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර ගරු මන්ත්‍රීවරුන්ට ලබා දී මෙම ගැටලුව සම්බන්ධව ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ (සංවර්ධන) වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.4.2 අම්පාර ප්‍රදේශයේ නව ගුවන්විදුලි සන්නිවේදන පද්ධතියක් සවි කිරීම

අම්පාර ප්‍රදේශයේ ධීවර ජනතාව වාලච්චේන ප්‍රදේශයේ ධීවර කටයුතුවල යෙදෙන බැවින්, අම්පාර ප්‍රදේශයේ සවිකර තිබූ ගුවන්විදුලි සන්නිවේදන පද්ධතිය වාලච්චේන ප්‍රදේශයට ගෙන ගොස් සවිකර තිබීම මඟින් ධීවරයින් අපහසුතාවයට පත්ව ඇති බැවින් අම්පාර ප්‍රදේශයේ ද නව ගුවන්විදුලි සන්නිවේදන පද්ධතියක් සවිකිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට ගුවන්විදුලි සන්නිවේදන උපකරණ ලබාගෙන ඇති බවත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ධීවරයන්ට ලබා දිය හැකි බවත් ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම ගැටලුව විසඳීම සඳහා ඒ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ තමා වෙත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

### 3.4.3 අම්පාර ප්‍රදේශයේ අයිස් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම

අම්පාර ප්‍රදේශයේ ධීවර ජනතාවට අවශ්‍ය අයිස් ලබා ගැනීම සඳහා අයිස් නිෂ්පාදනාගාරයක් නොමැති බැවින් ඔවුන්ගේ අයිස් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා නිවෙස්වල අයිස් නිෂ්පාදනය කරගන්නා බවත් මෙය අසීරු කාර්යක් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, එම ප්‍රදේශයේ අයිස් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පෞද්ගලික ආයතනයක් මඟින් එම ප්‍රදේශයේ අයිස් නිෂ්පාදනාගාරයක් ඉදිකරන බව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 3.4.4 අම්පාර ප්‍රදේශය තුළ සිදුවන මාලු සොරකම් වැළැක්වීම

අම්පාර ප්‍රදේශයේ ධීවරයින්ගේ මාලු, වෙනත් දිස්ත්‍රික්කවල ධීවරයින් විසින් සොරා ගැනීමේ සිද්ධීන් බහුලව සිදුවන බැවින් ඒ සඳහා ආරක්ෂක අංශයේ ද සහයෝගය ඇතිව විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.5 වයඹ පළාතේ ජලාශවලට මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම - ගරු චන්දන තෙන්නකෝන් මහතා

වයඹ පළාත තුළ මත්ස්‍ය ඇඟිල්ලන් යොමු කිරීම සඳහා අභ්‍යන්තර නිත්‍ය ජලාශ 800ක් පමණ හඳුනාගෙන තිබුණ ද ඉන් ජලාශ 100ක්වත් මෙම ක්‍රියාවලියට දායක කරගෙන නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ජලාශ 800හි පූර්ණ ධාරිතාව සඳහා ම මෙම ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අමාත්‍යාංශය සතුව සැලසුමක් හා කාලරාමුවක් පවතී ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

## 3.6 ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

### 3.6.1 පුත්තලම දිස්ත්‍රික්කය තුළ "ලයිලා" දැල් භාවිතය

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රදේශය තුළ භාවිත කරනු ලබන "ලයිලා" දැල් වර්ගයේ නීත්‍යානුකූලභාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම, මෙම ප්‍රදේශයේ බෝට්ටු තුළ අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා "ලයිලා" දැල් සහ ඩයිනමයිට් ගෙන යන බවත් මෙම ඩයිනමයිට් භාවිතය හේතුවෙන් මත්ස්‍ය සම්පත විනාශ වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කල්පිටිය ප්‍රදේශය තුළ බෝට්ටු 125කට පමණක් "ලයිලා සුරුක්කු" දැල් භාවිතය සඳහා අධිකරණයෙන් අවසර ලබා දී ඇති බවත් මෙම ධීවර බෝට්ටු තුළ පුපුරන ද්‍රව්‍ය ගෙන යාම තහනම් කර ඇති බවත් ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවන් හේතුවෙන් විශාල හානියක් සිදුවන බැවින් මෙම දැල් භාවිතය තහනම් කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.6.2 කිමිදුම් බලපත්‍ර ලබා ගැනීමේ ගැටලුව විසඳීම

මාළු ඇල්ලීමේ කටයුතුවල නිරතවන කිමිදුම්කරුවන්ට බලපත්‍ර ලබා ගැනීමේ ගැටලුවක් මෙන්ම කිමිදුම් කටයුතු සඳහා ඔවුන්ට අවශ්‍ය ආරක්ෂක ආම්පන්න රැගෙන යාමට අවසර ලබා නොදීමේ ගැටලුවක්

පවතින බැවින් එම ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.6.3 කරවල නිෂ්පාදනය සඳහා අවශ්‍ය ලුණු ලබා දීම

කරවල නිෂ්පාදනය සඳහා අවශ්‍ය ලුණු සඳහා ඉතා ඉහළ මිලක් අය කිරීම හේතුවෙන් එම නිෂ්පාදකයින් අපහසුතාවයට පත්ව ඇති බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා සාධාරණ මිලකට ලුණු ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.7 ඉන්දීය ධීවරයන් විසින් ලාංකීය මත්ස්‍ය සම්පත විනාශ කිරීම වැළැක්වීම - ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා

උතුරු පළාතේ යාපනය, මන්නාරම, කිලිනොච්චිය සහ මුලතිව් යන ප්‍රදේශවල මුහුදු සීමාවන්ට ඉන්දිය ධීවරයින් නීති විරෝධි ලෙස ඇතුළු වී, නීති විරෝධී ධීවර ආම්පන්න වර්ග 18ක් පමණ භාවිත කරමින් ලංකාවට හිමි ධීවර සම්පත ඇල්ලීමෙන් මෙරට ධීවර ජනතාව ගැටලුවලට මුහුණපාන බැවින්, රටේ සාගර සම්පත සහ ලක්ෂ සංඛ්‍යාත ධීවර ජනයාගේ රැකියා සුරක්ෂිත කිරීම සඳහා නාවික හමුදාවේ සහ අදාළ අනෙකුත් ආයතනයන්හි සහයෝගය ඇතිව මෙම ගැටලු විසඳීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, කලපුවල වැරදි ලෙස ධීවර කටයුතුවල යෙදීමෙන් මෙරටට ආවේණික මසුන් විනාශ වීමේ අවධානමක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් ද අවධානය යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

## 3.8 මඩකලපුව දිස්ත්‍රික්කයේ ධීවර කටයුතු නඟා සිටුවීම - ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

නැගෙනහිර පළාතට අයත් මඩකලපුව දිස්ත්‍රික්කයේ කලුවන්කේනි, කල්ලඩි, නාවලඩි සහ එරාවූර් යන මුහුදු ප්‍රදේශ රටේ ධීවර කටයුතුවල සාර්ථකව යෙදීමට හැකි ප්‍රදේශ වන නමුත් එම ප්‍රදේශ තුළ ධීවර වරායන්, ප්‍රදීපාගාර, ධීවර බෝට්ටු බැඳ තැබීමේ පහසුකම් මෙන්ම ධීවර කටයුතු සඳහා අවශ්‍ය අයිස් නිෂ්පාදනාගාරයන් නොමැති බවත් මෙම ප්‍රදේශවලින් අල්ලන මසුන් සඳහා වෙළෙඳපොළ පහසුකම් සහ මසුන් කල්තබා ගැනීමේ පහසුකම් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, එම ප්‍රදේශයේ පිහිටි ධීවර සංස්ථා කාර්යාලය වසා දැමීම හේතුවෙන් ධීවරයන් අපහසුතාවයට පත්ව ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉහත සඳහන් අවශ්‍යතා සපුරාදීම තුළින් මෙම ප්‍රදේශයේ ධීවර ජනයාගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට සහාය වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය සමයේ රජය විසින් ලබා දෙන ලද ධීවර ආම්පන්න ධීවරයින් නොවන පුද්ගලයින්ට ද ලබාදී ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.9 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

### 3.9.1 මඩකලපුව සාගර විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම

මඩකලපුව නාවලඩි ප්‍රදේශයේ පිහිටා තිබෙන සාගර විශ්වවිද්‍යාලයේ සම්පත්වල හිඟතාවයක් පවතින බවත් එම විශ්වවිද්‍යාලයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් ද ගැටලු පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මෙකී ගැටලු සඳහා විසඳුම් ලබා දී මෙම විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.9.2 මඩකලපුව ප්‍රදේශයේ අයිස් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම

මඩකලපුව ධීවර සංස්ථාවට අයත් ඉඩමෙහි ඉදිකරන ලද ගොඩනැගිලි මේ වන විට අත්හැර දැමීමෙන් භාවිතයට නුසුදුසු තත්ත්වයට පත්ව ඇති බැවින් මෙම ස්ථානය නැවත භාවිතයට සුදුසු තත්ත්වයට පත්කර එම ස්ථානයේ තිබූ අයිස් නිෂ්පාදනාගාරය නවීකරණය කිරීමේ වැඩ කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මඩකලපුව කල්ලඩි අයිස් යන්ත්‍රාගාරය සම්බන්ධයෙන් අභිලාෂ කැඳවා (EOI), මහා භාණ්ඩාගාරය සමඟින් සාකච්ඡා කර මෙහි වැඩ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව සී/ස සීනෝර් පදනමේ සහ නොර්ත් සී ලිමිටඩ් ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක තුළ ව්‍යාපෘති සිදුකිරීම එම දිස්ත්‍රික්කයෙහි ගරු මන්ත්‍රීවරුන් ඒ සඳහා සම්බන්ධ කරගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සී/ස සීනෝර් පදනමේ සහ නොර්ත් සී ලිමිටඩ් ආයතනයේ සභාපති වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.9.3 මඩකලපුව ප්‍රදේශයේ ධීවර වරායන් ගොඩනැගීම

මඩකලපුව කලුවන්කේනි ප්‍රදේශයේ සී/ස සීනෝර් පදනම මඟින් සිදුකරනු ලබන ව්‍යාපෘතියට සමගාමීව එම ප්‍රදේශයේ ධීවර වරායක් ඉදිකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මඩකලපුව ඇතුළු උතුරු සහ නැගෙනහිර පළාත්වල ධීවර ගැටලු විසඳීමට මේ වන විටත් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත් ධීවර වරායන් සෑදීම සඳහා මුදල් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශවලට අවශ්‍ය ධීවර වරාය, ප්‍රදීපාගාර ඇතුළු අනෙකුත් පහසුකම් ලබා ගැනීම සඳහා මන්ත්‍රීවරුන් සතු යෝජනා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය වෙත ලිඛිතව ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.10 ගරු අජිත් ගිහාන් මහතා

### 3.10.1 රට තුළ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම

තහනම් දැල් වර්ග භාවිතය, අවිධිමත් ලෙස ධීවර කටයුතු සිදුකිරීම නිසා රට තුළ පරිභෝජනය සඳහා අවශ්‍ය මත්ස්‍ය සම්පත පසුගිය වසර කිහිපය තුළදී සැලකිය යුතු ලෙස අඩුවී ඇති බැවින්, රට තුළ මිරිදිය මත්ස්‍ය සම්පත වැඩිකර ගැනීම සඳහා අභ්‍යන්තර ජලාශවල පවතින අනවශ්‍ය ජලජ ශාක ඉවත්කර එම ජලාශ පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.10.2 හලාවත ධීවර වරාය ආශ්‍රිත ගැටලු විසඳීම

හලාවත ධීවර වරාය තුළ පවත්වාගෙන යනු ලබන අලෙවිසැල් හිමිකරුවන් විසින් එම ධීවර වරාය තුළ සිටින ධීවරයන් විසින් අල්ලනු ලබන මාලුවලින් පරිබාහිරව රටේ වෙනත් ප්‍රදේශවලින් මාලු ගෙනැවිත් අලෙවි කිරීම හේතුවෙන් මෙම ධීවර වරාය තුළ ධීවර කටයුතුවල නිරතවන ධීවරයින් දැඩි අපහසුතාවයට පත්ව ඇති බැවින් ඒ පිළිබඳව සොයා බලා මෙම ධීවරයන්ගේ මාලු අලෙවිය සඳහා නිසි අවස්ථාව සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.10.3 නොර්ත් සී ලිමිටඩ් ආයතනය මඟින් ලබා දුන් මාලු දැල් ගුණාත්මක බවින් අඩුවීම

ඉරණවිල, තොඩුවාව ප්‍රදේශයේ ධීවරයන් විසින් වෙන්නප්පුව නොර්ත් සී ලිමිටඩ් ආයතනයෙන් ලබා ගත් මාලු දැල් මුහුදට දැමූ පසු ඉරීයාම හේතුවෙන් එම දැල් 80ක් පමණ නැවත එම ආයතනය වෙත භාර දුන් නමුදු තවම ඒවා පිළිසකර කර එම ධීවරයන් වෙත ලබාදී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.11 යාපනයේ උතුරු වෙරළ තීරය තුළ ආරක්ෂිතව බෝට්ටු නවතා තැබීම සඳහා පහසුකම් සැලසීම - ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

යාපනයේ උතුරු වෙරළ තීරය ආසන්නයේ ස්ථාන 10ක පමණ බෝට්ටු ආරක්ෂිතව නවතා තැබීම සඳහා සාදා ඇති බැම් ශක්තිමත් නොවීම හේතුවෙන් එම බෝට්ටු නවතා තැබීමේ දී ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු පැන නැගී ඇති බැවින්, මෙම බැම් වඩා ශක්තිමත් ලෙස උසින් හා පළලින් වැඩි වන අයුරින්, කළුගල්වලින් නිමකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් දැනටමත් අවධානය යොමු කර ඇති බැවින් කළුගල් යොදා මෙම බැම් සකස් කිරීම කඩිනම් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 3.12 ගරු කන්දසාමි ප්‍රභු මහතා

### 3.12.1 වාලච්චේන ධීවර වරාය සංවර්ධනය කිරීම සහ එම ප්‍රදේශයේ ධීවර කටයුතු නඟා සිටුවීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේන ධීවර වරායේ බෝට්ටු බැඳ තැබීමට ප්‍රමාණවත් ඉඩක් නොමැති බවත් මඩකලපුව දිස්ත්‍රික්කයේ

ධීවරයින් මෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ ධීවරයන් ද පැමිණ මෙහි බෝට්ටු නවතා තැබීම නිසා ගැටලු මතුවී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අරය මීටර 275ක් වන මෙම වරායෙහි බෝට්ටු 100ක් පමණ නවතා තැබිය හැකි බවත් එහි අරය මීටර 300ක් දක්වා දීර්ඝ කළහොත් මෙහි නවතා තැබිය හැකි බෝට්ටු ප්‍රමාණය වැඩිකර ගත හැකි වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමඟින් මාසිකව ලක්ෂ 12 - ලක්ෂ 20ක් දක්වා වූ මාසික ආදායමක් උපයා ගත හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම වරාය ආසන්නයේ කඳු සහ ගල් පර්වත පිහිටා ඇති බැවින් වරායට බෝට්ටු ගෙන ඒමේ දී එම බෝට්ටුවලට හානි වන බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙලෙස හානි වූ බෝට්ටු පිළිසකර කිරීම සඳහා ස්ථානයක් එහි ස්ථාපිත කර දෙන ලෙසත් රාත්‍රී කාලයේ බෝට්ටු ප්‍රවේශමෙන් ගෙන ඒම සඳහා විදුලි ආලෝකය සැපයීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, වරාය තුළ පවතින පැරණි ගුවන්විදුලි සන්නිවේදන පද්ධතිය වෙනුවට නව ගුවන්විදුලි සන්නිවේදන පද්ධතියක් ලබා දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, වාලච්චේන ප්‍රදේශයේ පෞද්ගලික ආයතන මඟින් අයිස් නිෂ්පාදනාගාර 07ක් පවත්වාගෙන යනු ලබන අතර වෙළෙඳපොළ තුළ ඒකාධිකාරයක් පවත්වාගෙන යෑමට ඔවුන් කටයුතු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලා වෙළෙඳපොළ තුළ අයිස් සඳහා සාධාරණ මිලක් නියම කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.2 මඩකලපු කලපුව තුළ තැන්පත් වී ඇති වැලි ඉවත් කිරීම

මඩකලපු කලපුව තුළ සුනාමියෙන් පසුව අධික ලෙස වැලි පිරීමෙන් එහි ධීවර කටයුතුවල නිරතවන ජනතාව අපහසුතාවයට පත්ව ඇති බැවින්, එහි එකතු වී ඇති වැලි ඉවත්කර එහි නව ධීවර වරායක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, රටේ නැගෙනහිර මුහුදු සීමාවෙහි පවතින වැලි ගසාගෙන ගොස් වෙනත් ස්ථානවල තැන්පත් වීම නිසා ඇතිවන අවදානම සම්බන්ධයෙන්, ධීවර වරායන් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.13 ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම - ගරු රොෂාන් අක්මීමන මහතා

ධීවර කර්මාන්තය සඳහා වර්තමානයේ ද පැරණි ක්‍රමවේද භාවිතා වන බැවින්, ඉදිරියේ දී මේ සඳහා නව තාක්ෂණය යොදා ගැනීම උදෙසා යම් වැඩපිළිවෙළක් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය සතුව පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙහිදී නව තාක්ෂණය භාවිතය තුළින් සාගරය තුළ මාළු රැඳී සිටින ස්ථාන ගවේෂණයට මෙන්ම ධීවර කටයුතු සඳහා වැයවන පිරිවැය අවම කිරීමටත් හැකියාවක් ලැබෙනු ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් අනතුරට පත්වන ධීවරයන් සහ ධීවර බෝට්ටු සඳහා නාවික හමුදාවේ සහාය ද ඇතිව, ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය හැකි ක්‍රමවේදයක් සැකසීමට නව තාක්ෂණය යොදා ගත හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**3.14 ධීවර කර්මාන්තය දියුණු කිරීම මඟින් සංචාරක කර්මාන්තය ප්‍රචලිත කිරීම - ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා**

සංචාරක කර්මාන්තයේ වැඩි වශයෙන් නිරතවන මිරිස්ස ආදී ප්‍රදේශවල ධීවර කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම තුළින් සංචාරක කර්මාන්තය ද නඟා සිටුවීමට දායක විය හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ධීවර කර්මාන්තය තුළ තහනම් දැල් වර්ග භාවිතය වැනි අකටයුතුකම් සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කිරීම තුළින් සාගර සම්පත ආරක්ෂා කර ගැනීමට හැකිවනු ඇති බවත් එමඟින් එකී ප්‍රදේශවලට සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීමට හැකිවනු ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම බහුතරයක් ගැටලු සම්බන්ධයෙන් දැනටමත් සාකච්ඡා කර ඇති බවත් මෙකී සියලු කරුණු අධ්‍යයනය කොට ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කටයුතු කිරීමට ඉදිරියේ දී බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 12.50ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 18**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා (සභාපති)
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු අශෝක ගුණසේන මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා
ගරු නීතීඥ හසාරා ලියනගේ මහත්මිය
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු බී. ආරියවංශ මහතා
ගරු තුරෛරාසා රවිකරන් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1 2022 වර්ෂය සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව**
(2025.01.09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්යභාරය හා ප්‍රගතිය පිළිබඳව සාරාංශයක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාර්මික තාක්ෂණ ආයතනය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් වෙත දැනුම් දෙන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය යනු 1955 පිහිටවූ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ (CISIR) අනුප්‍රාප්තික ආයතනයක් බව කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රටට අවශ්‍ය නවෝත්පාදන බිහිකිරීම මෙම ආයතනයේ මූලික අරමුණ වන බැවින් ඒ සඳහා වෙනම විද්‍යාගාර පද්ධතියක් ස්ථාපිත කර විවිධ පර්යේෂණ සිදුකරමින් ආහාර තාක්ෂණය (Food Technology), ශාකසාර තාක්ෂණය (Herbal Technology) ද්‍රව්‍ය තාක්ෂණය (Material Technology), ජෛව තාක්ෂණය (Biotechnology) සහ පරිසර තාක්ෂණය (Environmental Technology) යන අංශවලට අදාළ දැනුම කර්මාන්තකරුවන්ට සපයා දීමට කටයුතු කරන බව කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ආයතනයේ විශේෂිතම සේවාවක් ලෙස විශ්ලේෂණ සේවා සපයන අංශය සඳහන් කළ හැකි බවත් එම අංශයට අයත් ISO 17025 ප්‍රතීතන සහතිකලත් විද්‍යාගාර මඟින් මෙම වසර තුළ විවිධ කර්මාන්තකරුවන් සඳහා සේවා වාර්තා 17,000ක් පමණ සපයා ඇති බවත් කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම, කාර්මික තාක්ෂණ ආයතනය මඟින් සොයාගන්නා ලද නව තාක්ෂණ හුවමාරු 60ක් පමණ (උදා:-කිතුල් මේද තැවරුම, ශක්තිජනක පානය, 99% පිරිසිදු කළ මිනිරන්) ජනගත කළ බවත් සමෘද්ධි ආයතනය හා විදාතා සම්පත් මධ්‍යස්ථාන හරහා ගමට තාක්ෂණය ගෙන යාමේ වැඩසටහන් ද මෙම වර්ෂය තුළ දියත් කළ බවත් කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්න සඳහා තම ආයතනය මඟින් අවශ්‍ය තාක්ෂණික පිළියම් ලබාදීම සිදුකරන බවත් පසුගිය වර්ෂවල දී පැනනැඟුණු ඇෆ්ලටොක්සින් ගැටලුව හා පොහොරවල අඩංගු බැරලෝහ ප්‍රමාණ වැඩිවීම් පිළිබඳව ද අවශ්‍ය විශ්ලේෂණ සිදුකළ බවත් කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 2. වෙනත් කරුණු

### 2.1 විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හා එයට අනුබද්ධිත සියලු ආයතන ජාතික සැලැස්මක් තුළ ක්‍රියාත්මක කිරීම - ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

මෙම අමාත්‍යාංශයට අයත් ආයතන සියල්ලම ජාතික සැලැස්මක් තුළ ක්‍රියාත්මක වන්නේ ද සහ එසේ සිදුවන්නේ කුමන සැලැස්මක් යටතේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පවතින රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්තියක් නිෂ්පාදන ආර්ථිකයට ගැලපීමට කටයුතු කරන බවත් ඊට අදාළ නීතිමය කටයුතු සම්පාදනය කිරීම සඳහා පනතක් ගෙන ඒමට ක්‍රියාකරන බවත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහය අපේක්ෂා කරන පරිදි ලබාගැනීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට හැකි වුවහොත් මෙයට අදාළ සියලු කටයුතු මාස 04කින් පමණ අවසන් කළ හැකි බව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගමට තාක්ෂණය ගෙන යාම පිළිබඳ යම් ජාතික සැලැස්මක් පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ආර්ථිකය, සමාජ සංවර්ධනය හා පරිසරය පිළිබඳ අධ්‍යයනය මූලික කරගනිමින් විද්‍යා හා තාක්ෂණික කටයුතු පිළිබඳ දැනුම ග්‍රාමීය ප්‍රදේශවලට ලබාදීමට විදාතා සම්පත් මධ්‍යස්ථාන හරහා කටයුතු කරන බවත් ජාත්‍යන්තර අවශ්‍යතාවන් හඳුනාගනිමින් නිසි ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදන කටයුතු සිදු කිරීමට කර්මාන්තකරුවන්ට උපදෙස් ලබාදීමේ වැඩසටහන් 76ක් පමණ සිදු කළ බවත් අතිරේක ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෙළෙඳපොළ ඉලක්කවලට අනුකූලව ග්‍රාමීය ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය විදාතා මධ්‍යස්ථානවල නිලධාරීන් අමාත්‍යාංශය හා එක්ව ක්‍රියාත්මක වන බව ද අතිරේක ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**2.2 සියලුම කොට්ඨාස ආවරණය වන පරිදි විදාතා නිලධාරීන් නොසිටීම නිසා ඇතිවන ගැටලු - ගරු කෝසල නුවන් ජයවීර මහතා**

සියලුම කොට්ඨාස ආවරණය වන පරිදි විදාතා නිලධාරීන් සේවයේ නිරත වන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

විදාතා සම්පත් මධ්‍යස්ථාන 128ක් ආවරණය වන පරිදි විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සේවයේ යෙදී සිටියත් විදාතා සම්පත් මධ්‍යස්ථාන 14ක කිසිදු නිලධාරියෙකු නොමැති බවත් සංවර්ධන නිලධාරීන් මඟින් අදාළ සියලු වැඩ ආවරණය කර ගන්නා බවත් අතිරේක ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සංවර්ධන නිලධාරීන් හරහා විදාතා සේවාවන්ට අදාළ සම්බන්ධීකරණ කටයුතු ඉටුකර ගැනීම ගැටලුසහගත බවත් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තුළ විදාතා නිලධාරීන් මඟින් නිෂ්පාදන ආර්ථිකයට අදාළ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම තුළින් කර්මාන්තකරුවන්ට අදාළ දැනුම නිවැරදිව බෙදාහැරීමට හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විදාතා නිලධාරීන්ගේ සේවය පසුගිය කාලයේ යම් පසුබෑමකට ලක්ව ඇති නමුත් මේ සේවාව නඟාසිටුවීම අත්‍යවශ්‍ය බැවින් සෑම විදාතා නිලධාරියෙකුම කාර්යසාධනය මත පදනම් වූ ඇගයීමකට ලක් කිරීමට හා ඔවුන් ලබාදෙන තොරතුරු නිවැරදිව ලබාගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් මාසයක් ඇතුළත සකස් කරන ලෙස අමාත්‍යාංශයට උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ගම් මට්ටමේ නව නිපැයුම් දියුණු කිරීමටත් ගමට තාක්ෂණය ලබාදීමට වැඩසටහන් දියත් කිරීමටත් උපදෙස් ලබා දී ඇති බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.3 නිෂ්පාදන ඉහළ නංවාලීම සඳහා මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ව්‍යවසායකයන්ට නිසි මඟපෙන්වීමක් ලබාදීමේ අවශ්‍යතාව - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

මඩකලපුව දිස්ත්‍රික්කයේ විද්‍යා හා තාක්ෂණ දැනුම ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් මේ වන විට දියත් කරමින් පවතින විශේෂ වැඩසටහන් පිළිබඳව ගරු මන්ත්‍රීමා විසින් විමසීමක් කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින විදාතා නිලධාරීන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බවත් ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ කරගනිමින් අදාළ තොරතුරු ලබාගන්නා ලෙසට මඩකලපුව දිස්ත්‍රික් විදාතා නිලධාරී වෙත උපදෙස් ලබා දෙන බවත් අතිරේක ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ග්‍රාමීය මට්ටමින් කෘෂිකාර්මික අංශයේ හා ධීවර අංශයේ සම්පත් රැසක් පවතින නමුත් ව්‍යවසායකයන්ට නිවැරදි මඟපෙන්වාදීමක් නොලැබෙන බැවින් අනාගතයේ ඒ සම්බන්ධව යම්කිසි වැඩසටහනක් පැවැත්වීමට බලාපොරොත්තු වන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් තෝරාගැනීම සහ ඒවා දියුණු කිරීම පිළිබඳව ජාතික විද්‍යා පදනම මඟින් විදාතා නිලධාරීන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වූ

බවත් ඔවුන්ගේ යෝජනා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට භාරදීමෙන් අනතුරුව එම යෝජනා ඉදිරියේ දී වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 උතුරු පළාතේ තල් ආශ්‍රිත නිෂ්පාදන, ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන හා මිදි වගාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණික දැනුම ලබාදීමේ වැදගත්කම - ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**

ග්‍රාමීය මට්ටමේ තරුණ ප්‍රජාව විසින් නව නිපයුම් විශාල ප්‍රමාණයක් සිදුකර ඇතත් ඒ සඳහා නිසි පිළිගැනීමක් නොමැති බැවින් එම නව නිපයුම් ඉදිරියට ගෙන යාමට හැකියාවක් නොලැබෙන බවත් උතුරු පළාතේ පවතින තාක්ෂණික සොයාගැනීම්වලට නිසි අවධානයක් දැක්විය යුතු බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තල් ආශ්‍රිත නිෂ්පාදන 800ක් පමණ තිබෙන බැවින් එම නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා සුදුසු විද්‍යාත්මක ක්‍රම පිළිබඳව නිසි මඟපෙන්වීමක් ලබාදුනහොත් ජාතික ආර්ථිකය ගොඩනැංවීම උදෙසා ආදායම් උත්පාදනය කළ හැකි කර්මාන්තයක් ලෙස වැඩිදියුණු කිරීමට හැකි බව ද ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, මේ වන විට ඒ සඳහා පවතින දැනුවත් කිරීමේ වැඩසටහන් හෝ නව සොයාගැනීම් පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ධීවර සම්පත් පිළිබඳව සිදුකරන කටයුතුවල දී ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය වැනි ආයතන සමඟ තොරතුරු හුවමාරු කරගන්නා ආකාරය පිළිබඳව සහ මිදි වගාව දියුණු කිරීමට ගෙන ඇති පියවර පිළිබඳව ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය වැනි ආයතන සමඟ කටයුතු කිරීමට රේඛීය අමාත්‍යාංශය කැමැත්තෙන් පසුවන බවත් එයට අමතරව රේඛීය අමාත්‍යාංශයෙන් බැහැර ආයතන සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීමට නිසි සම්බන්ධතා ජාලයක් නිර්මාණය කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය වර්ෂයේ තල් පර්යේෂණ ආයතනය (Palmyra Research Institute) සමඟ සම්බන්ධ වී තාක්ෂණික හුවමාරු සිදුකළ බවත් (උදා:- නව නිපයුමක් වශයෙන් තල් ආශ්‍රිත සබන් නිෂ්පාදන හඳුන්වාදීම) එමඟින් ව්‍යවසායකයන් 200කට අධික සංඛ්‍යාවක් සඳහා තාක්ෂණික දැනුම ලබාදුන් බවත් අතිරේක ලේකම් (පාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උතුරු පළාත තුළ තල් ගස් මිලියන 15ක් තිබෙන බවත් එක තල් ගසකින් රු.3,000/= ක ලාභයක් ලැබෙන බව එම කර්මාන්තයෙහි නිරතවූවන් විසින් පවසන බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය මඟින් තල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව පසුගිය වර්ෂවල දී තල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා තාක්ෂණ ක්‍රම හඳුන්වා දුන් බවත් එම ආයතනය සමඟ ඇතිකරගත් සහයෝගිතා ගිවිසුම නැවත අලුත් කර ගැනීම සඳහා ද මේ වන විට කටයුතු කරන බවත් කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය විදාතා සම්පත් මධ්‍යස්ථාන හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ එක්ව ආහාර තාක්ෂණය හා සම්බන්ධ නවීන ක්‍රම යොදා ගැනීමට උත්සහ කරන බවත් යුද සමයෙන් පසු එම කර්මාන්තයේ නිමවුම් ප්‍රමිති සහතිකලත් නිෂ්පාදන බවට පත්කිරීමට විශාල මෙහෙවරක් සිදුකළ බවත් කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ධීවර කර්මාන්තය නඟා සිටුවීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම, බැහැර කරන මත්ස්‍ය කොටස්වලින් නව නිෂ්පාදන හඳුන්වා දීම, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය වැනි ආයතන සම්බන්ධ කරගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම, මිදි වගා කිරීමේ දී සුදුසු පොහොර වර්ග පිළිබඳ පර්යේෂණ සිදුකිරීම, පොහොරවල බැර ලෝහ ප්‍රශ්නය පිළිබඳ කර්මාන්තකරුවන්ට දැනුම බෙදාදීම වැනි කාර්යයන් සිදුකර ඇති බව කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (Sri Lanka Institute of Nano Technology (Pvt) Ltd. - SLINTEC) පිළිබඳව ජනතාවගේ ඇති නොදැනුවත්කම නිසා තම ආයතනයෙන් ලබා ගත හැකි බොහෝ සේවාවන් ඔවුන්ට ලබා ගැනීමට නොහැකි වී ඇති බවත් පසුගිය වර්ෂයේ දී නිෂ්පාදන වාණිජකරණය කිරීම යටතේ පේටන්ට් බලපත්‍ර 7ක් ලබාගෙන රු. මිලියන 350ක ආදායමක් ලබා තිබෙන බවත් ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෑතක දී බතික් කර්මාන්තය සඳහා කුරුඳුවලින් ස්වාභාවික වර්ණකයක් හඳුන්වා දුන් අතර තැඹිලි කෝම්බවලින් ස්වාභාවික වර්ණක නිපදවා රු. මිලියන 100 - 120 අතර ලාභයක් ලබාගත් බවත් පාම් ගසේ පොතු යොදාගෙන ස්වාභාවික වර්ණක නිපදවා රු. මිලියන 45ක ලාභයක් ලබා ගත් බවත් ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම, බැහැර කරන මත්ස්‍ය කොටස්වලින් තෙල් නිපදවීම ලංකාව තුළ සිදු නොවුණත් එය බෙහෙවින් ලාභ ලැබිය හැකි නිෂ්පාදනයක් වන හෙයින් එම නිෂ්පාදනය සිදු කරන්නේ නම් ඊට අවශ්‍ය නැනෝ තාක්ෂණය ලබා දී එහි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමට තම ආයතනයට හැකියාව ඇති බව ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිෂ්පාදන විශාල ප්‍රමාණයක් බිහිකිරීම වෙනුවට ගුණාත්මක තත්ත්වයේ නිෂ්පාදන කිහිපයක් හඳුන්වාදීමට කටයුතු කළ යුතු බවත් ගමට තාක්ෂණය ගෙන යාමේ වැඩපිළිවෙළ සඳහා තම ආයතනය ද සම්බන්ධ කරගන්නේ නම් ඒ සඳහා ආයතනයේ දායකත්වය දැක්විය හැකි බවත් ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මුතු බෙල්ලන් හා මාලු අස්වැන්න වැඩි ප්‍රදේශ චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ හඳුනාගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය සමඟ සම්බන්ධ වීමට උත්සාහ කළ නමුත් එම කටයුතු

ඉදිරියට කරගෙන යෑමට නොහැකි වූ බැවින් නිවැරදි ලෙස ආයතන අතර සම්බන්ධතාවක් ඇති කර දෙන ලෙස නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ සභාපති විසින් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන හා සම්බන්ධ සන්නිවේදන දුර්වලතා හේතුවෙන් බිම් මට්ටමේ ඇති ගැටලු ඉහළට ගෙන ඒමට අපහසුතා පවතින බවත් එම ගැටලු එක් ස්ථානයකට ගෙන ඒම මඟින් සුදුසු ආයතනවලට යොමු කළ හැකි බවත් ජාතික විද්‍යා පදනමේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය මඟින් වාණිජ මට්ටමින් තල් පිනාටු (කොට්ටකිලංගු) සාදන යන්ත්‍ර නිපදවීම, බහුදින ධීවර යාත්‍රා සඳහා අයිස් ප්‍රමාණය අඩුවෙන් ගෙන යා හැකි යන්ත්‍ර නිපදවීම වැනි කටයුතු සිදුකර ඇති බව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තල්වලින් බියර් හා වයින් සෑදීමට පේටන්ට් බලපත්‍රයක් හිමි නව නිපැයුම්කරුවෙක් සමඟ තම ආයතනය මේ අවස්ථාවේදී කටයුතු කරන බවත් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ පර්යේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ද දායකත්වය සැපයිය හැකි බවත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට සෑම ක්ෂේත්‍රයක් සමඟම නිසි සම්බන්ධතාවක් පවත්වාගෙන යන බව හා එක් එක් ක්ෂේත්‍ර වෙන වෙනම ගෙන්වා ඊට අදාළ ගැටලු පිළිබඳ ඉදිරියේ දී සාකච්ඡා කරන බවත් අනෙකුත් අමාත්‍යාංශවල පර්යේෂණ ආයතන ද සම්බන්ධ කරමින් අදාළ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 පර්යේෂණ පිළිබඳ නිසි තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය සහ ගොවි ජනතාව මුහුණ දෙන වගා හානි - ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**

පේටන්ට් බලපත්‍ර නිකුත් කරන ලද ප්‍රමාණය, ඒවායින් වාණිජමය වටිනාකම් ලබාගත් ප්‍රමාණය හා සම්බන්ධ වාර්තා හා දත්ත පද්ධතියක් පැවතිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, මූල්‍ය හවුල්කරුවන් සොයාගත නොහැකි වූ පර්යේෂණ සඳහා රජය විසින් ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

රිලවුන් හා මොණරුන් විසින් සිදුකරනු ලබන වගා හානි හේතුවෙන් ගොවි ජනතාව බොහෝ ගැටලුවලට මුහුණ පා ඇති බවත් ඒ සඳහා ඔවුන් විසින් කෙටිකාලීන විසඳුම් අපේක්ෂා කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට රිලවුන්ගෙන් සිදුවන වගා හානි සඳහා විසඳුම් 02ක් යෝජනා කර ඇති බවත් පාසල් සිසුවෙකු විසින් ඉදිරිපත් කළ නව නිපයුම සාර්ථක නියමු ව්‍යාපෘතියක් ලෙස අනෙක් ප්‍රදේශ සඳහා ද ව්‍යාප්ත කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලු සඳහා තම ආයතනය සතුව කෙටිකාලීන විසඳුම් පවතින බවත් එය ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය හා සම්බන්ධ වෙමින් ඉදිරියේ දී එළිදැක්වීමට බලාපොරොත්තු වන අතර මේ සඳහා ජාතික කාර්යසාධක බලකායක් නිර්මාණය කිරීම සුදුසු බවත් ජාතික විද්‍යා පදනමේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිමවුම් ක්‍රියාවලියේ අවසන් අදියරේ පවතින විශිෂ්ඨ මට්ටමේ නව නිපැයුම් සඳහා අවශ්‍ය උපකාර ලබාදීම, ඒ සඳහා අවශ්‍ය ව්‍යාපාරිකයන් සොයාගැනීමට ආධාර දීම යන කටයුතු මෙම ආයතනය මඟින් සිදුකරන බවත් මේ සියලු කටයුතු සඳහා ආයතන නිසි ලෙස සම්බන්ධීකරණය කළ යුතු බවත් ජාතික විද්‍යා පදනමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

සමාජ සේවා, සෞඛ්‍ය, පරිසර හා ආරක්ෂණ යන ක්ෂේත්‍රවල නව්‍යකරණයන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම, පවතින නවෝත්පාදන වාණිජකරණය කිරිම හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා පෞද්ගලික ආයතන මඟින් සිදුකරන පර්යේෂණවල වාණිජකරණයට ද ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය විසින් සහයෝගය ලබාදෙන බව ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ අතිරේක ප්‍රධාන නව්‍යකරණ නිලධාරි විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උසස් මට්ටමේ ඇති පර්යේෂණ ව්‍යාපෘති වෙබ් අඩවි ඔස්සේ ප්‍රචාරය කිරීමට මෙන්ම සමාජගත නොවූ නිෂ්පාදන සඳහා පවා විවිධ අන්දමේ ප්‍රචාරක උපක්‍රම මඟින් උපකාර කරන බව ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ අතිරේක ප්‍රධාන නව්‍යකරණ නිලධාරි විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පර්යේෂණ අවශ්‍යතාවන් හඳුනා නොගැනීම, එකම පර්යේෂණය ස්ථාන කිහිපයක සිදු කිරීම සහ පර්යේෂණ වාණිජකරණය කිරීමට අවධානය යොමු නොවීම වැනි ගැටලු මේ වන විට පවතින බවත් එම ගැටලු අවම කිරීමට කටයුතු කරමින් පවතින බවත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පර්යේෂණ සඳහා අදාළ ප්‍රතිපත්ති සහ අවශ්‍යතාවයන්ට අනුකූලව පර්යේෂණ වැඩි දියුණු කිරීම සඳහා ජාතික පර්යේෂණ හා සංවර්ධන ආයතනය (National Institute of Research and Development – NIRD) යනුවෙන් නව ආයතනයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් සිටින බවත් එමඟින් සියලුම ආයතන මනා ලෙස සම්බන්ධීකරණය වන බවත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 2.6 මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට කොරල්පර රැකගැනීමේ ඇති වැදගත්කම - ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ශ්‍රී ලංකාව වටා ඇති කොරල්පර මත මේ වන විට පොලිතින්, ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය තැන්පත් වී තිබීමෙන් කොරල්පර වර්ධනය නොවීමෙන් මත්ස්‍ය කර්මාන්තයට බලපෑමක් ඇති වන බැවින් ඒ පිළිබඳ යම් පරීක්ෂා කිරීමක් කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.7 විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්යභාරය පිළිබඳ දැනුවත්වීම සඳහා තොරතුරු ලබාගැනීමේ සහ නිසි ක්‍රමවේදයක් යටතේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන බෙදා හැරීමේ වැදගත්කම - ගරු අර්කම් ඉල්යාස් මහතා

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අයත් ආයතනවල කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම අත්‍යවශ්‍ය බැවින් එම ආයතනවල තොරතුරු ලබාගැනීම සඳහා සම්බන්ධ කරගත හැකි නිලධාරීන්ගේ දුරකතන අංක සහිත තොරතුරු ඇතුළත් වාර්තාවක් ගරු මන්ත්‍රීවරුන්ට ලබාගැනීමට හැකියාවක් පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කර මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වසර තුළ විද්‍යා හා තාක්ෂණ කටයුතු සඳහා පෙර වර්ෂවලට සාපේක්ෂව තුන් ගුණයක මුදල් ප්‍රතිපාදන වෙන්කරන ලද බවත් එම ප්‍රතිපාදන නිසි ආකාරයෙන් පුද්ගලයන් අතරේ බෙදී යන්නේ දැයි විමසා බැලීම වැදගත් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එලෙස මුදල් බෙදී යාම නිසි ක්‍රමවේදයට සිදු නොවන්නේ නම් ඒ පිළිබඳව පරීක්ෂා කර සුදුසු පියවර ගන්නා බව සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මහජන නියෝජිතයන්ගේ පර්යේෂණ නිලධාරීන් ද මෙම ක්‍රියාවලිය සඳහා සහභාගී කරගන්නේ නම් අදාළ පර්යේෂණ ක්‍රියාවලිය ඵලදායී ලෙස ඉටුකර ගැනීමට හැකි බව ගරු අශෝක ගුණසේන මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පර්යේෂණ සඳහා සහාය ලබාදීම සහ මූල්‍ය ආධාර සැපයීම අරමුණු කරගත් ජාතික පර්යේෂණ සභාව මඟින් වාණිජකරණය පිළිබඳව පර්යේෂකයන්ට දැනුම ලබාදෙන බැවින් පර්යේෂකයන්ට ලාභදායී ප්‍රතිඵල අත්කරගත හැකි බවත් පර්යේෂකයාට උපකාර කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීමට හා පුහුණුව ලබාදීමට ද මෙම ආයතනය කටයුතු කරන බවත් ජාතික පර්යේෂණ සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික විද්‍යා පදනම සහ ජාතික පර්යේෂණ සභාව ඉටුකරන කර්තව්‍යයන් අතර යම් සමානකම් පවතින බව ද ජාතික පර්යේෂණ සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ජාතික විද්‍යා පදනම, පර්යේෂණ සඳහා මූල්‍යමය ආධාර ලබා දෙන ආයතනයක් පමණක් නොව පර්යේෂණ, සංවර්ධන නව නිපැයුම් යන සියලු අංශ ශක්තිමත් කිරීමට කටයුතු කරන ආයතනයක් බවත් පර්යේෂණ කළමනාකරණය, පර්යේෂණ සඳහා සහාය දැක්වීම මෙන්ම පාසල් ළමුන් හා බාහිර පුද්ගලයන් අතර විද්‍යා පර්යේෂණ ප්‍රචලිත කිරීමට ද මෙම ආයතනය කටයුතු කරන බවත් ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වසරේ සිට ලැබෙන මුදල්වලින් 60%ක් පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව ද ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පර්යේෂණ ව්‍යාපෘති සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම, පර්යේෂණ සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වන බව ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පර්යේෂණ සමාජගත කිරීම සඳහා ඉහළ සිට පහළට මෙන්ම පහළ සිට ඉහළට තොරතුරු ගලා යාම වැදගත් බවත් ඒ සඳහා මාධ්‍ය මඟින් අදාළ තොරතුරු ජනතාව වෙත ලබාදීමෙන් ඔවුන් ද මෙම පර්යේෂණ ක්‍රියාවලියේ සක්‍රිය කොටස්කරුවන් බවට පත් කළ හැකි බවත් ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

**2.8 පාසල් ශිෂ්‍යයන් විද්‍යා හා තාක්ෂණ කටයුතු ආශ්‍රිත නව නිපයුම් සඳහා උනන්දු කරවීමේ වැදගත්කම හා ඒ ආශ්‍රිතව පවතින ගැටලු - ගරු අසෝක සපුමල් රන්වල මහතා**

මීට පෙර පාසල් තුළ ක්‍රියාත්මක වූ පාසල් දරුවන් විද්‍යා හා තාක්ෂණ පර්යේෂණවලට යොමු කරන විද්‍යා සංසද පිහිටුවීමේ ක්‍රියාවලිය මේ වන විට ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පෙර පැවැති ආකාරයෙන්ම ඉහත ක්‍රියාවලිය සිදු කරගෙන යාමට මේ වන විට බාධා මතුව ඇති බවත් ඒ සඳහා ලැබෙන ආධාරවල හිඟය හේතුවෙන් එම තත්ත්වය මතු වී ඇති බවත් ජාතික විද්‍යා පදනමේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පාසල්, විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යයන ආයතන තුළ නව නිපැයුම්කරුවන්ගේ සංගම් පිහිටුවීමට උපකාර කරන බවත් මේ වන විට දිවයින පුරා පාසල්වල නව නිපැයුම්කරුවන්ගේ සංගම් 700ක් පමණ පවතින බවත් නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම සංගම් සක්‍රිය තත්ත්වයට ගැනීම පිළිබඳව කටයුතු කරන බවත් පාසල්වල එම විෂය භාර ගුරුභවතුන්ගේ උනන්දුව මත මෙම සංගමයේ සක්‍රීය බව තීරණය වන බව නිරීක්ෂණය වී ඇති අතර නිරන්තරයෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නිලධාරීන්ගේ සම්බන්ධීකරණය එම සංගම් වෙත ලබාදෙන බවත් නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

පාසල් දරුවන් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ සඳහා යම් වාණිජමය වටිනාකමක් ලැබී තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පාසල් ළමුන් සඳහා පැවැත්වූ සහසක් නිමවුම් ප්‍රදර්ශනයට ඉදිරිපත් කළ පර්යේෂණවලින් 02% පමණ ප්‍රතිශතයක් වාණිජකරණයට ලක්වී ඇති බව නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.9 විශ්වවිද්‍යාලවල අවසන් වසර විද්‍යාර්ථීන්ට රට තුළ පවතින ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමට හැකි ඵලදායී පර්යේෂණයක නියැලීමට අමාත්‍යාංශය මඟින් මඟ පෙන්වීමක් ලබාදීම - ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

විශ්වවිද්‍යාලවල අවසන් වසරේ විද්‍යාර්ථීන් විසින් තම උපාධිය අවසන් කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු පර්යේෂණයන් රට තුළ ඇති අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සිදුකිරීමට මඟපෙන්වීම ලබා දිය යුතු බවත් මෙම පර්යේෂණවලට ආධාර කිරීමට හැකියාවක් ඇති පුද්ගලයන් දැනුවත් කිරීම මඟින් මෙම පර්යේෂණ ඉදිරියට ගෙන යා හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දුෂ්කර ප්‍රදේශවල දරුවන් තාක්ෂණික දැනුම ලබා ගැනීමට උනන්දුවක් දක්වන නමුත් ඒ සඳහා පහසුකම් අවම බැවින් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන හරහා හෝ රජයේ ආයතනවලින් හෝ මෙම දැනුම බෙදා දිය යුතු බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ජාතික විද්‍යා පදනම සහ ජාතික පර්යේෂණ සභාව විසින් වඩාත් කාලීන පර්යේෂණ සඳහා ප්‍රමුඛස්ථානය ලබාදීම මඟින් මෙම ගැටලුව තරමක් දුරට මඟහරවා ගත හැකි බවත් පාසල් ළමුන්ගේ විද්‍යා හා තාක්ෂණික නිපයුම් දිරිගැන්වීමට විද්‍යාභිවර්ධන සංගමය හරහා සෑම වර්ෂයකම ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිෂන් සභාවෙහි ද උපකාර ඇතිව පාසල් නව නිපයුම්කරුවන්ගේ තරඟයක් පැවැත්වීමට කටයුතු කරන බවත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ දී එම තරඟය සඳහා සඳහා අයදුම්පත් 2,000ක් පමණ ඉදිරිපත් වී ඇති නමුත් මෙම සියලු පර්යේෂණ දියුණුකර ඉදිරියට ගෙනයාමට නිසි ක්‍රමවේදයක් සකස් කිරීම අභියෝගයක් බව නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**2.10 ප්‍රාදේශීයව පවතින ගැටලු විසඳීම සඳහා පර්යේෂණ දිරිමත් කිරීම - ගරු අබූබකර් අතම්බාවා මහතා**

දිගාමඩුල්ල ප්‍රදේශයේ ද අලින් හා රිලවුන්ගෙන් සිදුවන වගා හානි වැළැක්වීමට තවමත් යොදාගන්නේ විදුලි අලි වැට බවත් මේ සඳහා ස්ථිර විසඳුමක් අවශ්‍ය බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශ්වවිද්‍යාල ආචාර්යවරු තම නිබන්ධන සඳහා පමණක් සීමා වී තම පර්යේෂණ කටයුතු සිදු කරන බැවින් මෙවැනි ප්‍රදේශවල පවතින විවිධ ගැටලු නිරාකරණය නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

වන සතුන්ගෙන් වගාවලට සිදුවන හානිය, ජෛව විද්‍යාත්මක මෙන්ම තාක්ෂණික ප්‍රශ්නයක් වී ඇති බවත් මේ සඳහා විසඳුම් ලබාදීමට නම් සියලුම පාර්ශව සම්බන්ධ කරගත යුතු බවත් ජාතික විද්‍යා පදනමේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිෂ්පාදන අරමුණු කරගත් පර්යේෂණ පමණක් නොව සේවාවන් සපයන පර්යේෂණ කෙරෙහි ද අවධානය දැක්විය යුතු බව ගරු චතුර ගලප්පත්ති මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පර්යේෂණයක් වාණිජකරණය කිරීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ දී ඉංජිනේරුමය කාර්යයන් සඳහා තම ආයතනය දායකත්වය දක්වන බව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී පර්යේෂණ දිරිමත් කිරීමේ පළමු ව්‍යාපෘතිය ලෙස නිෂ්පාදන 100ක් හඳුනාගෙන ඒවා වාණිජකරණය කිරීම සිදුකරන බවත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඒ බව ලිපි මඟින් දැනුම් දෙන බවත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පර්යේෂණ මට්ටමින් පහළ ඇති නිෂ්පාදන වාණිජකරණය කිරීමට ද යම් ආයතන ඇති නමුත් ජනතාවට එම ආයතන පිළිබඳ සන්නිවේදනය නොවීමේ ගැටලුව පිළිබඳව සහ එදිනෙදා සමාජයේ ඇති ප්‍රශ්න සඳහා විසඳුම් ලබා දෙන පර්යේෂණවල ඇති වැදගත්කම පිළිබඳව ද ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙම ගැටලු සඳහා විසඳුම් බිම් මට්ටමේ සිට ඉහළ ආයතන දක්වා සන්නිවේදනය කිරීමට විද්‍යාතා නිලධාරීන්ගේ සක්‍රීය දායකත්වය වැදගත් බව ද ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම අවස්ථාවේ දී විද්‍යාතා නිලධාරීන්ගේ කාර්යභාරය නිසි ලෙස ඉටු නොවීම සහ එහි පුරප්පාඩු පිළිබඳව පැමිණ සිටින ගරු මන්ත්‍රීවරුන් විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා අනුයුක්ත කරන විද්‍යාතා නිලධාරීන් පිළිබඳව යළි විමසා බැලීම, නිලධාරීන් නොමැති ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02ක් නියෝජනය වන පරිදි එක් විද්‍යාතා මධ්‍යස්ථානයක් හෝ ආරම්භ කිරීමට කටයුතු කිරීම වැනි පියවර ගෙන ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 2.11 පර්යේෂණ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කරගැනීම - ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අමාත්‍යාංශය හරහා සම්බන්ධීකරණ කටයුතු සිදුකරන නමුත් වෙනත් අමාත්‍යාංශ යටතේ ඇති ආයතන සම්බන්ධීකරණය කර ගැනීමේ වැඩපිළිවෙළක් ද අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය එම අමාත්‍යාංශය යටතේ වූ ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගන්නා බවත් ජනාධිපති ලේකම් කාර්යාලය හරහා අනෙකුත් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෙනත් අමාත්‍යාංශවල ඇති පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බවට ද ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

පාසල්වලින් විශ්වවිද්‍යාලවලින් හා වෙනත් බාහිර පාර්ශවයන් විසින් සිදුකරන පර්යේෂණ සියල්ල නිසිලෙස වෙන්කර හඳුනාගැනීම වැදගත් බව ගරු චතුර ගලප්පත්ති මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දුම්රිය සේවාවන්ට අයත් සංඥා එළි සවිකිරීම්, තේ දළු නෙළන යන්ත්‍ර සහ ස්වයංක්‍රීය ගංවතුර අනතුරු පිළිබඳ දත්ත ලබාදෙන යන්ත්‍ර නිපදවීම්, ඩ්‍රෝන තාක්ෂණය ඔස්සේ වගා කටයුතු දියුණු කිරීම් වැනි නව නිපයුම් බිහිකළ ද නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම මත එම කටයුතු දියුණු කිරීමේ ගැටලු මතුවී තිබෙන බව නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පර්යේෂණවලට සහාය ලබාදීම සඳහා තම ආයතනය මඟින් වෙබ් පිටුවක් ආරම්භ කර ඇති බවත් එම වෙබ් අඩවිය මඟින් තම පර්යේෂණයන්ට අදාළ ගැටලු යොමු කළ හැකි අතර ඒ සඳහා නිලධාරීන් අනුයුක්ත කර ඇති බවත් ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්හි සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පර්යේෂකයන්ට හා ව්‍යවසායකයින්ට පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රය තුළින් ඉදිරියට යාම සඳහා ලබාදිය හැකි සේවාවන් පිළිබඳ දැනුවත් වීමට සහ එම සේවාවන් ලබාගැනීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇති බව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම සියලු පර්යේෂණ කටයුතු ප්‍රචලිත කිරීම සඳහා නොපමාව වෙළෙඳපොළ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා යොමුවිය යුතු බවත් රිලවුන්ගෙන් සිදුවන වගා හානි අවම කිරීමට පිළියම් වශයෙන් නිපදවූ යන්ත්‍රය නියමු ව්‍යාපෘතියක් ලෙසින් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ආරම්භ කිරීමට හැකි බවත් ගරු කෝසල නුවන් ජයවීර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වන සතුන්ගෙන් සිදුවන වගා හානි පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වෙනත් රැස්වීමක් කැඳවීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප.ව. 1.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 19**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (සභාපති)
ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය)
ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු ගයාන් ජනක මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු රුවන් මාපලගම මහතා
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු දිනිඳු සමන් මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු අජිත් ගිහාන් මහතා
ගරු තනුර දිසානායක මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1 2022 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව**
(2024.12.18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

මෙම වාර්ෂික වාර්තාව අධ්‍යයනයෙන් අනතුරුව ඉදිරි කාරක සභා රැස්වීමක දී සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය ආයතනය 09කින් සමන්විත වන බවත් ඉන් ජාතික තරුණ සේවා සභාව, ජාතික යොවුන් සේනාංකය සහ

ඇඹිලිපිටිය පුහුණු මධ්‍යස්ථානය යන ආයතන 03 තරුණ ක්ෂේත්‍රය සම්බන්ධව සෘජුව කටයුතු කරන ආයතන 03 වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික තරුණ සේවා සභාව මඟින් මේ වන විට වැඩසටහන් 52ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇති බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩකටයුතු සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා කෙරෙමින් පවතින බවත් එකී වැඩකටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා සියලු දෙනාගේ සහයෝගය බලාපොරොත්තු වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තරුණ කටයුතු අංශය මෙන්ම ක්‍රීඩා අංශය තුළ පවතින ගැටලු පිළිබඳව සැලකිලිමත් වෙමින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද කටයුතු සිදු කරන බවත් මෙකී අංශ දෙකෙහි ම කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීමට අනු කාරක සභා 02ක් පිහිටුවීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, ක්‍රීඩාව සම්බන්ධ අනු කාරක සභාව ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, ගරු රුවන් මාපලගම මහතා සහ ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මියගේ සාමාජිකත්වයෙන් ද, තරුණ කටයුතු පිළිබඳව අනු කාරක සභාව ගරු ලසිත් භාෂණ ගමගේ මහතා, ගරු කෝසල නුවන් ජයවීර මහතා සහ ගරු දිනිඳු සමන් මහතාගේ සාමාජිකත්වයෙන් යුක්තව පිහිටුවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම අනු කාරක සභා පිහිටුවීමේ අරමුණු වනුයේ, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සහ ආයතන තරුණ පරපුර වෙත සමීප කිරීමත් මෙකී ආයතන යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධව කෙටි හැඳින්වීමක් සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් එකී ආයතනවල ප්‍රධානීන්හට දැනුම් දෙන ලදී.

ඒ අනුව, ජාතික තරුණ සේවා සභාව, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සහ ජාතික ක්‍රීඩා සභාව පිළිබඳව එම ආයතනවල සභාපතිවරුන්, ජාතික යොවුන් සේනාංකය සම්බන්ධයෙන් ජාතික යොවුන් සේනාංකයේ අධ්‍යක්ෂ, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳව එම ආයතනයේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා වෛද්‍ය ආයතනය සම්බන්ධයෙන් එම ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රීඩා විද්‍යායතනය පිළිබඳව එම ආයතනයේ අධ්‍යක්ෂ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායනය සම්බන්ධයෙන් එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් එම ආයතනයේ අධ්‍යක්ෂ විසින් දැනුවත් කිරීම් කරන ලදී.

## 3. වෙනත් කරුණු

### 3.1 ගරු මයිල්වාගනම් පෙගදීස්වරන් මහතා

#### 3.1.1 ඕමන්ත ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම

ඕමන්ත ප්‍රදේශයේ ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් ද ඇතුළත් ක්‍රීඩාංගනයක් ඉදිකර ඇතත් එහි පුහුණුකරුවන්ගේ හිඟතාවය, විශේෂයෙන් ම පිහිනුම් සහ ගෘහස්ථ ක්‍රීඩා සඳහා පුහුණුකරුවන් නොමැති වීම විශාල ගැටලුවක් ලෙස පවතින බැවින් ඒ සඳහා විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, මෙම ගොඩනැගිල්ලට විදුලිය සැපයීම සඳහා සූර්ය පැනල යොදා ගැනීම තුළින් විදුලි බිල්පත් ගෙවීමේ ගැටලුවට විසඳුමක් ලබා ගත හැකි බවත් මෙම ක්‍රීඩාංගණය තුළ ක්‍රීඩකයන්ට නවාතැන් පහසුකම් ලබා දීමට කටයුතු කිරීම තුළින් ක්‍රීඩකයන්ගේ පුහුණුවීම් සඳහා මනා රුකුලක් ලබා දිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, මෙම ප්‍රදේශයේ බොක්සින් ක්‍රීඩාව සඳහා පාසල් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා පදක්කම්ලාභී ක්‍රීඩකයින් සිටින බැවින් ඔවුන්ට මෙම ක්‍රීඩාංගණය තුළ පුහුණුවීම් සිදුකළ හැකි පරිදි අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.1.2 ආදර්ශ ක්‍රීඩා පාසල් ගොඩනැගීම

කලාප මට්ටමින් එක් පාසල බැගින් තෝරා ගනිමින් එම පාසල ආදර්ශ ක්‍රීඩා පාසලක් ලෙස දියුණු කිරීම සහ එම පාසල් සඳහා ක්‍රීඩා උපකරණ සහ අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබා දීම තුළින් පාසල් මට්ටමින් ක්‍රීඩාව දියුණු කළ හැකි බවත් දරුවන් ක්‍රීඩා කටයුතු සඳහා යොමු කිරීම තුළින් තරුණ පිරිස මත්ද්‍රව්‍ය සහ සමාජ මාධ්‍ය ජාලාවලට ඇබ්බැහි වීම වළක්වා ගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.2 කිලිනොච්චි රොඩ්රිගෝ ක්‍රීඩාංගණය දියුණු කිරීම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

කිලිනොච්චි රොඩ්රිගෝ ක්‍රීඩාංගණය එම දිස්ත්‍රික්කයේ පවතින එකම පොදු ක්‍රීඩාංගණය වන බවත් පසුගිය සමයේ මෙම ක්‍රීඩාංගණය දියුණු කිරීම සඳහා මුදල් වෙන්කර තිබූ නමුත් එහිදී සිදුවූ වංචා දූෂණ හේතුවෙන් මෙම ක්‍රීඩාංගනයේ වැඩකටයුතු නිම කර නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම වංචා දූෂණ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලෙසත් මෙම ක්‍රීඩාංගණය දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.3 ගරු මොහමඩ් සාලි නලීම් මහතා

### 3.3.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ ජාතික තලයේ ක්‍රීඩාංගණයක් ඉදිකිරීම

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ විවිධ ක්‍රීඩා සඳහා දක්ෂ ක්‍රීඩකයින් රැසක් සිටින නමුත් ඔවුන්ගේ ක්‍රීඩා කටයුතු සිදු කිරීම සඳහා ජාතික තලයේ ක්‍රීඩාංගණයක් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, ක්‍රීඩාවේ දියුණුව සඳහා මෙම ප්‍රදේශය තුළ ජාතික තලයේ ක්‍රීඩාංගණයක් ඉදිකර දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.3.2 මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්, අලිගාර් ජාතික පාසැලේ ක්‍රීඩාංගණය සහ අහමඩ් ෆරීඩ් ක්‍රීඩාංගණය වැඩිදියුණු කිරීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්, අලිගාර් ජාතික පාසල් ක්‍රීඩාංගණය ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ලෙස වැඩි දියුණු කිරීමට පසුගිය සමයේ මුදල් වෙන්කළ නමුත් එම මුදල් නැවත හරවා යවා එහි සංවර්ධන කටයුතු නතර කර ඇති බැවින් නැවතත් එම කටයුතු ආරම්භ කර එහි සංවර්ධන කටයුතු නිම කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, මෙම ප්‍රදේශයේ පිහිටා ඇති අහමඩ් ෆරීඩ් ක්‍රීඩාංගණයේ සංවර්ධන කටයුතු ද මේ අයුරින් ම නිමකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලීම් කරන ලදී.

## 3.4 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

### 3.4.1 මඩකලපුව වෙබර් ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් පවතින ගැටලුව විසඳීම

මඩකලපුව වෙබර් ක්‍රීඩාංගණය තුළ එම ප්‍රදේශයේ ප්‍රධාන පාසල්වල ක්‍රීඩා උත්සව පවත්වන අතර මෙම ක්‍රීඩාංගණය ආසන්නයේ අධිකරණය පිහිටා තිබීම හේතුවෙන් එහි ක්‍රීඩා උත්සව පැවැත්වීමේ දී අධිකරණ කටයුතුවලට බාධා මතුවන බැවින් මෙම ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, මඩකලපුව කල්කුඩා ප්‍රදේශය ආසන්නයේ කෝරකල්ලිමඩු යන ස්ථානයේ ප්‍රධාන පාරට මුහුණලා ක්‍රීඩාංගණයක් ඇති බවත් එය සංවර්ධනය කර සියලු දෙනාටම ප්‍රයෝජනවත් අයුරින් භාවිත කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.4.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රීඩා භාර නිලධාරීන්ගේ සහ ක්‍රීඩා උපකරණවල පවතින හිඟය

ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ක්‍රීඩා භාර නිලධාරීන්ගේ පුරප්පාඩු සහ ක්‍රීඩා උපකරණවල හිඟයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ක්‍රීඩා භාර නිලධාරීන්ගේ ඌනතාවය හේතුවෙන් තරුණයන් ක්‍රීඩාවට යොමු කිරීම අඩු වී ඇති බැවින් ඒ සඳහා අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, මඩකලපුව දිස්ත්‍රික්කය තුළ රටෙහි අනෙක් ප්‍රදේශවල මෙන් හොකී සහ රග්බි වැනි ක්‍රීඩා දියුණු කිරීමට කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.5 ක්‍රීඩා සංගම් නියාමනය සහ ක්‍රීඩා ආයතන තුළ සිදුවන වංචා දූෂණ විමර්ශනය කිරීම - ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

පසුගිය සමයේ ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය තුළින් සිදුවූ මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කටයුතු කරන ලෙසත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, මළල ක්‍රීඩා සංගමය වැනි ක්‍රීඩා සංගම් තුළ සිදුවන දූෂණ සහ අක්‍රමිකතා සම්බන්ධව ඇති විගණන වාර්තා විමර්ශනය කරමින් මෙකී ක්‍රීඩා සංගම් නියාමනය කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, එකී කටයුතු ඉටු කිරීම සඳහා දැනට පවතින ජාතික ක්‍රීඩා පනත යාවත්කාලීන කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.6 ජාතික තරුණ සේවා සභාව තුළ සිදු වූ දූෂණ සහ අක්‍රමිකතා විමර්ශනය කිරීම - ගරු කෝසල නුවන් ජයවීර මහතා**

පසුගිය සමයේ ජාතික තරුණ සේවා සභාව තුල සිදුවූ දූෂණ සහ අක්‍රමිකතා මෙන්ම දේශපාලන අභිලාෂයන් වෙනුවෙන් මුදල් අවභාවිතා කිරීම් පිළිබඳව විමර්ශනය කරන ලෙසත් එකී අක්‍රමිකතා සඳහා වගකිවයුතු නිලධාරීන් සහ දේශපාලන අධිකාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.7 ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**

**3.7.1 උතුරු සහ නැගෙනහිර පළාත් තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව ඇති කිරීම**

උතුරු සහ නැගෙනහිර පළාත් තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් වැඩ කටයුතු සිදු කරන ලෙසත් ඒ සඳහා එම ප්‍රදේශවල සිටින ක්‍රීඩා නිලධාරීන් සහ ක්‍රීඩකයන් අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් ඉදිකිරීමේ ශක්‍යතාව සම්බන්ධයෙන් සොයා බලන ලෙසත් එම ප්‍රදේශවල ක්‍රීඩාව පිළිබඳ වැඩි අවධානය යොමු කිරීමට කටයුතු කරන ලෙසත් ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, යාපනයේ දුරේයප්පා ක්‍රීඩාංගණය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

### 3.7.2 ක්‍රීඩාව තුළින් ජාතික සමගිය ඇති කිරීම

රටෙහි ජීවත්වන විවිධ ජාතීන් අතර යහපත් සබඳතාවක් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව උපයෝගී කරගත හැකි බවත් ඒ සඳහා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය තුළින් වැඩපිළිවෙළක් දියත් කළ යුතු බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.8 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රීඩාංගණ දියුණු කිරීම - ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවතින අඩු පහසුකම් සහිත පාසල් ක්‍රීඩාංගණ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන ඒකාබද්ධ වැඩපිළිවෙළක් තුළින් දියුණු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, ජාතික මට්ටමින් ක්‍රීඩකයින් තේරීමේ දී දේශපාලන බලපෑම්වලින් තොරව දක්ෂතාවයන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් තේරීම් ක්‍රියාවලිය සිදු කරන බව සමාජගත කිරීම සඳහා කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.9 මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම - ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මල්ලව පොර, කබඩි සහ දැල්පන්දු යන ක්‍රීඩා බහුලව සිදු කරන බවත් එම ප්‍රදේශවල පාසල් ළමුන් ජාතික මට්ටමින් ජයග්‍රහණ රැසක් අත්පත් කරගෙන තිබෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පාසල් ළමුන්ට ක්‍රීඩාව සඳහා අවශ්‍ය මූලික පහසුකම්වත් නොමැති බැවින් මෙවැනි පාසල් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදෙමින් ක්‍රීඩාව දියුණු කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, මඩකලපුව දිස්ත්‍රික්කයේ නව කෝඩමුනේ ක්‍රීඩාංගණය මේ වන විට විදේශ ආධාර මත සංවර්ධනය කරන බවත් ඒ සඳහා රජය මැදිහත් වීම තුළින් එය තවදුරටත් සංවර්ධනය කර ක්‍රීඩාවේ දියුණුව සඳහා යොදා ගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

## 3.10 දිවයින පුරා පාසල් ක්‍රීඩාව සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් (database) සකස් කිරීම - ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

දිවයින පුරා පවතින පාසල්වල ක්‍රීඩාව සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පැවතිය යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා රට පුරා පවතින පාසල්වල පවත්වනු ලබන ක්‍රීඩා වර්ග, එම ක්‍රීඩා කිරීම සඳහා ලබා දී ඇති පහසුකම් කවරේ ද සහ මෙම ක්‍රීඩා සඳහා ලබාගෙන ඇති ජයග්‍රහණ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත්

යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් නිර්මාණය කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.11 ගරු මුනීර් මුලාෆර් මහතා**

**3.11.1 ගම්පහ වතුපිටිවල ක්‍රීඩා සංකීර්ණය වෙත ප්‍රවාහන පහසුකම් ලබාදීම**

ගම්පහ, වතුපිටිවල ක්‍රීඩා සංකීර්ණය වෙත ගමන් කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් නොමැති වීම හේතුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් අපහසුතාවයට පත්වන බැවින් මෙම ආයතනය සමඟ සම්බන්ධීකරණය කර ක්‍රීඩා සංකීර්ණය වෙත ළඟාවීම සඳහා පොදු ප්‍රවාහන පහසුකම් ලබා දෙන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.11.2 ක්‍රීඩාවේ දියුණුව සහ ක්‍රීඩාව තුළින් ජාතික සමගිය ගොඩ නැගීම**

රටේ සියලුම ප්‍රදේශවලින් දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම සඳහා සාර්ථක යාන්ත්‍රණයක් ඉදිරිපත් කිරීම තුළින් ක්‍රීඩාව සඳහා විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ජාතික සමගිය ගොඩනැගීමේ දී තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි බැවින් ඒ සඳහා සියලුම ජාතීන් නියෝජනය කරමින් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රීඩා තරඟාවලි සංවිධානය කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, ක්‍රීඩාව සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම තුළින් ක්‍රීඩාවේ ප්‍රගතියක් අත්පත් කර ගත හැකි බවත් ජාත්‍යන්තරය තුළ සුප්‍රකට ක්‍රීඩා කණ්ඩායම් සමඟ මෙරට ක්‍රීඩකයින්ට ක්‍රීඩා කිරීමට අවස්ථාව සැලසීම තුළින් ඔවුන්ගේ දක්ෂතාවයන් වර්ධනය කළ හැකි අතරම ඔවුන්ගේ සබඳතා ඔස්සේ විදේශ පුහුණු ලබාගත හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.12 ක්‍රීඩා පාසල් සඳහා පහසුකම් ලබාදීම - ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**

මෙවර අයවැය තුළින් ක්‍රීඩා පාසල් සංවර්ධනය සඳහා මුදල් වෙන්කර ඇති බැවින් එක් එක් ක්‍රීඩාව සඳහා දක්ෂතා සහිත ක්‍රීඩකයන් සිටින පාසල් තෝරාගෙන එම පාසල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

නිදසුනක් ලෙස නාත්තන්ඩිය ධම්මිස්සර පාසල අත්පන්දු ක්‍රීඩාව සඳහා ප්‍රකට පාසලක් වන බැවින් එවැනි පාසල් හඳුනාගෙන එකී පාසල්වල ක්‍රීඩාව දියුණු කිරීම සඳහා පහසුකම් ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**4. ගරු සභාපතිතුමාගේ අදහස් දැක්වීම**

ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් විසින් ඉදිරිපත් කරන ලද ගැටලුවලට පිළිතුරු ලබාදීමේ දී ඇතැම් ගැටලු සඳහා පිළිතුරු ඒ

සම්බන්ධව හැදෑරීමෙන් අනතුරුව ඊළඟ සභා වාරයේ දී ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පොදුවේ ගත් කළ විශේෂයෙන්ම මෙම කාරක සභාව තුළ උතුරු සහ නැගෙනහිර ක්‍රීඩා සංවර්ධනයට අදාළව ගැටලු පැන නැඟුන බවත් ඒ සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සොයා බලන බවත් එම ප්‍රදේශවල ක්‍රීඩාව නඟා සිටුවීම සඳහා වැඩපිළිවෙලක් දියත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

විශේෂයෙන්ම බොක්සින්, කබඩි හා පාපන්දු ක්‍රීඩාවන් සඳහා දක්ෂ දරුවන් උතුරු සහ නැගෙනහිර පළාත්වල සිටින බැවින් මෙවර අයවැය තුළින් වැඩි මුදලක් උතුරු සහ නැගෙනහිර ක්‍රීඩා සංවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට වෙන්කර ඇති බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ක්‍රීඩාවේ දියුණුව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කරන බවත් ජාත්‍යන්තර ක්‍රීඩාංගණ ඉදිකිරීමට මෙන්ම ග්‍රාමීය මට්ටමින් ක්‍රීඩාව දියුණු කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ක්‍රීඩා අමාත්‍යාංශයේ ආයතන තුළ සිදුවූ වංචා දූෂණ විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බවත් සුගතදාස ක්‍රීඩාංගණයේ සහ ජාතික තරුණ සේවා සභාවේ සිදුවූ වංචා දූෂණ සෙවීම සඳහා කමිටු 02ක් පත් කර විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, පාසල් ක්‍රීඩාවට අවශ්‍ය මුදල් වෙන් කිරීම සහ ඒවායේ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පැවතිය ද, පාසල් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බවත් සම්පත්දායකයන්ගේ සහාය ඇතිව පාසල්වල ක්‍රීඩා තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු සංවර්ධනයට අදාළව ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා ලිඛිතව ලබා දෙන ලෙසත් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ඉදිරි වැඩකටයුතු සඳහා සහයෝගය ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**5.** කාරක සභාව ප. ව. 12.35ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

## ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
## පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 20

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මහතා (සභාපති)
ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය)
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු ගයාන් ජනක මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු සුරංග රත්නායක මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා (ගරු කථානායකතුමා)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු බී. ආරියවංශ මහතා
ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු විජේසිරි බස්නායක මහතා

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ අංශ 05ක් ඔස්සේ, ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම, ඩිජිටල් කර්මාන්තය, ඩිජිටල්කරණ හරහා රාජ්‍යකරණ යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීම, ඩිජිටල්කරණය හා සම්බන්ධ ඉංජිනේරුවරුන් ප්‍රමාණය වැඩි කිරීම, ඩිජිටල් ගෙවීම් හරහා ඩිජිටල් ආර්ථික වර්ධනයක් ඇති කිරීම, ඩිජිල්කරණය හරහා අනෙකුත් ක්ෂේත්‍රවලට අමාත්‍යාංශයක් ලෙස සහාය ලබා දීම, එම ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම, වියදම අඩු කිරීම සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි කිරීමට බලාපොරොත්තු වන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම (SLT), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT), ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය (DPA), තොරතුරු තාක්ෂණ උද්‍යාන, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

(DRP) හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) යන ආයතන 07 පවතින බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය ඩිජිටල්කරණයේ නියමු ආයතනය ලෙස වසර 20කට පෙර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ස්ථාපිත කළ බවත් ඉදිරියේ දී ඩිජිටල් ආර්ථික අධිකාරියක් (Digital Economic Authority) හරහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පනත් කෙටුම්පත් සකස් කරමින් පවතින බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව ආයතනවල අවශ්‍යතාවය අනුව ජාලගත කරන ලද ජාතික සැලැස්මක් හරහා නව ඩිජිටල්කරණ වැඩපිළිවෙළ සෑම අමාත්‍යාංශකටම සහ දෙපාර්තමේන්තුවකටම හඳුන්වා දීමට අපේක්ෂා කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනයේ දී පුද්ගලයන් නිවැරදිව හඳුනා ගැනීම සඳහා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත (Unique Digital ID) හඳුන්වා දීමට ප්‍රමුඛස්ථානයක් ලබා දෙන බවත් ඒ හරහා දත්ත හුවමාරු කර ගැනීම සඳහා ජාතික දත්ත හුවමාරු පද්ධතියක් (National Data Exchange) සකස් කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

දැනට ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති වෙත උපදෙස් ලබාදෙන ලදී.

හරස්තල යටිතල පහසුකම් සංවර්ධනය, ගෙවීම් පද්ධතිය නවීකරණය හා නූතන තාක්ෂණය යෙදවීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති බව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්ටාර්ලින්ක් (Starlink) අන්තර්ජාල සේවාව පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

ස්ටාර්ලින්ක් (Starlink) අන්තර්ජාල සේවාව හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත පැකේජ 05 සම්බන්ධයෙන් 2025.02.24 වැනි සඳුදා දින සාකච්ඡාවක් පවත්වන බවත් මසක් ඇතුළත මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ හැකි බවත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා රජයේ පරිපාලනය යටතේ සුදුසු අවකාශයක් (Land Station) තිබිය යුතු අතර අවසර පත්‍ර ප්‍රදානයේ දී මේ පිළිබඳව සලකා නොමැති බවත් ආරක්ෂක අමාත්‍යාංශය හරහා සලකා බැලීමට ඉල්ලීමක් මේ වන තෙක් සිදුකර නොමැති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඩිජිටල්කරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්තු 10 වැනි දින පාර්ලිමේන්තුවේ දී පවත්වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2. වෙනත් කරුණු

## 2.1 ගරු චතුර ගලප්පත්ති මහතා

### 2.1.1 අමාත්‍යාංශයට අදාළ ආයතන

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට අදාළ ආයතන පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කර ලදී.

2001 වර්ෂයේ දී ආරම්භ කළ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් දියත් කළ e - Sri Lanka ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව සහ ඩිජිටල්කරණය කළ road map පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 2.1.2 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමක් සිදු නොකළ බැවින් විවිධ මෘදුකාංග භාවිතයෙන් වෙන වෙනම තොරතුරු පද්ධති ආයතන විසින් පවත්වාගෙන යෑම හේතුවෙන් මෙම තොරතුරු මධ්‍යගතවීම සිදු නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සෑම අමාත්‍යාංශයකටම ඒ ඒ ආයතනවල මෙහෙයුම් පද්ධති සකස් කර ගැනීමට නිදහස තිබෙන අතරම, ඒවා සම්මත ආකාරයට ක්‍රියාත්මක වන බවට ජාතික මෙහෙයුම් පද්ධතියකින් අධීක්ෂණය කළ යුතු බවත් ඒවායේ උපයෝගිතාව සහ ජාතික පද්ධතියට සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ හේතුවෙන් අමාත්‍යාංශවල මෙහෙයුම් පද්ධතිවල වෙනසක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ජාතික තරුණ සේවා සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති 03ක් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළ බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.1.3 දත්ත පද්ධතිවල ආරක්ෂාව නියාමනය කිරීම

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මඟින් පවත්වා ගෙන යනු ලබන මධ්‍යගත දත්ත පද්ධතියේ ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් මෙම දත්තවල ආරක්ෂාව ජනතාවට සහතික කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) සතු දත්ත ගබඩාවේ දත්තවල ආරක්‍ෂාව සම්බන්ධයෙන් මතු වූ ගැටලුවට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සහ ඩිජිටල් හැඳුනුම්පත හරහා දත්ත ගබඩා මෙරටෙහි ස්ථාපිත කරන්නේ ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

දත්ත ආරක්ෂණ අධිකාරිය (Data Protection Authority) හරහා පෞද්ගලික දත්ත පිළිබඳ ආරක්ෂාව නියාමනය කරන අතර එහි නීතිමය රාමුවේ වෙනස් කිරීම් කිහිපයකින් පසු එය බලාත්මක කිරීම අරඹන බවත් සයිබර් ආරක්ෂාව (cyber security) නියාමනය වන නව ආයතනයක් පිහිටුවන බවත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දත්ත වර්ගීකරණය (Data Classification) කිරීමේ දී හඳුනා ගනු ලබන සංවේදී දත්ත, ශ්‍රී ලංකාවේ රඳවා ගැනීමට අවශ්‍ය නීතිමය නියාමන රාමුවක් ඉදිරියේ දී ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් (වැ. බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.1.4 ආයෝජකයන්ට දත්ත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමට අවස්ථාවක් ලබාදීම

දත්ත මධ්‍යස්ථානයක් (Data Centre) මෙරට පවත්වාගෙන යෑමට විශාල බලශක්ති පිරිවැයක් අවශ්‍ය වන බැවින් සුළං බලශක්ති ජනන ව්‍යාපෘති (wind power generation project) හරහා ආයෝජකයන්ට දත්ත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමට අවස්ථාවක් ලබා දීමේ ශක්‍යතාවය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය මූලික පිරිවැය මෙන්ම එක් ජාතික විදුලිබල පද්ධතියක් (National Grid) පමණක් පැවතීම ගැටලු ලෙස උද්ගතවන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

Google හා තවත් සමාගම් ශ්‍රී ලංකාවේ දත්ත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමට කැමැත්ත පළකර ඇති බවත් මේ සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යාංශය සහ විදේශ ආධාර සපයන ආයතන සමඟ සාකච්ඡා කිරීමට නියමිත බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.1.5 තොරතුරු තාක්ෂණය ආශ්‍රිත උපාධි පාඨමාලාවල නියැලෙන උපාධි අපේක්ෂකයන්ට පුහුණුවක් ලබාදීම

විශ්වවිද්‍යාලවල පවතින තොරතුරු තාක්ෂණය ආශ්‍රිත උපාධි පාඨමාලාවල පුහුණුව (Internship) සඳහා උපාධි අපේක්ෂකයින් යොමු විය හැකි ආයතන ශ්‍රී ලංකාවේ නොමැති වීම හේතුවෙන් උපාධිය සම්පූර්ණ කරගත නොහැකි තත්ත්වයට පත් වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලය විසින් උපාධි පාඨමාලාවලින් මෙම පුහුණු අවශ්‍යතාවය ඉවත් කර ඇති බවත් විශ්වවිද්‍යාලයට

තොරතුරු තාක්ෂණය සම්බන්ධ පෞද්ගලික ආයතන කැඳවා මෙම පුහුණු අවශ්‍යතාවයන් පිළිබඳව සිසුන් දැනුවත් කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා කඩිනම් විසඳුමක් ලබාගත හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙරට ඩිජිටල් ආර්ථිකය වසර 05ක් තුළ උසස් තලයකට ගෙන ඒමට පවතින වැඩපිළිවෙළ ශ්‍රී ලංකාවේ පවතින තොරතුරු තාක්ෂණ සම්බන්ධ ආයතන සඳහා ලබා දීමට අපේක්ෂා කරන බවත් ඒ හරහා නව රැකියා විශාල ප්‍රමාණයක් නිර්මාණය වන බවත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෘත්‍රිම බුද්ධිය හරහා මේ වන විට විශාල රැකියා ප්‍රමාණයක් ආදේශනය වීම හේතුවෙන් අප රටේ මානව සම්පත කෘත්‍රිම බුද්ධිය සමඟ වැඩ කිරීමට නැවත පුහුණු කළ යුතු බවත් (Reskilling) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 2.1.6 කෘත්‍රිම බුද්ධිය ඇසුරෙන් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ඉදිරි වැඩපිළිවෙළ

ලෝකය මේ වන විට කෘත්‍රිම බුද්ධිය හරහා කටයුතු කිරීමට පෙළඹෙන බැවින් කෘත්‍රිම බුද්ධිය හරහා ගනුදෙනු කිරීමට පවතින සූදානම පිළිබඳව සහ ඒ සම්බන්ධයෙන් ආයතනයක් පිහිටුවා තිබේ නම් එහි ප්‍රගතිය පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන වැඩපිළිවෙළ යටතේ කෘත්‍රිම බුද්ධිය හේතු කොටගෙන ඇතිවන අභියෝග මෙන්ම අවස්ථා සඳහා ප්‍රතිපත්තිමය හා නියාමන යන අංශ දෙකෙන්ම සැලසුම් සකස් කරමින් පවතින බව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම නියාමනයන් හරහා නව මෘදුකාංග නිර්මාණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

නිපුණතාවය නියාමනය කිරීම මෙන්ම කෘත්‍රිම බුද්ධිය හරහා විකෘතියට පෙරළීම වැළැක්වීමට ප්‍රමුඛතාවය ලබා දෙන බවත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය අයවැයෙන් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ස්වේච්ඡාවෙන් කටයුතු කරන කාර්යසාධන බලකායක් ඇති බවත් පාර්ශවකරුවන්ගේ අදහස් විමසා උපායමාර්ගික සැලැස්මක් දැනට සකස්කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් (වැ. බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.1.7 කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ ජාතික සභාව

කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ ජාතික සභාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

යෝජිත ඩිජිටල් ආර්ථික අධිකාරිය හා ඒකාබද්ධව මෙම සභාව පිහිටුවීමට පෙර පැවති පනත් කෙටුම්පතෙහි අන්තර්ගත කර ඇති බවත් සිංගප්පූරුව සමඟ කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ අවබෝධතා ගිවිසුමක් ඇති කිරීමට පියවර ගෙන ඇති බවත් අමාත්‍යාංශ ලේකම් (වැ. බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සිංගප්පූරුව පමණක් නොව මෙහිදී දකුණු ආසියානු කලාපයේ සියලු රටවල් මේ සමඟ සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

## 2.2 ගරු කෝසල නුවන් ජයවීර මහතා

### 2.2.1 දුරකථන ජාල ආවරණ (Network coverage) ලබාදීම

2G දුරකථන ජාල ආවරණ නොමැති ප්‍රදේශ බොහොමයක් ඇති අතර, කඳුකර ප්‍රදේශවල දුරකථන ජාල ආවරණ ප්‍රමාණවත් නොවන බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා දුරකථන ජාල ආවරණ නොමැති ප්‍රදේශවලට එම පහසුකම ලබා ගැනීමට ඉල්ලීමක් සිදුකළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2G ආවරණ 84%ක් ද 4G ආවරණ 77%ක් පවතින බවත් "ගමට සන්නිවේදනය" වැඩසටහන යටතේ සන්නිවේදන කුලුණු ඉදිකර දුරකථන ජාල ආවරණ නොමැති ප්‍රදේශවලට පහසුකම් ලබා දීමට අපේක්ෂා කරන බවත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම සන්නිවේදන කුලුණු ඉදිකිරීම සහ දුරකථන ජාල ආවරණ ලබාදීම සිදුවන කාල පරාසය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඒ සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරියේ දී ඉදිරිපත් කරන බවත් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ප්‍රගතිය පිළිබඳ කෙටි වැඩමුළුවක් පැවැත්වීමට සූදානම් බවත් අමාත්‍යාංශ ලේකම් (වැ. බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දුරකථන කුලුණු ඉදිකිරීමට අපේක්ෂිත ප්‍රදේශ සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදීමට හැකි බවත් එසේ ජාල ආවරණයක් නොමැති ප්‍රදේශ පිළිබඳව ඉල්ලීමක් සිදු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

මාතර නගරයේ මීටර් 100ක, 200ක වැනි කුඩා පරතරවල පවා දුරකථන ජාල ආවරණ නොමැති ප්‍රදේශ ඇති බවත් එම ප්‍රදේශවල ළමයින්ට අන්තර් ජාල පහසුකම් නොමැති බවත් ගරු චතුර ගලප්පත්ති මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

100%ක් කඳු ආශ්‍රිත ප්‍රදේශ සඳහා මෙවැනි ගැටලු පවතින බවත් ඒ සඳහා 5G තාක්ෂණය තුළින් විසඳුම් ලබා දීමට කටයුතු කරන බවත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2.2 ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සතු රැහැන් ක්‍රමවත්ව සැකසීම**

අපිළිවෙළට පවතින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සතු රැහැන් "Clean Sri Lanka" ව්‍යාපෘතිය හරහා පිළිවෙළට සකසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු චතුර ගලප්පත්ති මහතා ද පළ කරන ලදී.

මේ සඳහා රු. මිලියන 100ක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරන අතර පොළොව තුළින් රැහැන් ස්ථානගත කිරීමේ දී විශාල වියදමක් වැය වන බවත් තවත් ආයෝජන පහසුකම් ලබා ගත හැකි නම් එම ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකි බවත් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.3 ගරු සුරංග රත්නායක මහතා**

**2.3.1 දුරකථන ජාල මාරු කිරීමක දී පැරණි දුරකථන අංකයම ලබාදීමට කටයුතු කිරීම (Number Portability)**

එක් ජාලයකින් තවත් ජාලයකට මාරු වීමේ දී සම්බන්ධතාවය ලබා දෙන ආයතන පැරණි දුරකථන අංකයම ලබා නොදෙන බැවින් වෙනත් රටවල මෙන් පැරණි දුරකථන අංකයම ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම වර්ෂයේ ජූනි මාසය වන විට එකම දුරකථන අංකයකින් ඕනෑම ආයතනයක දුරකථන පහසුකම් ලබා දීමට කටයුතු කරමින් පවතින බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 මෘදුකාංග ඉංජිනේරුවරුන්ගේ වැටුප - ගරු අර්කම් ඉල්යාස් මහතා**

රාජ්‍ය සේවයේ නියුතු මෘදුකාංග ඉංජිනේරුවරුන්ට රු. 80,000 - රු. 100,000 වැනි අඩු වැටුපක් හිමි වුවත් පෞද්ගලික අංශයේ එම තනතුරෙහි වැටුප රු. 500,000 - රු. 600,000 වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, රාජ්‍ය සේවයට මෘදුකාංග ඉංජිනේරුවරුන් ආකර්ෂණය කර ගැනීමට වැඩපිළිවෙළක් පවතී ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

විශේෂ වෙනත් වැටුප් තලයක මෘදුකාංග ඉංජිනේරුවරුන්ගේ වැටුප පිහිටු වීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**

**2.5.1 ඩිජිටල්කරණය වැඩපිළිවෙළ අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා ව්‍යාප්ත කිරීම**

රේඛීය අමාත්‍යාංශයේ වැඩකටයුතු අනිකුත් දිස්ත්‍රික්ක සඳහා ව්‍යාප්ත කිරීමට පවතින වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී

**2.5.2 දෙමළ ජාතික සේවකයින් මෙරටට සේවය සඳහා ගෙන්වා ගැනීම**

උතුරු පළාතේ විදෙස්ගතව සේවයේ නියුතු දෙමළ ජාතික සේවකයන් මෙරට සේවය කිරීමට අපේක්ෂාවෙන් සිටින බැවින් ඒ සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයෙන් ආරාධනා කිරීමට කටයුතු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

**2.6 ශ්‍රී ලංකාවේ crypto currency සම්බන්ධයෙන් ක්‍රියාත්මක නීතිය - ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**

මේ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් දැනට නීතිමය විධිවිධාන නොමැති බවත් මෙවැනි ක්‍රියාවලීන් නියාමනයට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප. ව. 12.20 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 21**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (සභාපති)
ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍ය)
ගරු පලනි දිගම්බරම් මහතා
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා
ගරු ඔෂානි උමංගා මහත්මිය
ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු නිතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු වසන්ත සමරසිංහ මහතා
ගරු රවී කරුණානායක මහතා

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2022 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2023 වර්ෂය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

**1.3 2023 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

**1.4 2022 වර්ෂය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

මෙම වාර්ෂික වාර්තාව සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා අධ්‍යයනයෙන් අනතුරුව ඉදිරි කාරක සභා රැස්වීමක දී සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2. වෙනත් කරුණු**

**2.1 සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම**

2022 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම පිළිබඳව ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය සහ ගරු වසන්ත සමරසිංහ මහතා විසින් විමසීමක් කරන ලදී.

මෙම වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම මඟින් තොරතුරු ලබාදීමේ ප්‍රමාදය බරපතල ගැටලුවක් බැවින්, ගිණුම් තැබීමේ දී මූලිකවම සැලකිලිමත් විය යුතු ගිණුම්කරණ මූලධර්ම කඩ වී ඇති බවත් අදාළ බලධාරීන් ඒ පිළිබඳව සැළකිලිමත් විය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පනත ප්‍රකාරව මූල්‍ය වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත විගණනය සඳහා ලබා දිය යුතු බවත් මාස 03ක් ඇතුළත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට සහ කම්කරු අමාත්‍යාංශයට එම මූල්‍ය වාර්තා ලබා දිය යුතු බවත් ශ්‍රී ලංකා මහබැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අවසන් විගණන වාර්තාව සාමාන්‍යයෙන් මාස 9කින්, එනම් සැප්තැම්බර් මාසය වන විට ලැබෙන බවත් ඉන්පසුව වාර්ෂික වාර්තාව සකස් කර කම්කරු අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු බවත් ශ්‍රී ලංකා මහබැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් දැනුම් දෙන ලදී.

2023 වර්ෂයේ මූල්‍ය වාර්තා, වාර්ෂික වාර්තා මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති බවත් මේ වන විටත් 2024 වර්ෂයේ මූල්‍ය වාර්තා ද විගණන කමිටුවට යොමු කර ඇති බවත් ශ්‍රී ලංකා මහබැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් දැනුම් දෙන ලදී.

අදාළ නිලධාරියා විසින් දැනුම් දුන් පරිදි මෙම ක්‍රියාවලිය අවසන් වීමට එකී කාල සීමාව ගත වන බව ගරු රවී කරුණානායක මහතා විසින් ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

පෙර සඳහන් කරන ලද කාල සීමාව මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ වන බවත් එය වාර්ෂික වාර්තාවක් ලෙස සැකසීම සඳහා තවදුරටත් වැඩකටයුතු කිහිපයක් අවසන් කළ යුතු බවත් ශ්‍රී ලංකා මහබැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් දැනුම් දෙන ලදී.

රටේ විශාලතම අරමුදල වන මෙකී සමාජ ආරක්ෂණ අරමුදලේ තිබෙන විශාලත්වය පදනම් කරගනිමින් විශාල මූල්‍ය හානි සිදුවන තත්ත්වයක් පවතින බැවින් ඒ පිළිබඳ වූ වගකීම සුළුකොට තැකිය නොහැකි බවත් මෙම වාර්තා අදාළ කාලවකවානුවේ දී ඉදිරිපත් කිරීම වැදගත් වන බවත් ගරු වසන්ත සමරසිංහ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.2 ගරු රවී කරුණානායක මහතා

### 2.2.1 සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ ඇති ගිණුම් සංඛ්‍යාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

දැනට සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් මිලියන 22ක් පමණ ලියාපදිංචි වී ඇති බවත් මෙහිදී එකම පුද්ගලයකුට හිමිකම ඇති ගිණුම් කිහිපයක් පවතින අවස්ථා ඇති බැවින් මිලියන 2.6ක පමණ ගිණුම් ප්‍රමාණයක ක්‍රියාකාරී දායකත්වයක් පවතින බවත් ශ්‍රී ලංකා මහා බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගිණුම් ලියාපදිංචි කිරීම ජාතික හැඳුනුම්පත් අංකය මූලිකව භාවිතා කරමින් 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන්නේ ද යන්න පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

2013 වර්ෂයේ දී පනත සංශෝධනය වූ නමුත් 2022 වර්ෂයේ දී රෙගුලාසි ගෙන එන ලද බවත් 2024 වර්ෂයේ දී එය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කළ බවත් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙමඟින් නව සේවකයකු ආයතනයකට බඳවාගෙන දින 30ක් ඇතුළත ලියාපදිංචි කළ යුතු බවත් මේ සඳහා මූලිකවම ජාතික හැඳුනුම්පත් අංකය සහ ජාතික හැඳුනුම්පතෙහි අන්තර්ගත නාමය

භාවිත කරනු ලබන බවත් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

අරමුදලේ ගෙවීම් ක්‍රියාවලිය සඳහා මහ බැංකුවට යොමු කරනු ලබන අයදුම්පතයෙහි ද (C පත්‍රිකාවේ) මෙම තොරතුරුම ඇතුළත් විය යුතු බව ද කම්කරු කොමසාරිස් ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඕනෑම අවස්ථාවක අරමුදලේ සාමාජිකයකුගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ නම ඇතුළත් කළ විට අදාළ සියලුම ගිණුම් සම්බන්ධ තොරතුරු ලබාගත හැකි බවත් සාමාජික අංක කිහිපයක් තිබුණත් එම ගිණුම් ඒකාබද්ධ කොට අදාළ ජාතික හැඳුනුම්පත් අංකය යටතේ තොරතුරු ලබාගත හැකි බවත් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

1958 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම අරමුදලේ ලියාපදිංචි වීමේ දී ජාතික හැඳුනුම්පත් නොමැති එකල පැවති තත්ත්වය මත සේවායෝජකයින් විසින් යොමු කර තිබූ නාමයන්ගෙන් එම ගිණුම් පවත්වාගෙන යනු ලැබුව ද මේ වන විට මෙම ක්‍රියාවලිය ඩිජිටල්කරණය කරමින් සේවකයින් 50ට වැඩි ආයතනවල ලියාපදිංචිකිරීම් සිදු කරනු ලබන බවත් දැනට මෙයින් 15% පමණ දායක වී තිබෙන අතර එතුළින් සමස්ත අරමුදලේ 80%ක් පමණ ආවරණය වී ඇති බව දැකගත හැකි බවත් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පෙර පැවති තත්ත්වයන් අනුව යම් ආයතනයක එකම නමින් පුද්ගලයින් කිහිපදෙනෙකුගේ ගිණුම් ඇති අවස්ථාවල දී එම ගිණුම්වල හිමිකාරීත්වය ඔප්පු කිරීම ගැටලුසහගතවන අවස්ථා කම්කරු දෙපාර්තමේන්තුව තුළ දී පැන නැඟී තිබෙන බවත් එම වකවානුවේ දී පවා දින 14ක් තුළ ලියාපදිංචි වීම අනිවාර්යය කර තිබුණ ද 40%ක් පමණ එම කටයුත්ත සිදුකර නොමැති බවත් ශ්‍රී ලංකා මහා බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අරමුදල් ලබා ගැනීමට යාමේ දී මෙම ගැටලුව හඳුනා ගත් බැවින් මින් ඉදිරියට නව ඩිජිටල් ක්‍රියාවලිය ඔස්සේ කටයුතු කළ ද පෙර දත්ත ගොනු සම්බන්ධ ගැටලු විසඳීමට ජංගම කාර්යාල ඔස්සේ, නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් (ජාතික හැඳුනුම්පත යොදා ගනිමින්) දැනට ක්‍රියාත්මක කරන බව ශ්‍රී ලංකා මහා බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් දැනුම් දෙන ලදී.

මෙම පුද්ගල නාමයන් සම්බන්ධ ගැටලු වතු සේවකයින් සම්බන්ධයෙන් ඇතිවන අවස්ථා පැවතිය ද එම ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දී ඇති බව ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දින 14ක් ඇතුළත ලියාපදිංචි වීම අනිවාර්ය කර තිබුණේ සේවායෝජකයින් සම්බන්ධයෙන් වන අතර සේවකයින් සඳහා එසේ නිශ්චිත කාල සීමාවක් පෙර නොතිබුණු බවත් මේ හේතුවෙන් බොහෝ පිරිසක් දායක මුදල් ගෙවා තිබුණු නමුත් විශ්‍රාම ලබන අවස්ථාවේදීත්

කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති බවත් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පුද්ගල තොරතුරු එකිනෙකට නොගැළපීම හේතුවෙන් ඇති වූ ගැටලුව මේ වන විට විසඳෙමින් පවතින බව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුව සේවායෝජකයින් සහ සේවාදායකයින් යන දෙපාර්ශවය සමඟම යහපත් ආකාරයෙන් කටයුතු කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් ගරු ඕෂානි උමංගා මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සේවක භාරකාර අරමුදලේ තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තව ද, මෙය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පාලනය වන බැවින් සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් මෙම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට සහභාගි නොවන බැවින් පසුව ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව ගරු වසන්ත සමරසිංහ මහතා, ගරු ඕෂානි උමංගා මහත්මිය විසින් ද වැඩිදුරටත් අදහස් පළ කරන ලදී.

### 2.2.2 කම්කරු වර්ජනය

මෙරට ක්‍රියාත්මක වන කම්කරු වර්ජනවල දී ඒ පිළිබඳව ප්‍රථමයෙන් එහි සාමාජිකත්වය අදාළ අවසර ලබා ගනිමින් කිසිඳු මහජන හානියකින් තොරව එම කටයුතු සිදුකිරීම සඳහා වන ක්‍රමානුකූල නීති රාමුවක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.2.3 උපයන විට ගෙවීම සම්බන්ධ බදු (PAYE Tax) අය කිරීම

උපයන විට ගෙවීම සම්බන්ධ බදු අය කිරීමේ දී දැනට පවත්නා තත්ත්වයට වඩා සාධාරණ අන්දමින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එකී කාරණය පිළිබඳ සැළකිලිමත් විය යුතු බවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රථමයෙන් රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය සහ ආදායම පිළිබඳ සැලකිලිමත් විය යුතු බවත් සිව්වැනි සමාලෝචනයේ දී මෙම බදු අනුපාත සංශෝධනය පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.3 වතු කම්කරුවන් මුහුණ දෙන ගැටලු - ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

වතු කම්කරුවන් මුහුණ දෙන මූලික දුෂ්කරතා ලෙස ඔවුන්හට ලැබිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම්වල යාවත්කාලීන ශේෂයන් අන්තර්ගත තම ගිණුම් ප්‍රකාශ නොලැබීමත්, සේවකයින් වියපත්ව මිය යාමෙන් පසු අවම වශයෙන් ඔවුන්ගේ දරුවන්හටවත් එම අරමුදල් ලබා ගැනීමට නොහැකිවීමත්, එම මුදල්වලට සිදු වී ඇත්තේ කුමක් ද යන්න සම්බන්ධයෙන් ගැටලු පවතින බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම අරමුදල් ගෙවීමේ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවීම නිසාත් කාර්යාල කිහිපයක ලේඛන කටයුතු කළ යුතු නිසාත් එම අරමුදල් ලබා ගැනීමේ ගැටලු පවතින බව ගරු පලනි දිගම්බරම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලු පැන නැගීමට හේතුව මූලිකවම ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවත්නා දත්ත පද්ධතියේ සහ රේඛීය අමාත්‍යාංශය සතු දත්ත පද්ධතියේ අන්තර්ගත පුද්ගල නාමයන් පිළිබඳව විෂමතාවයන් පැවතීම වන බවත් එය මේ වන විට යම්කිසි මට්ටමකට නිරාකරණය කිරීමට කටයුතු ආරම්භ කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම පිළිබඳව සැලසුම් කරමින් සිටින බවත් (නව මෘදුකාංගයක් මිලදී ගැනීම සම්බන්ධයෙන්) එම කටයුතුවල දී සේව්‍යයා සහ සේවකයා යන දෙපාර්ශවයටම අවශ්‍ය සේවාව සැපයීමට හැකි පරිදි කටයුතු කරන ලෙස අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කළ බව ද අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම දත්ත පද්ධති තුළ පවත්නා විෂමතාවයන් වාර්තාවක් මගින් ලබා ගැනීම සඳහා මේ වන විට මොරටුව විශ්වවිද්‍යාලය සමඟ සාකච්ඡා පවත්වා උපදේශන සේවාවන් ලබා ගනිමින් සිටින බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දත්ත පද්ධති තුළ පවත්නා වෙනස්කම් හඳුනාගනිමින්, ප්‍රථමයෙන් වයස අවුරුදු 50ට වැඩි පුද්ගලයින්ට ප්‍රමුඛතාවය දෙමින් එම වෙනස්කම් විසඳමින් අනුක්‍රමයෙන් මෙම ගැටලුවට මුහුණ දෙන සියලුම සේවාලාභීන්හට සහනයක් සැලසීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

වතු කම්කරුවන් සඳහා අයවැයෙන් යෝජිත රු. 1,700/-ක වැටුප ලබාදීම සම්බන්ධයෙන් සහ අනෙකුත් කර්මාන්ත (උදා:ඇඟලුම් කර්මාන්තය) සඳහා වන්නා වූ නෛතික රාමුව හා සමාන තත්ත්වය වතුකම්කරුවන්හට ද සකස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සාමූහික ගිවිසුම් වෙනුවට වෙනත් ක්‍රමවේද (outgrower, buyback වැනි) මඟින් සේවකයන් ලෙස හඳුනා ගැනීමක් නොකරන ක්‍රමවේද හේතුවෙන්, පෙර වතු කම්කරුවන්හට තිබූ වරප්‍රසාද කිහිපයක් අහිමි වී තිබෙන බවත් දීර්ඝ කාලීනව ඔවුන්ට තිබූ භුක්තීන් සම්බන්ධයෙන්

ගැටලුවක් පවතී නම් ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම මඟින් ඒ පිළිබඳව සොයා බලා ක්‍රියාකළ හැකි බවත් කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.4 ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අරමුදලේ පසුබිම විමසීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණ, එයින් සේවක අර්ථසාධක අරමුදලට ඇති වූ බලපෑම මෙන්ම එය මහජනයාට බලපාන ආකාරය පිළිබඳව ගරු වසන්ත සමරසිංහ මහතා සහ ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය විසින් විමසීමක් කරන ලදී.

මෙහිදී සේවක අර්ථසාධක අරමුදලට ලබා දෙන පොලි අනුපාතිකය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අරමුදලට ලබා දෙන පොලී අනුපාතිකයේ පවතින විෂමතාවය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් විසින් විමසීමක් කරන ලදී.

1994 වර්ෂයේ සිට සේවක අර්ථසාධක අරමුදලේ සහ මහ බැංකු අරමුදලේ පොලී ගණනය කිරීම් දෙයාකාරයකින් සිදුවන බවත් වාර්ෂික සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයන් මහ බැංකුවේ අරමුදල සඳහා බල පැවැත්වෙන පරිදිත් ලබන ආදායම් මත ගලපනු ලබන පොලී අනුපාතිකය අර්ථසාධක අරමුදල සඳහා ක්‍රියාත්මක වන බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2022/23 වර්ෂවල දී භාණ්ඩාගාර බිල්පත් අගය විශාල වශයෙන් ඉහළ ගිය බවත් උද්ධමන තත්ත්වය මත 2022/23 මෙම අනුපාතිකයන්හි සැලකිය යුතු වෙනසක් සිදුවූ අතර 2023 වර්ෂයේ දී මහ බැංකුව විසින් ගන්නා ලද තීරණයකට අනුව 2024 සිට බලපැවැත්වෙන පරිදි මෙම වෙනස සිදු කර ඇති බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් දැනුම් දෙන ලදී.

පරිපාලන වියදම් සඳහා ලාභයෙන් 1%ක් අය කරනු ලැබීම පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

එසේ 1%ක් යනුවෙන් නිශ්චිත ප්‍රතිශතයක් නොමැති අතර 2023 වර්ෂයේ දී එය 0.49% පමණ වූ බවත් සාමාන්‍යයෙන් 0.49% - 0.67% වැනි අගයන් අතර ප්‍රතිශතයක් පවතින බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් දැනුම් දෙන ලදී.

ඕනෑම මූල්‍ය කළමනාකරණ ආයතනයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම වෙන් කිරීම සිදුකර අදාළ මූල්‍ය වාර්තා සකස් කරන බව ද ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 2.5 කම්කරු නීති ප්‍රතිසංස්කරණය - ගරු සභාපතිතුමා

කම්කරු නීති ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සඳහා මේ වන විට විමර්ශනය කර මූලික කටයුතු සිදුවෙමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කම්කරු නීති ප්‍රතිසංස්කරණය කිරීමේ දී එම යෝජනාවලියේ එකඟ විය නොහැකි ගැටලුසහගත කරුණු කිහිපයක් දක්නට ලැබෙන බවත් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු බවත් ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කාන්තාවන්ගේ සුරැකුම් ශ්‍රමය සම්බන්ධයෙන් ද විශේෂ අවධානය යොමු කරන ලෙස ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙවර අයවැය යෝජනා තුළින් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ නැංවීම සඳහා අවම වැටුප් මට්ටම් ඉහළ නැංවීම ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පනත් සංශෝධනය කිරීමේ වැදගත් බව ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කම්කරු නීති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් මේ වන විටත් සමාලෝචනය කරමින් පවතින බවත් නැවතත් වෙනස්කම් කිරීමට සිදු නොවන, ස්ථිර තත්ත්වයක් ගොඩනැංවීම සඳහා අදාළ නීති නිලධාරීන්ගේ සහය ඇතිව අභ්‍යන්තර කමිටුවක් ද පත්කර ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය සම්බන්ධයෙන් මෙම නීති ප්‍රතිසංස්කරණයේ දී විශේෂ අවධානයක් යොමු කරමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ ඊට අදාළ අනෙකුත් පාර්ශවයන් සම්බන්ධ කර ගනිමින්, පුළුල් ලෙස කමිටුවක් මඟින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපේක්ෂිත බවත් අවම වැටුප් සම්බන්ධව පනත් 02ක් එනම් අවම වැටුප් සම්බන්ධ පනත සහ අයවැය සහන සම්බන්ධයෙන් වන්නා වූ පනතත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් කෙටුම්පත් සම්පාදනය කරමින් සිටින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.6 සේවා ස්ථානවල සිදුවන ප්‍රචණ්ඩත්වය සහ වෘත්තීය රෝග - ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

සේවා ස්ථානවල දී කාන්තාවන්ට සිදුවන හිංසනය මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් වූ නීති සකස් කළ යුතු බවත් ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර පිළිබඳ සම්මුතියේ (C 190) රාමුව හා සමගාමීව කටයුතු කරමින්, පාර්ලිමේන්තුවේ කාන්තා සංසදය සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙරට සේවා ස්ථානවල සිදුවන හිරිහැර සම්බන්ධයෙන් කම්කරු නිලධාරීන්ට මැදිහත් වීමට ප්‍රමාණවත් විධිවිධාන නොමැතිකම සැලකිල්ලට ගනිමින්, කම්කරු දෙපාර්තමේන්තුව සහ රේඛීය අමාත්‍යාංශය මේ වන විට සාකච්ඡා පවත්වා ඇති බවත් අවශ්‍ය පියවර ගැනීම, අන්තර්ගත සාරාංශ කිරීම සහ මූලික කටයුතු අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටින බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වර්තමානයේ දී මෙම තත්ත්වය සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ඍජුවම ක්‍රියා කිරීමේ හැකියාවක් නොමැති නමුත්

යම්කිසි අනාරක්ෂිත තත්ත්වයක් සම්බන්ධයෙන් දැනුවත් වීමක් සිදුවන අවස්ථාවක දී ඒ සඳහා කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා පොලීසියේ සහය ද ලබා ගනිමින් අවශ්‍ය පියවර ගනු ලබන බව කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව පවතින නීතිමය තත්ත්වයන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සැලකිලිමත් වීම වැදගත් සහ එය අවශ්‍යතාවයක්ව පවතින බවත් සේවා ස්ථාන තුළ ඇතිවන වෘත්තීය රෝගී තත්ත්වයන් සහ සේවා ස්ථානයේ දී සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධව පවතින ගැටලු පිළිබඳව නිසියාකාරව ක්‍රියාත්මක විය යුතු අයුරු මේ වන විටත් සාකච්ඡා මට්ටමේ පවතින බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිරියේ දී එම කටයුතු නියාමනය සඳහා අවශ්‍ය පියවර ගනු ලබන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප.ව. 03.05 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 27**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු අනුර කරුණාතිලක මහතා (සභාපති)
ගරු ටී. බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍ය)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු නිමල් පලිහේන මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු දේවානන්ද සුරවීර මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු රවී කරුණානායක මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු කන්දසාමි ප්‍රභු මහතා
ගරු තුරෙරාසා රවිකරන් මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2019 සහ 2021 වර්ෂ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා**
(2024.12.06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2020 සහ 2022 වර්ෂ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.3 2023 වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2024.12.06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.4 2023 වර්ෂය සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2025.02. 06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු අනුර කරුණාතිලක මහතා විසින් 2025 මාර්තු මස 03 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යැයි ද තීරණය කළාය.

ඉදිරියේ දී කාරක සභාව පැවැත්වීමට දින කිහිපයකට පෙර න්‍යාය පත්‍රය, සලකා බැලීමට නියමිත වාර්තා, වට්ස් ඇප් (WhatsApp) ගිණුමක් හරහා ලැබීමට සලස්වන ලෙස ගරු නිමල් පලිහේන මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා ඉදිරියේ දී අවශ්‍ය පියවර ගනු ලබන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා**

**2.1 ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා - යෝජනා අංක 03**

**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අංක DNCWS/EP/AM/0021 යටතේ දෙහිඅත්තකණ්ඩිය, බඹරවාන යන ලිපිනයේ පිහිටි "ගැමුණු ප්‍රජා මූල සංවිධානය" සතු ජලය ගබඩා කිරීමේ ටැංකියෙහි ධාරිතාව අදාළ ප්‍රදේශවාසීන්ගේ පානීය ජල අවශ්‍යතාව සැපිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අමතර ජල ටැංකියක් ඉදිකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ජල ව්‍යාපෘතිය මඟින් පුද්ගලයින් 481 දෙනෙකු පානීය ජල අවශ්‍යතාවන් සපුරා ගන්නා බවත් මෙමඟින් ඉල්ලුම් කරනු ලබන

අමතර ජල ටැංකිය ඉදිකිරීම සඳහා මේ වන විට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරමින් පවතින බවත් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර සති 2 - 3ක් තුළ මෙම කටයුතු අවසන් කළ හැකි බව ද ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**2.2 ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා - යෝජනා අංක 08**

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ පවතින රසායනඥ හෝ රසායනාගාර සහකාර පුරප්පාඩු පිරවීමේ දී බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ශ්‍රම කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන රසායනාගාර සහකාරවරුන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලෙසත්, සේවයේ ස්ථිර කිරීම සඳහා කටයුතු සලසා දෙන ලෙසත් එම සේවක පිරිස විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාව**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු අමාත්‍යතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රසායනඥ පුරප්පාඩු 06ක් සහ රසායනාගාර සහකාර පුරප්පාඩු 07ක් පවතින බවත් බඳවා ගැනීමේ පටිපාටියට අනුව අයදුම්පත් කැඳවූ විට අභ්‍යන්තර බඳවා ගැනීම් 50%ක් සහ බාහිර බඳවා ගැනීම් 50%ක් ලෙස බඳවා ගැනීමට සිදුවන බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අභ්‍යන්තර බඳවා ගැනීම් සිදු කිරීම සඳහා මේ වන විට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති බවත් බාහිරින් සිදු කරන බඳවා ගැනීම් සඳහා මේ වන විට සම්මුඛ පරීක්ෂණ පවත්වන බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

රසායනඥවරු 03ක් සහ රසායනාගාර සහකාරවරු 03ක් පමණක් බඳවා ගැනීමට හැකි බව ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 පිළියන්දල නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම - ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

දීර්ඝ කාලයක් පුරා නගර සංවර්ධන සැලසුම් රට පුරා ක්‍රියාත්මක කරනු ලැබුව ද එම ව්‍යාපෘති අතරමඟ නැවතීම සහ එසේ අක්‍රමවත් ලෙස අඩක් නිම කරන ලද ව්‍යාපෘතීන් මඟින් ජනතාව අපහසුතාවයට පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පිළියන්දල නගර සංවර්ධන සැලැස්මේ එක් කොටසක් වශයෙන් බස් නැවතුම්පොළ නගරයෙන් මදක් දුරින් වෙනත් ස්ථානයක ස්ථාපිත කළ ද එහි පිහිටීම ජනතාව අපහසුතාවයට පත්වීමට හේතු වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ දී මේ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කළ බවත් නගර සැලසුමේ කිසිදු ගැටලුවක් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ප්‍රමුඛතාවය මත පදනම්ව මෙහි ඉදිරි වැඩපිළිවෙළ, ඒ සඳහා ගත වන කාලය සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සාමාන්‍යයෙන් වර්ෂ 05 - 10ක් වැනි නිශ්චිත කාලයකට නගර සංවර්ධන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීමෙන් පසු විවිධ අංශ ආවරණය කරමින් ආයතන රැසක් ඒකරාශි වී එම සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු බවත් මෙහිදී නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යභාරය වනුයේ නාගරික සංවර්ධන සැලසුම සකස් කර ඉදිරිපත් කිරීම බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිරියේ දී එකී අයුරින් නාගරික සංවර්ධන අධිකාරිය මෙම සැලසුම් සකස් කරන බවත් අදාළ අනෙකුත් රාජ්‍ය ආයතනය සියල්ල එම සැලසුමට අනුගතව රේඛීය අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පිළියන්දල නව නගර සැලැස්මට අනුව එහි පළමු අදියර ලෙස බස් නැවතුම්පොළ නගරයට මදක් දුරින් ඉදිකරනු ලැබුවේ නගරය තුළ පවතින අධික තදබදය අවම කිරීමේ අරමුණින් බවත් මේ හා සමගාමීව නගරයේ ඉඩම් 02ක් යොදා ගනිමින් වෙළෙඳපොළ ගොඩනැගිල්ල එක් ඉඩමක ස්ථාපිත කිරීමට හා අනෙක් ඉඩම රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් සහිත ආයෝජනයක් සඳහා යොදවා ඉන් ලබන ආදායම නගර සංවර්ධන කටයුතු සඳහා යෙදවීම අරමුණ වූ බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.2 ගරු ෆස්මින් ෂරීෆ් මහතා

### 3.2.1 ගම්පොළ නගර සභා සීමාවේ දුම්රිය මාර්ගය අසළ ඉඩම

නාගරික සංවර්ධන අධිකාරිය සතු ගම්පොළ දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටා ඇති ඉඩම දීර්ඝ කාලයක් පුරා කිසිඳු ඵලදායි කාර්යකට යොදා නොගැනීම සම්බන්ධයෙන් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නගරයේ ඇති සීමිත ඉඩකඩ හමුවේ එය යම්කිසි සංවර්ධන ක්‍රියාවලියක් සඳහා යොදා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු මෙකී ඉඩම දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීමට යටත්ව සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ ද දැනට බදු දීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම සහ පවරා

ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් එහි රාජ්‍ය සහ පෞද්ගලික අංශ ඒකාබද්ධ වාණිජ කටයුත්තක් ආරම්භ කිරීමට නොහැකි වී තිබෙන බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙකී ඉඩමේ අබලන්ව තිබූ ගොඩනැගිල්ල ඉවත් කර පිවිසීම් මාර්ගයක් ද සහිතව රේඛීය අමාත්‍යාංශය, නගර සැලසුම් ප්‍රතිපාදන ඔස්සේ අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කළ බවත් දීර්ඝකාලීන බදු පදනම මත පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අනුමතිය ලබා ගෙන ඇතත් ඒ පිළිබඳ නිසි ප්‍රතිචාරයක් නොමැති බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 3.2.2 කුඹුරු ඉඩම් ගොඩ කිරීම

ගම්පොළ බෝතලපිටිය නගර සීමාව තුළ පිහිටා ඇති ගොඩකළ හැකි ඉඩම් නීත්‍යානුකූල නොවන අන්දමින් විවිධ ව්‍යාපාර කටයුතුවලට යොදා ගන්නා බවත් රජය මැදිහත් වී සංවර්ධනය කළ හැකි ඉඩම් වැඩිදියුණු කර ආයෝජනයන්ට ලබා දෙන්නේ නම් ඒ ආයෝජන ඔස්සේ ආදායම් උත්පාදන මාර්ග විවෘත වනු ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහිදී, කුඹුරු ඉඩම් සම්බන්ධ වගකීම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතට අයත් වන බැවින් ඒ පිළිබඳ එම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී සාකච්ඡා කළ යුතු බවත් නගරයේ ජල ගැලීම් පාලනයට, ජලය බැස යාමට ආදී අත්‍යවශ්‍ය කටයුතු සඳහා ඇතැම් ඉඩම් පවත්වා ගෙන යන අතර රජය හුදෙක් ආදායම් ඉපැයීමේ අරමුණේ රැඳී නොසිටින බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යම් පාර්ශවයක් විසින් මෙම ඉඩම් ගොඩ කර කිසියම් ව්‍යාපෘතියක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම් මූලිකව ආයතන 13ක පමණ (මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, යනාදී) නිර්දේශය ලබාගත යුතු බවත් පදිංචිය වැනි අත්‍යවශ්‍ය කටයුතු සඳහා පර්චස් 20ක උපරිමයකට යටත්ව ඉඩම් ලබාදීමට සිදුවන අතර අනවසර ඉදිකිරීම් සිදු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වී වගාව හැර වෙනත් කටයුත්තක් සඳහා කුඹුරු ඉඩම් යොදා ගන්නේ නම් අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදයක් පවතින බවත් එහිදී අදාළ ආයතනවල අනුමතිය සහ විධිමත් ජලාපවහන අධ්‍යයනයක් කිරීමෙන් පසු, එකී කරුණු සපුරා තිබේ නම් පමණක් අනුමතිය ලබාදෙන බවත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැතහොත් එය නීත්‍යානුකූල නොවන සංවර්ධනයක් වන බව ද ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති) විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉඩම්වල අවිධිමත් ගොඩකිරීම් නැවැත්වීම නියාමනය සඳහා ඉඩම් සංවර්ධන පනතට අනුව ගැසට් කරන ලද කමිටුවක් ඇති බවත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරීගේ සභාපතීත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ආදී අනෙකුත් අදාළ ආයතනයවල නියෝජිත නිලධාරීන් ද සහභාගීත්වයෙන් පැවැත්වෙන මෙම කමිටුව මඟින් නිර්දේශ ලබාදෙන බවත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එකී ක්‍රියාමාර්ග අනුගමනය කරමින් යම් නිශ්චිත ඉඩමක් සංවර්ධන කටයුත්තක් සඳහා යොදා ගෙන තිබේ ද යන්න පරීක්ෂා කර බලා ඒ පිළිබඳව තොරතුරු ලිඛිතව මෙම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් එවිට ඒ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.2.3 ගම්පොළ සහිරා විදුහල අසල වැඩ අවසන් කර නොමැති මාර්ගය

ගම්පොළ සහිරා විදුහල අසලින් නගරයට ප්‍රවේශ වීම සඳහා මාර්ගයක් ඉදිකර ඇති නමුත් එය නිමකර නොමැති බැවින් මේ පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.2.4 ගම්පොළ නගරයේ ජල ගැටලුව

ගම්පොළ නගරයේ ජනතාව විශාල ජල ගැටලුවකට මුහුණ දී ඇති බවත් මූලිකවම නිල්ලඹේ වේල්ල ආසන්න ජනතාව අති දුෂ්කර තත්ත්වයකට මුහුණ දී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලුවට විසඳුමක් ලෙස මහවැලි ගඟේ ජලය යොදා ගනිමින් ඝන මීටර 20,000ක පමණ ජල ධාරිතාවක් තිබෙන ජල යෝජනා ක්‍රමයක් ඔස්සේ ජයමාලපුර ඉහළ කෝරලයේ ව්‍යාපෘතියක් යෝජිතව පවතින බවත් ඒ සඳහා රු. බිලියන 10ක පමණ මුදලක් ඇස්තමේන්තු කර ඇති බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට ඒ සඳහා ඉදිරි කටයුතු සැලසුම් කරමින් සිටින බව ද ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 3.3 නගර සංවර්ධන සැලැස්ම පිළිබඳව වැඩිදුර විමසීම - ගරු රුවන්තිලක ජයකොඩි මහතා

මෙහිදී සාකච්ඡාවට ගත් කරුණු සැලකීමේ දී ඒ ඒ ප්‍රදේශවලට අදාළ වසර 5කට හෝ 10කට සකස් කරන ලද නිශ්චිත සැලැස්මක් තිබේ ද යන්න සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට ගැසට් කරන ලද සැලසුම් 52ක් සහ තවත් කෙටුම්පත් කළ සැලසුම් අනෙකුත් පළාත් පාලන ආයතනවලටත් සකස්කොට තිබෙන බවත් ඒ අනුව අදාළ සංවර්ධන කටයුතු සඳහා අනුමතිය ලබා දෙන බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙකී දළ සැලැස්ම පිළිබඳව ප්‍රදේශයේ සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් වීම මඟින් සාකච්ඡාවට ලක් වූ ගැටලු විසඳෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එකී කාරණය පවත්නා ක්‍රියාවලිය තුළ අන්තර්ගත බවත් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන්හට එම සැලැස්ම යොමු කර විරෝධය දැක්වීමට ජනතාවට දින 60ක් ලබා දීමෙන් පසු අවසානයේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ හා ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමතිය ලබාගෙන ගැසට් කරන බවත් නාගරික සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ පළාත් පාලන ආයතනවල දිස්ත්‍රික් සංවර්ධන කමිටු සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටු සඳහා සම්බන්ධීකරණ අධ්‍යක්ෂකවරුන් සිටින බවත් එම නිලධාරීන් හා සම්බන්ධීකරණ කටයුතු සිදු කර එම කමිටුවලට සම්බන්ධ විය හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේ දී සඳහා සම්බන්ධ වූ අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දුන් පරිදි වත්තල ප්‍රදේශය සම්බන්ධව සිදු කළ සාකච්ඡාව අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ටම මෙම සැලැස්ම ලබා දී කොටස් වශයෙන් එම සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබන බව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශාල සම්පත් ප්‍රමාණයක් යොදා ගනිමින් සකස් කරනු ලබන මෙකී සැලසුම්වලට අනුව පමණක් නිශ්චිත ලෙසටම මින් ඉදිරියට කටයුතු කිරීමටත් වෙනත් කිසිඳු හේතුවක් මත ඉන් අපගමනය නොවී සියලුම නිලධාරීන් සහ මහජන නියෝජිතයින් කටයුතු කළ යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

### 3.4 සෞදි අරාබි රජයේ අනුග්‍රහය සහිතව ඉදිකරන ලද නිවාස - ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා

සෞදි අරාබි රජයේ අනුග්‍රහය සහිතව අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නොරොච්චෝලෙ නගරයේ ඉදිකරන ලද සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමි වූ පවුල් සඳහා ලබා දෙන නිවාස 500 ව්‍යාපෘතියේ මේ දක්වා ජනතා අයිතියට පත්කර නොමැති නිවාස, සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමි වූ පවුල් සඳහා ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙය දිස්ත්‍රික් ලේකම්වරයා සෘජුවම මැදිහත් වූ ව්‍යාපෘතියක් බැවින් සහ අමාත්‍යාංශයේ විෂය පථයෙන් පරිබාහිර බැවින්, දිස්ත්‍රික් ලේකම්වරයා සම්බන්ධ කර ගැනීමෙන් එකී ගැටලුව විසඳීමේ හැකියාව පවතින බව

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙකී ගැටලුව දිස්ත්‍රික් කමිටුවේ දී අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා සමඟ සාකච්ඡා කර විසඳා ගැනීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.5 මඩකලපුව දිස්ත්‍රික්කයේ ජල හිඟය - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රමාණවත් ජල සැපයුමක් නොපවතින බවත් නියං කාලයේ දී ජනතාව මහත් අපහසුතාවයට පත් වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය සතුව අනාගතයේ දී ඇති විය හැකි ජල ගැටලු සඳහා යම් විකල්ප ව්‍යාපෘතියක් හෝ විකල්ප ස්ථිර විසඳුමක් පවතී ද යන්න සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මඩකලපුව දිස්ත්‍රික්කයේ ජල සැපයුම් සේවා ආවරණය (Water Supply Service Coverage) සහ ජල නළ ආවරණය (Pipeline Coverage) සම්බන්ධව සහ මෙම වසරේ දී මඩකලපුව දිස්ත්‍රික්කය තුළ සිදු කරනු ලබන නව ව්‍යාපෘති සම්බන්ධව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ප්‍රමාණවත් ජල සැපයුමක් නොමැති වීමේ ගැටලුව සම්බන්ධයෙන් මීට පෙර අවශ්‍ය යෝජනා ලබාගෙන ප්‍රසම්පාදන කැඳවා තිබිය දී මෙරට හටගත් ආර්ථික පසුබෑසීම හේතුවෙන් එකී කටයුතු ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් හට ගත් බව ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට මඩකලපුව ප්‍රදේශයේ භූගත ජලය ද දූෂණය වී ඇති බැවින් මේ සම්බන්ධව කඩිනම් විසඳුමක් ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මඩකලපුව දිස්ත්‍රික්කයේ උන්නිච්චෙයි ප්‍රදේශයේ පවතින ජල ගැටලුව හේතුවෙන් නියං කාලයේ දී ප්‍රාදේශීය සභාවෙන් පමණක් ජනතාව වෙත නොකඩවා ජලය ලබාදෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

“කිතුල්රුගම්” ව්‍යාපෘතිය තුළින් මේ සඳහා යම් විසඳුමක් ලබාදීමේ හැකියාවක් පවතී ද යන්න සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විටත් යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති සඳහා සැලකිය යුතු ඇස්තමේන්තුවක් පවතින නමුත් මෙම වර්ෂය තුළ නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදිය නොහැකි බැවින් මීළඟ වර්ෂයේ දී ඒ පිළිබඳව සලකා බැලිය හැකි බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති තුළ රඳෙමින් මෙම ගැටලුව විසඳීමේ හැකියාවක් පවතී ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙන් විමසීමක් කරන ලදී.

දැනට ඝනමීටර 5,000ක ජල ධාරිතාවයක් පවතින බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කර ඉදිරියේ දී අවශ්‍ය කටයුතු කිරීමේ හැකියාවක් පවතින බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.6 දික්වැල්ල ප්‍රදේශයේ වාර්ෂිකව ඇතිවන ගංවතුර - ගරු අර්කම් ඉල්යාස් මහතා**

දික්වැල්ල, වැවුරුකන්නල සහ බෙරුවල ප්‍රදේශයේ වාර්ෂිකව ඇතිවන ගංවතුර ගැටලුව සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සංවර්ධන සැලැස්මට අනුව කටයුතු කිරීමේ දී ඔවුන් සතුව තාක්ෂණික කාර්යමණ්ඩලයක් නොමැති බැවින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහාය ලබා ගැනීමට හැකියාවක් තිබේ ද යන්න පිළිබඳව සොයා බැලූ බවත් නාගරික සංවර්ධන අධිකාරිය සතුව ගෘහ නිර්මාණ සැලැස්ම පමණක් පවතින අතර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉංජිනේරු සැලැස්ම සකස් කිරීමට පමණක් රු. මිලියන 6ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අයවැය ප්‍රතිපාදන මඟින් මාතර දිස්ත්‍රික්කයටම වෙන් වූ මුදල රු. මිලියන 4ක් වන අතර එමඟින් මෙය ආවරණය කිරීමට නොහැකි බැවින් අවශ්‍ය ප්‍රතිපාදන කෙසේ සම්පාදනය කරගත යුතු ද, එසේ නැතහොත් නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍ය තාක්ෂණික නිලධාරීන් බඳවා ගෙන ඔවුන් හරහා මෙම කටයුත්ත සිදු කළ හැකි ද යන විකල්පයන් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ ඒකාබද්ධව මෙම ගැටලුවට සම්බන්ධ ඉඩම පරීක්ෂා කර යෝජනාවක් සකස් කළ අතර එය ක්‍රියාත්මක කිරීමට නම් පළමුව ජලාපවහන සැලැස්ම සම්පූර්ණ කළ යුතු බවත් ජලාපවහනයට අදාළ එම ඉංජිනේරු සැලැස්ම සකස් කිරීමේ හැකියාව තම ආයතනය සතු නොවන බැවින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ඉල්ලීමක් සිදු කරන ලද බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජලාපවහන සැලැස්මක් සකස් කළ පසු එමඟින් සැකසෙන ඉඩම් යොදාගෙන මුදල් උපයාගෙන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතී ද යන්න පිළිබඳව පරීක්ෂා කළ යුතු බව ද නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මීට අදාළ ගෘහ නිර්මාණ සැලැස්ම (Architect Plan) සකස් කළ බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙහිදී ආයතන අතර යහපත් සම්බන්ධීකරණයක් නොපවතින බවත් මෙම කටයුතු කිසියම් එක් ආයතනයක් ඔස්සේ සිදු කර ගැනීමට හැකි නම් එය පහසුවක් වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපාදන වෙන්කිරීම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදු වේ නම් එම කටයුතු ඉටුකිරීමට නාගරික සංවර්ධන අධිකාරිය හරහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට උපදේශනය සැපයිය හැකි බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ස්වයං උත්පාදන ආයතනයක් වන අතර ඔවුන්ගේ සීමාව තුළ පමණක් කටයුතු කිරීමේ හැකියාව පවතින බැවින්, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හරහා හෝ අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමට හැකියාව පවතී ද යන්න සහ අවම වශයෙන් මූලික වියදම් පියවා ගැනීමේ හැකියාව පවතී ද යන්න පිළිබඳව සාකච්ඡා කළ යුතු බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කටයුත්ත සඳහා ලද ඇස්තමේන්තු වාර්තා අනුව සමීක්ෂණ පිරිවැය අධික වීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරන ලදුව එම කටයුත්ත නිසියාකාරව සිදුකිරීමේ මූලික අවශ්‍යතාවය පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අතිරේක සාමාන්‍යාධිකාරී (සැලසුම් හා නිර්මාණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහිදී සමීක්ෂණය තුළින් ලබා ගනු ලබන නිරවද්‍ය දත්ත විකල්ප මාර්ගයක් තුළින් ලබා ගත හැකි වුවහොත් එම පිරිවැය කපාහළ හැකි බවත් මෙහි ක්ෂේත්‍ර පරීක්ෂණ දත්ත රැස් කිරීම සඳහා රු. මිලියන 1.6 මුදලක් වෙන් කර ඇති බවත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අතිරේක සාමාන්‍යාධිකාරී (සැලසුම් හා නිර්මාණ) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඇස්තමේන්තුගත රු. මිලියන 06ක පිරිවැය තුළ සමීක්ෂණ පිරිවැය අන්තර්ගතව නොමැති බවත් තමන් විසින් එම කටයුතු සිදු කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වා, අවම පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් දිස්ත්‍රික් විශේෂ ව්‍යාපෘති සඳහා යොදවා ඇති මුදල් මඟින් මෙම කාර්ය සඳහා මුදල් ප්‍රමාණයක් වෙන්කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

## 3.7 ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

### 3.7.1 පේරාරු ජල ව්‍යාපෘතිය

වවුනියාව පේරාරු ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එම ප්‍රදේශවාසීන් සතුට පළ කළ ද එහි වෙසෙන ගොවි ජනතාව මෙමගින් පීඩා විඳින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් කුඹුරු ඉඩම් රාශියක් අහිමි වී ඇති බවත් ඒ වෙනුවෙන් ලබා දුන් විකල්ප ඉඩම් සඳහා මේ වනතෙක් ඔප්පු ලබා දී නොමැති බවත් කැළෑ එළිකර ගොවිතැන් සඳහා ලබා දුන් එකී ඉඩම් තුළ වගාකිරීම දුෂ්කර වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය අවසන් වී වර්ෂ 12ක් ගතවුව ද මේ පිළිබඳව කිසිදු විසඳුමක් නොලැබුණු බැවින් මේ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පැවති අධික වර්ෂාව හේතුවෙන් මෙවර පමණක් යහපත් අස්වැන්නක් ලබා ගැනීමට ගොවීන්ට හැකි වූ බවත් නව ඉඩම් සඳහා නිසි වාරිමාර්ග සැලැස්මක් සකස් කර නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා කමිටුවක් පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

සැලසුම් කළ පරිදි ත්‍රෛපාර්ශ්වික ගිවිසුම (ගොවි ප්‍රජාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය) මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බැවින් මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එකී ජල ව්‍යාපෘතිය සාර්ථකව නිම කළ බවත් රජයේ නියෝජිත කාර්යාල ඔස්සේ ගොවි ජනතාව වෙත ඉඩම් ඔප්පු ලබාදීම මේ වන විට ආරම්භ කර ඇති බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය වන අරමුදල් තම අමාත්‍යාංශය මගින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වෙත මේ වන විටත් ලබා දී ඇති බවත් එම මුදල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ගොවි ප්‍රජාව වෙත ලබාදීමට කටයුතු කරන බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තම අමාත්‍යාංශය හරහා සිදු කළ යුතු වැඩකටයුතු මේ වන විටත් අවසන් කොට අනෙකුත් වගකිවයුතු ආයතන සඳහා යොමු කර ඇති බැවින්, යම්කිසි ප්‍රමාද වීමක් සිදුවන්නේ නම් එකී ආයතන ඔස්සේ කටයුතු සම්පාදනය විය යුතු බව ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

රැකියා ලබා දීම සඳහා ගිවිසුමක් අත්සන් කළ ද රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් නව බඳවා ගැනීම් සිදු නොකිරීමට ගෙන ඇති තීරණයට අනුව එම බඳවාගැනීම් සිදු කිරීමට නොහැකි බව ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ජල ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වුව ද, අනෙකුත් ඉදිරි වැඩ කටයුතු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ඔස්සේ සිදුවන බවත් මේ

සම්බන්ධයෙන් තම අමාත්‍යාංශය හරහා යම්කිසි කාර්යයක් සිදු කිරීමට ඇත්නම් ඒ පිළිබඳව වැඩිදුරටත් සොයා බලා අමාත්‍යාංශ ලේකම් විසින් අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.7.2 මහරම්බයිකුලම් - වවුනියා ප්‍රජා ජල ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද මහරම්බයිකුලම් - වවුනියා ප්‍රජා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර මාස 02කට පසු අත්හැර දමා ඇති බවත් ජලය නොමැතිව එහි ජනතාව පීඩා විඳින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන විනාශ වී යාමට ඉඩ නොදී නැවතත් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට මුල් වූ හේතුව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

භූගත ජල සැපයුම් ප්‍රභවයන් යොදා ගනිමින් මෙම ජල ව්‍යාපෘතිය ස්ථාපිත කළ බවත් පසුකාලීනව එම ජලය අපවිත්‍ර වීම නිසා භාවිතයට නොගැනීම හේතුවෙන් මේ වන විට සමස්ත ව්‍යාපෘතියම පරිහානියට පත් වී ඇති බවත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුර) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණු පිළිබඳව සැලකිලිමත් වීමේ දී එම ව්‍යාපෘතියට පෙර ශක්‍යතා අධ්‍යයනයක් (feasibility study) නිසියාකාරව සිදු වී නොමැති බව පෙනී යන බවත් මේ වෙනුවෙන් විකල්ප විසඳුමක් සොයා බැලීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයක් සහිත වැඩසටහන් ක්‍රියාත්මක කර මෙම ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දීමට ඇති හැකියාව සම්බන්ධව ගරු රවී කරුණානායක මහතා විසින් විමසීමක් කරන ලදී.

එවැනි ව්‍යාපෘතිවල බලශක්ති පිරිවැය සම්න්ධව සැලකිය යුතු බවත් වෙනත් කිසිඳු විකල්පයක් නොමැති නම් මුහුදු ජලය භාවිත කර පානීය ජලය සකස් කිරීම සම්බන්ධව අවධානය යොමු කළ හැකි බවත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයෙන් ව්‍යාපෘතියක් ආරම්භ කළහොත් පවතින ජල ඒකක ගාස්තුව පවත්වාගෙන යා නොහැකි බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.8 මහල් නිවාස ආශ්‍රිත ගැටලු - ගරු රවී කරුණානායක මහතා

කොළඹ මෝදර තට්ටු නිවාස සංකීර්ණවල පවතින විදුලි සෝපාන අබලන් වීම හේතුවෙන් එම නිවාස සංකීර්ණවල වෙසෙන ජනතාව දැඩි අපහසුතාවයට පත්ව සිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විදුලි සෝපාන අලුත්වැඩියා කිරීම ඇතුළු මහල් නිවාස නඩත්තු කිරීම සඳහා රු. මිලියන 1,250ක මුදලක් මෙවර අයවැයෙන් වෙන්කළ බවත් කොළඹ නගරය අවට මහල් නිවාස සංකීර්ණවල පවතින ගැටලු නිරාකරණය කිරීම මෙහි අරමුණ බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහල් නිවාස නඩත්තු කිරීම සම්බන්ධ අනිසි භාවිතයන් අඩු කිරීම සඳහා එහි නඩත්තු කටයුතු රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය ඔස්සේ සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙතෙක් සභාධිපත්‍ය කමිටුව (Condominium Committee) ස්ථාපිත කර ගැනීමට නොහැකි වී ඇති බවත් හිමිකාරිත්වය සම්බන්ධයෙන් ද ගැටලු පවතින බැවින් ඉඩම් පැවරීමේ, ඔප්පු ලබා දීමේ ගැටලු 80%ක් පමණ නිරාකරණය කිරීමට ඇති අතර නිවැසියන්ගෙන් 60%ක් පමණ දීර්ඝ කාලීනව බදු නොගෙවීම වැනි ගැටලු පවතින බැවින් මෙම ගැටලු විසඳීමට මේ වන විට සාකච්ඡා පවත්වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිවාස ලබා දීම සහ ඔප්පු ලබා දීම කඩිනම් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව සම්බන්ධයෙන් වැඩිදුර අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.9 පුනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පුනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන කටයුතු සඳහා පසුගිය වර්ෂයේ අයවැයෙන් රු. මිලියන 500ක් වෙන් කෙරුණු බවත් ඒ සම්බන්ධයෙන් සියලු රාජකාරිමය ලේඛන කටයුතු සිදුවී තිබුණ ද නැවතත් එම මුදල් ආපසු හරවා යැවීම හේතුවෙන් සැලසුම් කළ පරිදි සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නොහැකි වූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවැනි ගැටලුවක් ඇති වීමට හේතු වූ කරුණු සම්බන්ධව සහ පුනරින් සංවර්ධන කටයුතු සැලසුම් කළ අයුරින් සිදු නොවීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පුනරින් සංවර්ධනය සඳහා 2024 වර්ෂය අවසාන කාලසීමාවේ දී ප්‍රතිපාදන වෙන්කර තිබූ බවත් එම අවස්ථාවේ දී හඳුනාගත් ව්‍යාපෘති නොතිබුණු බැවින් මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතනවලට එම ප්‍රතිපාදන වෙන් කිරීමට

කටයුතු කරන ලෙස සැලසුම් කළ ද අදාළ අනුමතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති වීමෙන් මෙම තත්ත්වයට මුහුණදීමට සිදු වූ බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

2024 වර්ෂයේ දී අදාළ ව්‍යාපෘති ආරම්භ නොවූ බවත් මෙම වර්ෂයේ ප්‍රතිපාදන ලබාදීමට අපහසු බවත් නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප 2) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවර අයවැයෙන් ද ප්‍රතිපාදන ලබා දීමේ හැකියාවක් නොමැති බවත් 2026 වර්ෂයේ අයවැයේ දී නැවතත් මේ පිළිබඳව කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප 2) විසින් දැනුම් දෙන ලදී.

## 3.10 ගරු දේවානන්ද සුරවීර මහතා

### 3.10.1 සංවර්ධන සැලැසුම් නිසි ක්‍රමවේදයක් ඔස්සේ සිදු කිරීම

සැලසුම් සකස් කිරීම යහපත් මට්ටමක පවතින අතර එම සැලසුම්වලට අදාළ කාලවකවානු, අරමුදල් සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම ආදිය ද නිසි ක්‍රමවේදයක් ඔස්සේ පෙළගැසීමේ අවශ්‍යතාවයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහරගම නගරය තුළ සියලු ආයතන ඒකාබද්ධව මෙකී අන්දමින් සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදුවන ආකාරය පැහැදිලි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සංවර්ධන සැලැස්මේ දී මූලිකව ව්‍යාපෘති ඉදිරිපත් කිරීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම වැදගත් වන බවත් මේ ඔස්සේ කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දීර්ඝ කාලින සැලසුම් හඳුනාගනිමින් අදාළ පළාත් පාලන ආයතනවලට වැඩි වගකීමක් පවරමින් සැලසුම් ක්‍රියාත්මක වීම සිදුවන බවත් නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප 2) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නගර සභාව විසින් සිදුකරනු ලබන පොදු පහසුකම් සැපයීමට යටත්ව නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් පහසුකම් සපයන ආයතන ද ඒකාබද්ධව අදාළ අරමුදල මත පදනම්ව ක්‍රියාත්මක වන බව නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් කලාප 2) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන සැලැස්මට අනුව එකී ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමේ එකඟත්වය මත මෙම නාගරික සැලසුම් සකස් කිරීම සිදුවන බවත් දිස්ත්‍රික් සංවර්ධන කමිටු සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටු විසින් අදාළ ආයතන හා සම්බන්ධ වී තම දායකත්වයත් නිසියාකාරව ලබා දෙමින් ක්‍රියාත්මක විය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු අර්කම් ඉල්යාස් මහතා ද මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් පළ කරන ලදී.

### 3.10.2 නිවාස සංවර්ධන අධිකාරිය යටතේ පවත්වාගෙන යනු ලබන නිවාස සංකීර්ණ

මෙම නිවාස සංකීර්ණ ඉතා අබලන්ව කිසිඳු නඩත්තුවක් සිදු නොකර කාලයක් පුරා පවතින බවත් රාහුලපුර නිවාස යෝජනා ක්‍රමය උදාහරණයක් ලෙස දැක්විය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පදිංචිකරුවන් හට තවමත් ඔප්පු ලබා දී නොමැති වීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඔප්පු ලබාදීම මේ වන විට සිදු කෙරෙමින් පවතින බවත් 1979 සිට පවරාගත් ඉඩම් නැවත පැවරීම මේ වන විටත් සම්පූර්ණයෙන් සිදුවී නොමැති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ආදී ආයතන සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත් මේ වන විට රජයේ ඉඩම් පවරා දීමේ දී ඇති වූ ගැටලු නිරාකරණය කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ පවත්නා ඉඩම් සම්බන්ධව තවදුරටත් ගැටලුකාරී තත්ත්වයන් පවතින බවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ මහවැලි අධිකාරිය මගින් අවිධිමත් ලෙස ඉඩම් බැහැර කිරීම් සිදුකර තිබීම නිසා 2022 වර්ෂයේ දී නිකුත් කරන ලද චක්‍රලේඛයක් මගින් ඉඩම් බැහැර කිරීම නැවැත්වූ බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවත් එකම ඉඩම් සඳහා ඔප්පු ලබා දී ඇති බැවින් නැවත එම ඉඩම් මැනීම් සිදුවන බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ වනතෙක් සභාධිපත්‍ය කමිටුව (Condominium Committee) ස්ථාපිත කර ගැනීමට නොහැකි වූ බවත් රාහුලපුර නිවාස යෝජනා ක්‍රමයේ ඔප්පු ලබාදීමේ ගැටලුවක් පවතින බැවින් යටිතල පහසුකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පවතින අභ්‍යන්තර ප්‍රතිපාදන තුළින් මෙම ගැටලුව යම්තාක් දුරකට නිරාකරණය කළ හැකි බව ද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

මෙම නිවාස සංකීර්ණ අබලන් වීමට මූලික වශයෙන් එහි සිදු වී ඇති අනවසර ඉදිකිරීම් දැක්විය හැකි බවත් එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට ගියහොත් වෙනත් සමාජයීය ගැටලුවලට මුහුණ දීමට සිදුවන බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පවත්නා කාණු පද්ධතිය අලුත්වැඩියා කරදීම සහ මලාපවාහන පද්ධතිය ආශ්‍රිත කටයුතු ගිවිසුම්ගත පරිදි සිදුකළ යුතු බවත් පදිංචිකරුවන් විසින් අදාළ ගෙවීම් නිසියාකාරයෙන් සිදුකර තිබීම වැදගත් බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පසුගිය වර්ෂයේ දී රු. මිලියන 502ක් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කළ අතර ඉන් රු. මිලියන 250ක් ලැබුණු බවත් මෙම ගැටලු හේතුවෙන් ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවක් කිරීමෙන් අනතුරුව තවත් රු. මිලියන 1,000ක් මෙම නඩත්තු කටයුතු සඳහා ලද බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහිදී හඳුනාගත් අත්‍යාවශ්‍ය කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් මෙම නඩත්තු කටයුතු සිදු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.11 මඩකලපුව දිස්ත්‍රික්කයේ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය - ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

නිවාස සංවර්ධන අධිකාරය විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලැබූ නිවාස සංවර්ධන ව්‍යාපෘතියේ 2/3ක් සම්පූර්ණ කළ නමුත් ඉතිරි නිවාස 200 - 300 පමණ ප්‍රමාණයක් සම්පූර්ණ නොකර පැවතීම විශාල සම්පත් නාස්තියක් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය වර්ෂ 05 තුළ දී මේ සම්බන්ධයෙන් කිසිඳු සංවර්ධනයක් සිදු නොවූ බවත් වෙනත් නිවාස සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් අවට සිදුවූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කඩිනමින් මෙම කටයුතු සිදුකර නිවාස නොමැති පුද්ගලයින් හට නිවාස ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මඩකලපුව නගරයේ කාණු පද්ධතිය ඉතාම දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් වැසි සමයේ දී ගංවතුර ඇතිවීම නොවැළැක්විය හැකි බැවින් මේ සම්බන්ධයෙන් කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට මූලික හේතුව ප්‍රතිපාදන නොමැති වීම බවත් අමාත්‍ය මණ්ඩල අනුමතියක් සහිතව වර්ෂ 03ක් ඇතුළත කොටස් වශයෙන් මෙම කටයුතු අවසන් කිරීම සඳහා සැලසුම් කර කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් ඇති බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමතිය ලද මුළු මුදල එක්වර නොලැබුණු අතර ඉන් 1/3 බැගින් වාර 3ක දී ලැබෙන බවත් ප්‍රතිපාදන ලැබෙන අයුරින් දිවයින පුරා සංවර්ධන කටයුතු අඛණ්ඩව වශයෙන් මේ වන විට සිදුකරමින් පවතින බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

දිවයින පුරා පවතින නඩත්තු කටයුතු සංඛ්‍යාව 47,000ට අධික බවත් ඒ සඳහා රු. බිලියන 15ක පමණ අරමුදල් අවශ්‍ය බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම නිවාස සංවර්ධන ව්‍යාපෘතිය හා අවතැන්වූවන් සඳහා සිදුකරන නිවාස සංවර්ධන ව්‍යාපෘතිය අතර සම්බන්ධයක් පවතින්නේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

එය වෙනත් ව්‍යාපෘතියක් බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහිදී නියත වශයෙන්ම නිවාස ලැබියයුත්තන් සඳහා මෙම නිවාස ලැබී තිබේ ද යන්න පිළිබඳව සැලකිලිමත් වන බවත් කෙටි කාලයක් තුළ මෙම ගැටලු විසඳීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.12 ප්‍රාදේශීය සංවර්ධන කමිටු නියෝජනය - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා

ප්‍රාදේශීය සංවර්ධන කමිටු සඳහා නියෝජිතයින් යොමු කිරීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය නියෝජනය කිරීම සඳහා වගකිවයුතු නිලධාරියකු සම්බන්ධ කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නගර සංවර්ධන සැලැස්මට අනුව පමණක් අදාළ සියලුම ඉදිකිරීම් සිදු කළ යුතු බවත් ඉන් බැහැර කිසිඳු නීත්‍යානුකුල නොවන කටයුත්තකට අවස්ථාවක් නොදීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

එකම දිනයේ ප්‍රාදේශීය සංවර්ධන කමිටු කිහිපයක් යෙදුණු අවස්ථාවක දී ප්‍රායෝගිකව ගැටලු ඇතිවන බවත් අදාළ කමිටුවට වගකිවයුතු නිලධාරියකු සහභාගි කරවීම සඳහා හැකි උපරිමයෙන් වගබලා ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.13 අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවතින ගැටලු - ගරු නිමල් පලිහේන මහතා

ආයතන අතර අන්තර් සම්බන්ධතාවය අඩුවීම හේතුවෙන් ගැටලු ඇති වී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, යම්කිසි ව්‍යාපෘතියක් සඳහා මුදල් වෙන් කිරීම සහ ව්‍යාපෘතිය අවසන් කිරීමේ දින අතර ඉතා සීමාසහිත කාලයක් පමණක් පැවතීම හේතුවෙන් ගැටලු මතුවන ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මින් ඉදිරියට එවැනි සිදුවීම් සිදු නොවන බවත් අයවැය යෝජනාවල තිබූ මුදලත්, අයවැය කතාව තුළ වූ ප්‍රතිපාදන වෙන් කිරීමත් පූර්ණ වශයෙන් අදාළ සංවර්ධන කටයුතු සඳහා යොදා ගනිමින් හඳුනාගත් සියලු ව්‍යාපෘතිවල වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා මේ වන විටත් සැලසුම් සූදානම් කර තිබෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව නියෝජනය කරනු ලබන ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ද මේ සඳහා අපේක්ෂා කරන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයා විසින් 2025 මාර්තු මස 05 වැනි දින ප.ව. 01.30ට අනුරාධපුරයේ දී මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා කටයුතු යොදාගෙන තිබෙන බවත් තමන් විසින් පෙර දැනුවත් නොවූ, අයවැය යෝජනා මගින් ඍජුවම හඳුනා ගනු ලබන ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කෙරෙන අතර ගරු මන්ත්‍රීවරුන්ට සහභාගී වී නගරයේ සැලසුම් කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳව අදහස් ඉදිරිපත් කරමින් සහයෝගය දැක්විය හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.14 ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

### 3.14.1 මන්නාරම නගරයේ අපජලය බැහැර කිරීම

මන්නාරම දිස්ත්‍රික්කයේ නිසි නගර සැලැස්මක් නොමැතිව ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති බැවින් නගරයේ කාණු පද්ධතියේ ජලය බැස යාම සම්බන්ධව ගැටලු මතුවී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මන්නාරම නගරය පසුගිය මාසය තුළ දෙවතාවක් ජලයෙන් යට වූ බවත් එම ජලය බැස යාම සඳහා සති තුනක් පමණ ගතවූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ හේතුවෙන් මන්නාරම නගරයේ ජනතාව දැඩි පීඩාවකට ලක්වන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙසත් ඉදිරියේ දී නිසි නගර සැලැස්මකට අනුව ඉදිකිරීම් කටයුතු සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මන්නාරම දිස්ත්‍රික්කයේ මලාපවහන කළමණාකරනය කිරීම සඳහා යම් ව්‍යාපෘතියක් පවතී ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

මන්නාරම දිස්ත්‍රික්කය සඳහා මේ වන විට ව්‍යාපෘතියක් නොමැති නමුත් මේ සම්බන්ධව අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතියක් සකස් කළ හැකි බව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අතිරේක සාමාන්‍යාධිකාරී (සැලසුම් හා නිර්මාණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.14.2 පේරාරු ජල ව්‍යාපෘතිය

බොහෝ ප්‍රදේශවල ජනතාව විශාල පිරිසක් පානීය ජලය නොමැතිව දැඩි අපහසුතාකට පත් වී සිටින බැවින් මෙම ජල ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා යම් සැලැස්මක් පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පානීය ජල අවශ්‍යතාව සහිත ප්‍රදේශ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් තොරතුරු ලබා දෙන්නේ නම් තැන්පතු සහතිකවල අරමුදල් මගින් මෙම ව්‍යාපෘතිය පුළුල් කළ හැකි බවත් ඒ සඳහා ධාරිතාවය පවතින

බවත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප. ව. 03.50ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---------------------------------------------------------------------------------------

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ**
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 28**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු කේ. ඩී. ලාල් කාන්ත මහතා (සභාපති)
ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය)
ගරු ටී. බී. සරත් මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු අමිර්තනාදන් අධෛක්කලනාදන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
ගරු අශෝක ගුණසේන මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා
ගරු අරුණ පනාගොඩ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු වසන්ත සමරසිංහ මහතා
ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා
ගරු මහින්ද ජයසිංහ මහතා
ගරු නලින් හේවගේ මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු තිළිණ සමරකෝන් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2021/2022 වර්ෂය සඳහා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව**
(2024.12.18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2022 වර්ෂය සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව**
(2025.02.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.3 2019 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**
(2025.02.14 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.4 2023 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව**
(2025.02.19 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.5 2023 වර්ෂය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.6 2023 වර්ෂය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2024.12.18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.7 2023 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.8 2019 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව**
(2025.02.14 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා**

**2.1 ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා - යෝජනා අංක 13**

**මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මක්කානිගම "යකඩ කුඹුරුවෙල" නැමති ඇළ මාර්ගය අධික වැසි සහිත කාලවලදී පිටාර ගැලීම හේතුවෙන් සිදුවන අපහසුතාවය වැළැක්වීම සඳහා පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**

මේ සම්බන්ධ පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2 ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා - යෝජනා අංක 14**

**මහනුවර දිස්ත්‍රික්කයේ, මාතලේ මහනුවර "ඒ 9" මාර්ගයට යාබදව පිහිටා ඇති " පිඟා ඔය" වැසි දිනවලදී පිටාර ගැලීම හේතුවෙන් සිදුවන අපහසුතාවය වැළැක්වීම සඳහා පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**

මේ සම්බන්ධ පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.3 ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා - යෝජනා අංක 15**

**තමා පදිංචිව සිටින නිවසින් ඉවත්වන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරි මාපාකඩ ඉංජිනේරු කාර්යාලය විසින් දන්වා සිටීම හේතුවෙන් අපහසුතාවයට පත්ව සිටින තමා වෙත සාධාරණයක් ඉටුකර දෙන ලෙස මාපාකඩවැව, මැදයාය, අංක 83/C ලිපිනයෙහි පදිංචි වයි.කේ.සුරංග යටිවැල්ල මහතා විසින් කරන ලද ඉල්ලීම**

මේ සම්බන්ධ පිළිතුරු වාර්තාව ගරු අමාත්‍යතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.4 ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය - යෝජනා අංක 16**

**පුත්තලම් දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ආසනයේ දංකොටුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අංක 475, නැගෙනහිර කටුකෙන්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන මාවත්ත ගොවිපළ භූමි පරිශ්‍රය තුල පදිංචි පවුල් 54කට ආසන්න පිරිසක් එම භූමියෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

මේ සම්බන්ධ පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමිය වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.5 ගරු නාමල් කරුණාරත්න මහතා - යෝජනා අංක 22**

**පදලංගල, කුට්ටිගල, අංක 454, ලිපිනයේ පදිංචි කේ.ඩී.කල්‍යාණවතී මහත්මිය විසින් භුක්ති විඳින ඉඩමට අදාළව පවතින ගැටලුව**

**සම්බන්ධව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් සිදු කරන ලද යෝජනාව**

මේ සම්බන්ධ පිළිතුරු වාර්තාව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.6 ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය - යෝජනා අංක 23**

**කුරුණෑගල, වැව රවුම් පාර, අංක 114, ලිපිනයේ පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. කේ. චන්ද්‍රසේන මහතාට අයත් ඉඩමට අදාළව පවතින ගැටලුව සම්බන්ධව ගරු මන්ත්‍රීතුමිය විසින් සිදු කරන ලද යෝජනාව**

මේ සම්බන්ධ පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමිය වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 බඩඉරිඟු ආනයනය සම්බන්ධ ගැටලු - ගරු අසෝක සපුමල් රන්වල මහතා**

පසුගිය වර්ෂයේ දී මෙරටට ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය සහ එම ආනයන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

බඩඉරිඟු ආනයනය පෞද්ගලික ආයතන මඟින් සිදු කරන බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඒ සඳහා අවසර ලබා දීම පමණක් සිදු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, 2024 වර්ෂය තුළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් බඩඉරිඟු මෙට්‍රික් ටොන් ලක්ෂ 03ක් ආනයනය කිරීමට බලපත්‍ර ලබා දී ඇති බවත් 2025 ජනවාරි 31 දිනෙන් පසු බඩඉරිඟු ආනයනය නවතා දමන ලද බවත් අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2024 වර්ෂය සඳහා බඩඉරිඟු මෙට්‍රික් ටොන් 221,934.54ක් සහ 2025 වර්ෂයේ ජනවාරි 31 වැනි දින වන විට මෙට්‍රික් ටොන් 54,280.10ක් ආනයනය කර ඇති බවත් ඒ අනුව 2024 වර්ෂය සඳහා අනුමත කරන ලද ආනයනය ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 275,000ක් පමණ බඩඉරිඟු ආනයනය කර ඇති බව අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එහෙත්, බඩඉරිඟු ආනයනය සම්බන්ධව ශ්‍රී ලංකා රේගුව සතු දත්ත අනුව ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය මෙට්‍රික් ටොන් ලක්ෂ 04 ඉක්මවන බැවින් මෙහිදී සඳහන් කරනු ලැබූ තොරතුරුවලින් එම අගය අපගමනය වීමට හේතු වන කරුණු පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙහිදී සඳහන් කරන ලද බඩඉරිඟු ප්‍රමාණයට අමතරව ත්‍රිපෝෂ වැනි මනුෂ්‍ය ආහාර සඳහා මෙන්ම සත්ත්ව නිෂ්පාදන සඳහා ද බඩඉරිඟු ආනයනය කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ත්‍රිපෝෂ වැනි මනුෂ්‍ය ආහාර සඳහා බඩඉරිඟු අවම ප්‍රමාණයක් එනම්, මෙට්‍රික් ටොන් 10,000ට වඩා අඩු ප්‍රමාණයක් ආනයනය කරන බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පවතින දත්ත අනුව මෙරට බඩඉරිඟු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් ලක්ෂ 06 පමණ වන බවත් මෙතෙක් රට තුළ මෙට්‍රික් ටොන් ලක්ෂ 03 ප්‍රමාණයක් පමණක් නිෂ්පාදනය කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට සත්ත්ව නිෂ්පාදන වෙනුවෙන් අවශ්‍ය බඩඉරිඟු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවනු ඇති බවට තක්සේරු කරන ලද බවත් 2025 ජනවාරි 31 දින වන විට බඩඉරිඟු ආනයනය නතර කළ ද, යළිත් මෙකී අවශ්‍යතා සඳහා අවශ්‍ය බඩඉරිඟු ආනයනය කිරීමට සිදුවන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු දත්තවල අපගමනයන්ට හේතුවන කාරණා විශ්ලේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවෙන් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බව අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සහ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය යන ආයතන සඳහා බඩඉරිඟු ආනයනයට යම් කෝටාවක් ලබා දී තිබුණ ද මේ දක්වා එම ආයතන මඟින් බඩඉරිඟු ආනයනය කර නොමැති බැවින් මෙම ආයතන සඳහා ලබා දී ඇති කෝටාව තවදුරටත් වැඩි කිරීමෙන් අනතුරුව, එම ආයතන හරහා බඩඉරිඟු ආනයනය සඳහා පියවර ගන්නා බවත් එලෙස ආනයනය කරනු ලබන බඩඉරිඟු සාධාරණ මිලට ගොවීන්ට ලබා දීමට කටයුතු කරන බවත් ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, යල කන්නයේ දී බඩඉරිඟු හෙක්ටයාර 20,000ක් පමණ වගා කිරීමට සැලසුම් කර තිබෙන බව ද ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

සෘජුවම බඩඉරිඟු ආනයනය කිරීම සඳහා ගොවීන්ට ලබා දුන් කෝටාව සම්බන්ධයෙන් ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා විසින් විමසීමක් කරන ලදී.

සත්ත්ව ආහාර උපදේශක කමිටුව මඟින් බඩඉරිඟු ආනයනයෙන් 80% සත්ත්ව නිෂ්පාදන කටයුතුවල නිරතවන ගොවීන් සඳහා ද, 20% රාජ්‍ය ආයතන සඳහා ද ලබා දීමට තීරණය කළ බවත් රාජ්‍ය ආයතන මඟින් ආනයනය කරනු ලැබූ බඩඉරිඟු, සෘජුවම බඩඉරිඟු ආනයනය කළ නොහැකි ගොවීන්ට ලබා දීමට කටයුතු කළ බවත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, පසුගිය කාලයේ බඩඉරිඟු ආනයනයේ දී වෙළෙඳපොළ තුළ ඒකාධිකාරිත්වයක් ඇති වී වැඩි මුදලට ගොවිපොළවලට බඩඉරිඟු ලබා දීමෙන් බිත්තර නිෂ්පාදනයට බාධා ඇති වූ බැවින්, එය වැළැක්වීම

සඳහා සත්ත්ව ආහාර නිෂ්පාදන කටයුතුවල නිරතවන පුද්ගලයින්ට මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ගොවීන්ට ද බඩඉරිඟු ආනයනය සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සහ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය යන ආයතන බඩඉරිඟු ආනයනය නොකිරීම හේතුවෙන් ඔවුන්ට අයත් කෝටාව ද සත්ත්ව ආහාර නිෂ්පාදනය කරන ගොවීන් වෙත ලැබීමෙන් වෙළෙඳපොළ තුළ යම් ඒකාධිකාරියක් නිර්මාණය වූ බැවින් මෙයට විසඳුම් ලෙස මහා පරිමාණ ගොවීන් මෙන්ම කුඩා පරිමාණ ගොවීන් සම්බන්ධ කර ගනිමින් රට තුළ බඩඉරිඟු නිෂ්පාදනය වැඩිකර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, බඩඉරිඟු යම් ප්‍රමාණයක් ආනයනය කිරීමේ අවශ්‍යතාවය පැනනැගුණු විට රජයේ ආයතන මඟින් සෘජුවම බඩඉරිඟු ආනයනය කර කුඩා ගොවිපොළවලට අඩු මිලට ලබාදීමට සහ බඩඉරිඟු ආනයනය සඳහා ඉල්ලීම් කරනු ලබන කුඩා ගොවිපොළ හිමියන්ගේ සංවිධානවලට ඒ සඳහා අවස්ථාව ලබාදීමටත් බලාපොරොත්තු වන බව ද ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට පවතින බඩඉරිඟු ආනයනකරුවන්ගේ නාම ලේඛනයට මෙම සුළු පරිමාණ ගොවීන්ගේ නම් ද ඇතුළත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබාදෙන ලදී.

මෙලෙස බඩඉරිඟු ආනයනයට අවස්ථාව ලබාදීමේ දී සත්ත්ව නිෂ්පාදනාගාරවල ධාරිතාව පිළිබඳව ද සලකා බලන ලෙස ගරු අසෝක සපුමල් රන්වල මහතා විසින් ඉල්ලීමක් කරන ලදි.

රජයේ මැදිහත්වීමෙන් බඩඉරිඟු ආනයනය කර සාධාරණ මිලට ලබා දෙන ලෙස සුළු හා මධ්‍ය පරිමාණ බිත්තර නිෂ්පාදකයින් විසින් ඉල්ලා සිටින බැවින්, මෙම නිෂ්පාදකයින්ගේ අවශ්‍යතාවය සලකා බලා බඩඉරිඟු ආනයනය සිදු කරන ලෙස ගරු වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, රට තුළ පවතින අවශ්‍යතාවය සලකා බලා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය හා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මඟින් බඩඉරිඟු ආනයනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.2 ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා

### 3.2.1 වී අස්වනු වේලීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම

වන්නි දිස්ත්‍රික්කයේ බහුතරයක් ජනතාව තම ජීවනෝපාය ලෙස කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන කටයුතුවල නිරතවන බැවින් එම කටයුතු සඳහා වැඩි අවධානය යොමු කරන ලෙසත් මෙම ප්‍රදේශවල

ජනතාව වී අස්වනු වේලීම සඳහා සෞඛ්‍යාරක්ෂිත නොවන ක්‍රමවේද භාවිත කිරීම වැළැක්වීමට එම කටයුතු සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම හෝ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග හඳුන්වාදීම සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් එම ප්‍රදේශවල කටයුතු කිරීමේ දී ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.2.1 කිරි ගොවීන්ට ශීතාගාර පහසුකම් ලබාදීම

කිරි නිෂ්පාදනයේ නිරතවන ජනතාවට කිරි කල්තබා ගැනීමට අවශ්‍ය ශීතාගාර පහසුකම් නොමැති වීම හේතුවෙන් එම ලබා ගන්නා කිරි අඩු මුදලට පුද්ගලික ව්‍යාපාරිකයන්ට ලබා දෙන බැවින්, එම කිරි ගොවීන්ට වැඩි මිලක් ලබා ගැනීම සඳහා කිරි ගබඩා කර තැබිය හැකි ශීතාගාර පහසුකම් සැපයීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.3 උඳු සඳහා නිශ්චිත මිලක් ලබා දීම - ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

උඳු සඳහා නිශ්චිත මිලක් නොමැතිවීම හේතුවෙන් උඳු වගාකරන ලද ගොවීන් අපහසුතාවයට පත්ව ඇති බැවින් එම ගොවීන්ගේ පිරිවැය පමණක් හෝ ආවරණය කර ගැනීමට, උඳු සඳහා නිශ්චිත මිලක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උඳු ඇතුළු අනෙකුත් ධාන්‍ය වර්ගවල අස්වනු නෙලන ලද කාල සීමාව තුළදී ඇති වූ වර්ෂාව හේතුවෙන් සෙට්ටිකුලම් සහ නැදුන්කර්නි වැනි ප්‍රදේශවල ගොවි ජනතාවට පාඩු සිදුවීමෙන් එම ගොවීන් උඳු වගාව අත්හැර දැමීමේ ප්‍රවණතාවයක් පවතින බැවින්, එම ගොවීන්ට වගා හානි සඳහා වන්දි ලබාදීමට හෝ රක්ෂණාවරණයක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය කාලයේ දී වර්ෂාව හේතුවෙන් උඳු වගාවට හානි සිදු වූ බවත් මේ වන විට වගා හානි සඳහා නොමිලේ ලබා දෙනු ලබන රක්ෂණාවරණය සඳහා උඳු, මුං ඇට සහ කවුපි යන භෝග තුනම ඇතුළත් කර ඇති බවත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උඳු ආනයනය කිරීමේ දී රු. 300ක බද්දක් අය කිරීම සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිරෝධායන සහතිකයක් (quarantine certificate) අවශ්‍ය වීමත් යන කරුණු හේතුවෙන් උඳු ආනයනය පාලනය වී ඇති බව ද කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

උඳු සඳහා ආනයන බද්ද ලෙස රු.300/-ක මුදලක් අය කිරීම තුළින් උඳු සඳහා විකුණුම් මිල රු. 300/-ට වඩා වැඩි අගයක් ගන්නා නමුත් වර්ෂාව සහිත කාලවල දී උඳු අස්වනු නෙලීමේ දී, උඳුවල ගුණාත්මකභාවය අඩුවන බැවින් එම උඳු ගුණාත්මක බවින් වැඩි උඳු

සමඟ කලවම් කර අලෙවි කිරීමෙන් එහි විකුණුම් මිල රු. 300/-ට වඩා අඩු අගයක් ගන්නා බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.4 ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

### 3.4.1 කිරි ගවයින් සඳහා අවශ්‍ය තෘණ භූමි ලබා දීම

1972 වර්ෂයේ දී අම්පාර දිස්ත්‍රික්කයේ වට්ටමඩු ප්‍රදේශයේ අක්කර 4,000ක් පමණ කිරි ගවයින් සඳහා තෘණ භූමි ලෙස ගැසට් කර ඇති නමුත් 2010 වර්ෂයේ දී එම ප්‍රදේශ වන සංරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් මේ වන විට 150,000කට අධික ගවයින් ප්‍රමාණයක් සිටින මෙම ප්‍රදේශයේ කිරි ගොවීන්ට ගැටලු මතුව ඇති බැවින් මෙම ඉඩම් නැවත ඔවුන්ට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අම්පාර දිස්ත්‍රික්කයේ මයිලතමාඩු ප්‍රදේශයේ ද ගවයින් සඳහා අවශ්‍ය තෘණ භූමි සම්බන්ධයෙන් ගැටලු පවතින බව ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.4.2 අම්පාර, සේනානායක සමුද්‍රයේ පවතින වැඩි වතුර ප්‍රමාණය ප්‍රයෝජනවත් අයුරින් භාවිතයට ගැනීම

අම්පාර දිස්ත්‍රික්කයේ තිරුකෝවිල්, ආලයඩිවේම්බු සහ පොතුවිල් යන ප්‍රදේශවල වැව් 04ක් ඇති බවත් අම්පාර සේනානායක සමුද්‍රයේ වැඩි වතුර ප්‍රමාණය කිසිඳු ප්‍රයෝජනයකට ගැනීමෙන් තොරව මුහුදට එකතුවන බැවින් එම වතුර ප්‍රමාණය මෙම වැව්වලට හැරවීමට කටයුතු කිරීම තුළින් එම ජලයෙන් විශාල බිම් ප්‍රමාණයක් වගා කිරීමට, සත්ත්ව පාලන කටයුතුවලට, මිරිදිය මත්ස්‍ය වගාවට මෙන්ම පානීය ජල ප්‍රශ්නයට විසඳුමක් ලෙස ද යොදා ගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.4.3 ඌරණි ග්‍රාමයේ යුද්ධය හේතුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම

පොතුවිල් ඌරණි ග්‍රාමයේ කාලාන්තරයක් තිස්සේ ජීවත් වූ පවුල් 192කට අයත් ජනතාව 1982 දී ඇති වූ යුද්ධය හේතුවෙන් අවතැන් වූ බවත් එයින් පවුල් 76ක් මේ වන විට නැවත පදිංචි කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉතිරි පවුල්වලට අයත් ජනතාව ද නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.5 මුන්දෙනිආරු ව්‍යාපෘතියේ ප්‍රගතිය - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

මීට වසර 05කට පෙර මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද මුන්දෙනිආරු ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මුන්දෙනිආරු ව්‍යාපෘතිය දැනට වසර 05කට පෙර ඒ.එෆ්.ඩී. (A.F.D.) නම් ප්‍රංශ ආයතනයේ අරමුදල් යටතේ ඉදිකිරීමට යෝජනා වී තිබූ

නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ණය ප්‍රතිව්‍යුහගත කිරීම් අවසන් වන තුරු ඒ.එෆ්.ඩී. (A.F.D.) ආයතනය විසින් අරමුදල් ලබා දීම තාවකාලිකව නවතා ඇති බවත් මෙම ව්‍යාපෘතිය සඳහා යූරෝ මිලියන 150කට ආසන්න මුදලක් වැයවන බැවින් එම මුදල මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකා රජයට දැරිය නොහැකි බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවර අයවැයෙන් තුළින් රු. මිලියන 100ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති බවත් මෙම ව්‍යාපෘතියට ඉඩම් අත්පත් කර ගැනීමට පමණක් එම මුදල් ප්‍රමාණවත් වන බවත් ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ.එෆ්.ඩී. (A.F.D.) ආයතනය මේ සඳහා අරමුදල් ලබා නොදුනහොත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මැදිහත් වී මෙම ව්‍යාපෘතිය සිදුකිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීමට කටයුතු කරන බව ද ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම කරුණු අමාත්‍යාංශ මට්ටමින් පමණක් සාකච්ඡා කළ බවත් ඉදිරි කටයුතුවල දී ගරු මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට පියවර ගන්නා බවත් ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේ දී මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.6 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි ගොවීන් මුහුණපාන ගැටලු විසඳීම - ගරු කිංස් නෙල්සන් මහතා

කිරි ගවයින් ගාල් කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එකඟතාවයෙන් සෝමාවතිය වැනි ප්‍රදේශ ලබා දී තිබුණ ද, මේ වන විට එම ප්‍රදේශවල ගවයින් ගාල් කිරීමේ දී දඩ මුදලක් අය කිරීමට කටයුතු කිරීම හේතුවෙන්, කිරි ගොවීන් අසීරුතාවයට මුහුණ පා සිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම කිරි ගොවීන්හට හැඳුනුම්පතක් ලබාදීම වැනි ක්‍රමයක් හෝ භාවිතා කර මෙම ගැටලුවට විසඳුම් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දිගුකාලීනව ගත් කළ ගවයින් නිදැල්ලේ අතහැර, කිරි නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය නතර කළ යුතු නමුත් කෙටිකාලීනව මෙම ගැටලුවට විසඳුම් ලබා දිය යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මොණරාගල, මඩකලපුව, හම්බන්තොට සහ පොළොන්නරුව වැනි ප්‍රදේශවල ගවයින් සඳහා තෘණ භූමි නොමැති බවත් අලින්ගේ පරිභෝජනයට කැළෑ ප්‍රදේශවල පවතින තණකොළ, ගවයින් ආහාරයට ගැනීම හේතුවෙන් අලි ගම්මානවලට පැමිණීමේ අවදානමක්

පවතින බවත් ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තෘණ භූමි ලෙස පවතින කැලෑ ප්‍රදේශවල ගොවිතැන් කරන හේන් ගොවියන් සහ ගවයින්ගේ අයිතිකරුවන් අතර ගැටුම්කාරී තත්ත්වයන් ඇති වී තිබෙන බව ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යන සියලුම ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් මේ සඳහා උචිත විසඳුම් ලබා දීමට කටයුතු කරන බවත් දිගුකාලීනව කිරි ගම්මාන ගොඩනගමින් ගව ගාල් තුළ කිරි නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගන්නා බවත් ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**3.7 පුරන් කුඹුරු අස්වැද්දීම සම්බන්ධ ගැටලු විසඳීම - ගරු නලින් හේවගේ මහතා**

වසර ගණනාවක සිට වගා නොකරන ලද පුරන් වූ කුඹුරු මේ වන විට වී වගාව සිදු කිරීමට සුදුසු තත්ත්වයේ නොමැති බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගොවිජන සේවා පනත තුළින් මෙම කුඹුරුවල වෙනත් වගාවන් සිදු කිරීමට අවසර ලබා දී නොමැති බැවින්, මෙම පනත් සංශෝධනය කර මෙකී ඉඩම් සම්බන්ධව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකර එහි වෙනත් බෝග වගා කිරීමට අවශ්‍ය අනුමතිය ලබා දෙන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, මෙම අමාත්‍යාංශය මඟින් ආරම්භ කරනු ලැබූ "එක මිටට ගොවි බිමට" වැඩසටහන සම්බන්ධයෙන් ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

"එක මිටට ගොවි බිමට" වැඩසටහන යනු පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනක් නොවන බවත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ගොවි සංවිධානවලට මෙම පුරන් කුඹුරු තුළ වගා කරන බෝග වර්ග තීරණය කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් ගැටලු පැන නැඟුණු අවස්ථාවන්හිදී එම ගැටලු විසඳීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.8 පුරන් කුඹුරු වගා කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ සම්බන්ධ ගැටලු නිරාකරණය කරගැනීම - ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**

පුරන් වූ කුඹුරු ඉඩම් වගා කිරීම සම්බන්ධයෙන් 05/2018, 06/2018, 03/2024 යන චක්‍රලේඛ නිකුත් කර තිබූ බවත් ඉන් කුඹුරු ඉඩම් A,B,C ලෙස නම් කොට වෙනත් කටයුතු සඳහා ගොඩ කිරීමට අනුමතිය ලබා දී තිබුණු චක්‍රලේඛ තාවකාලිකව නතර කිරීම සඳහා 3/2024

චක්‍රලේඛය නිකුත් කළ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැවතත් 03/2024 චක්‍රලේඛය අත්හිටුවීමට 2025.02.14 වැනි දින අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතුව දැනුම්දීම හේතුවෙන් නැවත ඉඩම් ගොඩ කිරීමට අනුමතිය ලබා දී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම චක්‍රලේඛවල වලංගුභාවය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම වැදගත් බව ගරු රුවන්තිලක ජයකොඩි මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

7/2018 චක්‍රලේඛයේ තිබූ අඩුපාඩු සලකා බලා 3/2024 චක්‍රලේඛය නිකුත් කළ බවත් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ලැබුණු නිර්දේශයන් සලකා බලා 3/2024 චක්‍රලේඛය තාවකාලිකව අත්හිටුවා ඇති බවත් අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (රා. ආ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම චක්‍රලේඛයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් මේ වනවිට අධ්‍යයනය කරමින් පවතින බැවින් මේ සම්බන්ධයෙන් සංශෝධිත චක්‍රලේඛයක් තවම නිකුත් කර නොමැති බව ද අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (රා. ආ.) විසින් දැනුම් දෙන ලදී.

පැරණි චක්‍රලේඛ අනුව ක්‍රියාකර කුඹුරු ඉඩම් ගොඩකිරීම වහාම නතර කළ යුතු බවත් නව සංශෝධිත චක්‍රලේඛය ඉදිරිපත් කිරීමෙන් පසු ඒ අනුව කටයුතු කළ යුතු බවත් ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

චක්‍රලේඛ නිකුත් කිරීමේ දී සිදු වූ වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල අනුමතියකින් තොරව කුඹුරු ඉඩම් ගොඩ කිරීම වැනි කටයුතු සිදු නොකරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (රා. ආ.) වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 3.9 ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

### 3.9.1 ගවරෝග නිවාරණයට පියවර ගැනීම

උතුරු පළාතේ ගවයින්ගේ සමේ ගැටිති ඇතිවීමේ රෝගය ව්‍යාප්ත වෙමින් පවතින බැවින් ඒ සඳහා එන්නත් කිරීමට වැය වන මුදලින් 50% ක් රජයෙන් ලබා දෙන අතර 50% ක මුදල ගොවියා විසින් දැරිය යුතු වන බැවින් ගොවීන් එයට මැලිකමක් දැක්වීමෙන්, රෝගය වළක්වා ගැනීමට නොහැකි වී ඇති බවත් ඉතිරි 50% ක මුදල ද රජය විසින් දැරීමෙන් මෙම ගැටලුවට විසඳුම් ලබා දිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ දිනවල දී ඩුබායි රාජ්‍යයේ ගවයින් අතර රෝගයක් පැතිරෙන බැවින් එම රෝගය මෙරට තුළ ව්‍යාප්ත වීම වැළැක්වීමට පූර්ව

ආරක්ෂණ පියවර ගන්නා ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.9.2 පශු වෛද්‍ය සේවාවන් ආශ්‍රිත ගැටලු විසඳීම

රට පුරා පශු වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බවත් පෞද්ගලික අංශය හා සංසන්දනය කිරීමේදී අඩු වැටුප්, අඩු අතිකාල දීමනා මෙන්ම පොරොත්තු රාජකාරී සඳහා (on call) දීමනා නොගෙවීම හේතුවෙන් පශු වෛද්‍යවරුන් රජයේ පත්වීම් ලබා ගැනීමට මැලිකමක් දැක්වීමෙන් මෙම ගැටලු පැන නැගී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ දී ප්‍රධාන පියවරක් ලෙස පශු වෛද්‍ය කාර්යාල සඳහා පශු වෛද්‍යවරුන් අනුයුක්ත කිරීමට ද ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, සතියේ දිනවල ප. ව. 3.00 පමණ වන විට මෙන්ම සති අන්තයේ සෙනසුරාදා දින වරුවක් සහ ඉරිදා දිනයේ ද පශු වෛද්‍ය කාර්යාලය වසා දැමීම හේතුවෙන් එම වේලාවන්හිදී සතුන් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට නොහැකි වීමෙන් ගැටලු පැන නැගී ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, පශු වෛද්‍ය කාර්යාල සඳහා පශු සම්පත් උපදේශකවරුන් 04 දෙනෙකු සිටිය යුතු නමුත් ඇතැම් ස්ථානවල එක් උපදේශකවරයෙකු හෝ නොමැති බවත් බොහෝ කාර්යාලවල අනෙකුත් නිලධාරීන්ගේ හිඟතාවය පැවතීමත් හේතු කොට ගෙන මෙම කාර්යාලවලින් සේවය ලබා ගැනීමට පැමිණෙන පිරිස් අපහසුතාවයට පත්වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මේ සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.10 නව තාක්ෂණික ක්‍රම භාවිතය මගින් කෘෂිකර්මාන්තය දියුණු කිරීම - ගරු රවී කරුණානායක මහතා

තවදුරටත් සම්ප්‍රදායික වගා ක්‍රමවල නිරත වීම රටෙහි සංවර්ධනයට බාධාවක් වන බැවින් කෘෂිකර්මාන්තය තුළින් විශාල ආදායම් ලබන ලෝකයේ වෙනත් රටවල් මෙන් කෘෂිකර්මාන්තය සඳහා නවීන තාක්‍ෂණික ක්‍රමවේද යොදාගැනීම මඟින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.11 ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

#### 3.11.1 වන්නි දිස්ත්‍රික්කයට අයත් වැව් ප්‍රතිසංස්කරණය කිරීම

වන්නි දිස්ත්‍රික්කයේ වසර ගණනාවක සිට ප්‍රතිසංස්කරණ නොකරන ලද වැව් ප්‍රතිසංස්කරණය කර කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වන්නි ප්‍රදේශයේ අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කරන ලද ප්‍රදේශවල, නැවත පදිංචි කරන ලද පවුල් සඳහා නිවසක් සහ අක්කර

භාගයක භූමි ප්‍රමාණයක් ලබා දී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොහෝමයක් කැලෑවල් තුළ අතහැර දමන ලද වැව් සහිත ඉඩම් පවතින බැවින් මෙම වැව් ප්‍රතිසංස්කරණය කර ඉඩම් නොමැති එදිනෙදා රැකියාවල නිරතවන ජනතාවට අක්කරය බැගින් මෙම ඉඩම්වලින් ලබා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය සමයේ වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකළ නමුත් නව රජය යටතේ වවුනියා දිස්ත්‍රික්කයට රු. මිලියන 500ක් වෙන් කර ඇති බැවින් එමඟින් වැව් 160ක් ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කර ඇති බවත් මේ වන විට එහි මූලික පියවර ආරම්භ කර ඇති බවත් ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කුඩා වැව්, පළාත් සභා, ගොවිජන සේවා සහ මහවැලි එල් කලාපය යන ක්ෂේත්‍ර තුනටම අයත් වන බවත් මහවැලිය මඟින් මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට වැඩපිළිවෙළක් සකස් කර ඇති බවත් ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කයේ, මහවැලි එල් කලාපයට අයත් වැව් 54ක් අතුරින් වැව් 13ක් සම්බන්ධයෙන් මේ වන විට පරිසර අධ්‍යයනයක් සිදුකර එම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව ඇස්තමේන්තු සකස් කර ඇති බවත් මෙම වසර 03 තුළ ප්‍රතිසංස්කරණය කළ හැකි සහ මේ වන විට ප්‍රතිසංස්කරණය කළ වැව් ආශ්‍රිතව වගාවන් විධිමත් කිරීමට මෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වැව් 19ක් ප්‍රතිසංස්කරණය කිරීමට පරිසර අධ්‍යයනය සිදුකර මූලික පියවර ගෙන ඇති බවත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අයවැය ප්‍රතිපාදන ලැබුණු පසු දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රමුඛතා ලැයිස්තු සකස් කර එම ප්‍රදේශවල වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු ආරම්භ කරන බව අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (රා.ආ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වසර 30කට ආසන්න කාලයක් පුරා යුද්ධය පැවතීම හේතුවෙන් විනාශයට පත් වූ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වෙත විශේෂ අවධානය යොමු කර එම ප්‍රදේශවල අක්කර 200ට අඩු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (රා.ආ) වෙත උපදෙස් ලබාදෙන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කය තුළ කල්ලාරු අමුණ, පාවක්කුලම්, මොහොත්තාකුලම්, වීරපෙරියකුලම්, රාජේන්ද්‍ර කුලම් වැනි වැව් 06ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන බවත් ඉන් මොහොත්තාකුලම් වැවේ මේ වන විටත් ප්‍රතිසංස්කරණ සිදුකර අවසන්

බවත් අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම කළමනාකරණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ පළාත් සභා යටතේ පාලනය වන වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල දී සාකච්ඡා කරන බැවින් එම අවස්ථාවල දී මේ සම්බන්ධයෙන් තම යෝජනා ඉදිරිපත් කරන ලෙස ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දෙන ලදී.

#### 3.11.2 වන්නි දිස්ත්‍රික්කයේ ගවයින් හේතුවෙන් සිදුවන මාර්ග අනතුරු වැළැක්වීම

වන්නි දිස්ත්‍රික්කයේ ගවයින් සඳහා තෘණ භූමි නොමැති වීමෙන් පාරවල් අසල ගවයින් ගැවසීම නිසා රාත්‍රී කාලයේ බොහෝ අනතුරු සිදුවන බැවින්, රාත්‍රී කාලයේ ගවයින් හඳුනාගැනීමට එම සතුන්ට පරාවර්තනය වන කන් සලකුණු (reflectory ear tags) යෙදීමෙන්, ඉතා අඩු වියදමකින් මාර්ග අනතුරු අඩු කර ගැනීමට හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.12 ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා

#### 3.12.1 කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (Small holder Agribusiness & Resilience Project - SARP) යටතේ සිදුකරන වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවල ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පුත්තලම ඇතුළු අනෙකුත් දිස්ත්‍රික්කවල සිදුකරන වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රගතිය සහ ඒවායේ ඵලදායීතාව සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ආලංකුලම වැව ප්‍රතිසංස්කරණය සඳහා රු. ලක්ෂ 61ක පමණ විශාල මුදලක් වැය කරන නමුත් ඉන් ප්‍රතිලාභ ලැබෙන ඉඩම් ප්‍රමාණය කුඹුරු අක්කරයකට අඩු ප්‍රමාණයක් වන බැවින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.12.2 මුන්නේශ්වරම්, පාලකුලම් වැව් රක්ෂිතයේ පදිංචිකරුවන් ඉවත් කිරීම

හලාවත, මුන්නේශ්වරම් කෝවිලේ පාරම්පරිකව ආවතේව කටයුතු සිදු කරන මුන්නේශ්වරම්, පාලකුලම් වැව් රක්ෂිතයේ වසර 45ක පමණ කාලයක සිට පදිංචිව සිටින පුද්ගලයන්ට එම ඉඩම් වැව් රක්ෂිත ප්‍රදේශ ලෙස දන්වමින් ඉවත්වන ලෙස ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් දැනුම් දීමෙන් තුළින් එම පිරිස අපහසුතාවයට පත්ව ඇති බැවින් ඒ පිළිබඳ සොයා බලා ඔවුන්ට සහනයක් සලසන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.13 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් වැව් ප්‍රතිසංස්කරණය කිරීම - ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

1985 වර්ෂයේ සිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ වැව් 250ක් සහ අමුණු 25ක් පමණ භාවිතයට නොගෙන අතහැර දමා ඇති බවත් මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීම තුළින් එම ජලය ආධාරයෙන් මෙට්‍රික් ටොන් 20,000ක පමණ වී නිෂ්පාදනය කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි කංගවේලි, වෙයින්ගාමම් සහ කිළිවෙට්ටි යන මහා පරිමාණ වැව් අතහැර දමා ඇති බැවින් එම වැව් ප්‍රතිසංස්කරණය කර වාරිමාර්ග පද්ධතියට එක් කිරීම තුළින් මෙරට වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 70,000ක් පමණ මෙන්ම යාන් ඔය අමුණ, නීලපණියන් වැවට හැරවීම මඟින් ද තවත් මෙට්‍රික් ටොන් 70,000ක් රටේ වී නිෂ්පාදනයට එක්කර ගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**314. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**

**3.14.1 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සීමාසහිත ජනතා ලංකා මිරිස් අලෙවි සමාගමට ලබා දුන් ණය මුදලට අදාළ පොළී මුදල අයකර ගැනීම**

2001 වර්ෂයේ සීමාසහිත ජනතා ලංකා මිරිස් අලෙවි සමාගමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් ණය මුදලට අදාළව රු. 1,975,233ක පොළී මුදල අයකර ගැනීම සිදු නොකරන ලෙස අනුරාධපුර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් ලිපියක් මඟින් දැනුම් දී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම පොළී මුදල අයකර නොගන්නා ලෙස තමාට පෙර සේවය කරන ලද ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාදුන් නියෝගය අනුව කටයුතු කළ නමුත් මේ වන විට එම යවන ලද ලිපිය අවලංගු කර මෙම මුදල් නැවත ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ ආයතනය වෙත දැනුම් දී තිබෙන බව අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (රා.ආ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.14.2 අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීම ආශ්‍රිත ගැටලු**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීමේ දී එයට යටවන භූමි ප්‍රමාණය, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වන ජනතාව නැවත පදිංචි කිරීම සම්බන්ධව සහ මෙම ජලාශය සඳහා වැය කරනු ලබන මුදලට සාපේක්ෂව එහි ප්‍රගතියක් පවතී ද යන්න සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයෙන් පසු ඇස්තමේන්තු කරන ලද මුදල රු. මිලියන 47,000ක් මෙන්ම සිවිල් ඉදිකිරීම් සඳහා රු. මිලියන 35,000ක් පමණ අවශ්‍ය වන බවත් මෙවර අයවැය තුළින් රු. මිලියන

5,000ක් ලබා දී ඇති බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මන්නාරම දිස්ත්‍රික්කය තුළ යල කන්නයේ කුඹුරු අක්කර 36,000ක් සහ මහ කන්නය ද වගා කිරීමට අවශ්‍ය ජලය ලබා ගැනීම, අනුරාධපුර වවුනියා ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රමය ඔස්සේ පවුල් 100,000කට වැඩි ප්‍රමාණයකට පානීය ජලය සැපයීමට අවකාශ සැලසීම, මෙගා වොට් 4.5ක (45MW) ධාරිතාවක් සහිතව ජල විදුලිය නිපදවීම මෙන්ම අනුරාධපුර සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගංවතුර පාලනය මෙහි ප්‍රධාන ප්‍රතිලාභ ලෙස දැක්විය හැකි බව ද වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

තව ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ඖෂධ නිෂ්පාදන භූමියක් (Pharmaceutical area) ඉලක්ක කර ගනිමින් මෙම ජලාශය ගොඩනැගීමට යෝජිතව තිබුණ ද මේ වන විට එම අරමුණින් බැහැර වී ඇති බව ද වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වන ජනතාව විල්පත්තු වනජීවී සංරක්ෂණ සීමාවට අයත් ඉඩම්වල පදිංචි කිරීමට නියමිත බවත් මේ වන විට වනසතුන්ගෙන් සිදුවන හානි වළක්වාලමින් ආරක්ෂිත විධි විධාන යොදා එම ඉඩම් පදිංචියට සුදුසු ලෙස සූදානම් කරමින් පවතින බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

දැනට මෙම ව්‍යාපෘතියෙන් 10%ක පමණ ප්‍රමාණයක වැඩ අවසන් කර ඇති බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

වන අලි ගැටලුව හේතුවෙන් මෙම ජනතාව එවැනි ප්‍රදේශවල පදිංචි කිරීම ගැටලුකාරී බවත් මෙම ව්‍යාපෘතිය මඟින් යටවන භූමි ප්‍රමාණය මෙන්ම මෙමඟින් සිදුවන පරිසර හානිය ද සැලකීමේ දී මෙම ජලාශය ඉදිකිරීම මඟින් ලැබෙන දිගුකාලීන ප්‍රතිලාභ පිළිබඳව ගැටලුමය තත්ත්වයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ආයෝජනයට සාපේක්ෂව ලැබෙන්නා වූ ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් පවතින බැවින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ උතුරු පළාත් සභාව යන ආයතන මෙන්ම උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ සමඟ ද මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කළ යුතු බව ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළ පරිදි අදාළ ආයතන සහ පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.15 ගරු ටී. බී. සරත් මහතා

### 3.15.1 මින්නේරි වැව ආසන්නයේ ජීවත්වන පදිංචිකරුවන්ට ඉඩම් ඔප්පු ලබා දීම

වසර 40කට ආසන්න කාලයක සිට මින්නේරි වැව ආසන්නයේ ජීවත්වන ජනතාවගෙන් ඇතැම් පිරිස් සඳහා ඉඩම් ඔප්පු හෝ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලුව විසඳීම සඳහා කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.15.2 කෘෂිකාර්මික කටයුතු පහසු කිරීම සඳහා නව තාක්ෂණික උපකරණ භාවිතයට අවසර ලබා ගැනීම

කෘෂිකාර්මික කටයුතු පහසු කිරීමට යොදාගත හැකි නව තාක්ෂණය සහිත යන්ත්‍රයක් (weeder) මේ වන විට නිපදවා භාවිතය සඳහා අවසර ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් මේ වන විටත් ලැබී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කර මෙම යන්ත්‍රය භාවිතයට අනුමතිය ලබාදීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.15.3 යල කන්නයේ වගා කටයුතු සඳහා ජලය නිකුත් කිරීම

අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි ප්‍රදේශවල යල කන්නයේ වී වගාව ආරම්භ කිරීමට ජලය නිකුත් කිරීම සඳහා මාර්තු 25 සිට අප්‍රේල් 01 දක්වා කාලය සුදුසු බැවින් රේඛීය අමාත්‍යාංශය විසින් යල කන්නය සඳහා ජලය නිකුත් කිරීමට බලාපොරොත්තු වන කාලය සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

අප්‍රේල් මස අවසන් වන විට සියලුම කුඹුරු ඉඩම් වගා කිරීමට තීරණය කර අප්‍රේල් මාසයේ නව වසර උදා වීමට පෙර මාර්තු 15 පමණ වන විට වැඩිම කුඹුරු ප්‍රමාණයකට ජලය ලබා දීමට සැලසුම් කළ නමුත් මහ කන්නයේ ලැබුණු අධික වර්ෂාව හේතුවෙන් විනාශ වූ වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය වන බැවින් එවැනි වැව් සඳහා ජලය ලබා දීම අප්‍රේල් 19 - 20 වැනි දිනයන්හි දී සිදු කිරීමට තීරණය කර ඇති බව ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.15.4 මොරගහ කන්ද උතුරු ඇළ ව්‍යාපෘතිය ආශ්‍රිත ගැටලු

මොරගහ කන්ද උතුරු ඇළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම හේතුවෙන් මොරගහ කන්ද පහළ කොටසෙහි පිහිටි බකමූණ සහ ඇළහැර වැනි ප්‍රදේශවල වැව් රාශියක් ජලයට යටවීමෙන් එම ප්‍රදේශවල ජීවත් වන ජනතාවට ජලය ලබා ගත නොහැකි වීමේ ගැටලුවක් පැන නැගී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර විසඳුමක් ලබා දෙන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ජලය සපයා ගැනීමේ ගැටලුව පැන නැගී ඇති බකමූණ ප්‍රදේශයේ වැව් 07කට ජලය ලබාදීම සම්බන්ධයෙන් එම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡා කළ බවත් ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවය පවතී නම්, ගරු අමාත්‍යතුමාගේ සහ අදාළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් යුතුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ නැවතත් සාකච්ඡාවක් පැවැත්විය හැකි බවත් මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.16 බඩඉරිඟු වගාවට තෙල් ඉසීම සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිතයට අවසර ලබා ගැනීම - ගරු විජේසිරි බස්නායක මහතා**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ තරුණ ව්‍යවසායකයෙකු විසින් තම අක්කර 100ක පමණ සිදු කරනු ලබන බඩඉරිඟු වගාවට පෞද්ගලිකව මිලදී ගන්නා ලද ඩ්‍රෝන යන්ත්‍රයක් ආධාරයෙන් තෙල් ඉසීමට අවසර ලබා ගැනීම සම්බන්ධයෙන් විමසා සිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තම ප්‍රදේශය ආසන්නයේම පිහිටා ඇති ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් කුලී පදනම මත ඩ්‍රෝන යානා ලබා ගත හැකි බවත් පෞද්ගලිකව ඩ්‍රෝන යානා භාවිතයට අවසර ලබා ගැනීම සඳහා ලිපියක් මඟින් රේඛීය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් සිදු කළහොත් එය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර අවසර ලබා දීම සඳහා කටයුතු සිදුකළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.17 කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල සුළු අපනයන භෝග වගා ක්ෂේත්‍රයේ වැඩිදියුණු කිරීම - ගරු අශෝක ගුණසේන මහතා**

කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල සිදු කරනු ලබන සුළු අපනයන බෝග වගාව වැඩිදියුණු කිරීම සඳහා නාරම්මල පිහිටා ඇති බුලත් පර්යේෂණ ආයතනය, බුලත් මෙන්ම පුවක් හා කහ වැනි සුළු අපනයන භෝග සම්බන්ධ පර්යේෂණ ආයතනයක් ලෙස වැඩිදියුණු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ගෘහස්ථව සිදු කරනු ලබන කුරුඳු වගාවන් වැඩිදියුණු කිරීමටත් එම වගාවන්හි නිරත පිරිස් සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර සහාය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය හරහා ලබා දීමටත් කටයුතු කරන ලෙස ගරු කෝසල නුවන් ජයවීර මහතා විසින් ද ඉල්ලීමක් කරන ලදී.

අතුරු වගා හා බුලත් පර්යේෂණ ආයතනය නාරම්මල ප්‍රදේශයේ පිහිටුවා ඇති නමුත් මෙම ආයතනයෙහි කටයුතු සිදුකර ගැනීමේ දී මානව සම්පත් සහ අනෙකුත් සම්පත්වල පවතින හිඟය හේතුවෙන් ගැටලු පැන නැගී ඇති බවත් එම අවශ්‍යතාවයන් සපුරා ගැනීමෙන් අනතුරුව මෙම ආයතනය වැඩිදියුණු කළ හැකි බවත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශේෂයෙන්ම අපනයනය සඳහා වගා කරනු ලබන කළු බුලත් ද ඇතුළත්ව කුලියාපිටිය, හෙට්ටිපොළ සහ නාරම්මල ආදී ප්‍රදේශවල

විශාල වශයෙන් බුලත් වගාව සිදු කරන බැවින් ඇපලදෙණියේ පිහිටි බුලත් ආර්ථික මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් බුලත් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කළ හැකි බව ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ට පවතින අනෙකුත් ගැටලු සහ යෝජනා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 12.50ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---------------------------------------------------------------------------------

**සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 04**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සභාපති)
ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු චමින්ද ලලිත් කුමාර මහතා
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
ගරු අශෝක ගුණසේන මහතා
ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (ගරු නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති)
ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු ඔෂානි උමංගා මහත්මිය
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු රුවන් මාපලගම මහතා
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2023 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය**
(2025.02.19 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.3 2023 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.4 2023 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2025.01.22 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.5 2023 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2025.02.18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් 2025 මාර්තු මස 10 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යැයි ද තීරණය කළාය.

**2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

මෙම අමාත්‍යාංශය යටතේ ආයතන 41ක් පවතින බවත් ආර්ථික අර්බුදය හේතුවෙන් අකර්මණ්‍ය වී ඇති පද්ධති ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කළ යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආයතන තුළ පවතින විභවයන් පුළුල් කර ගත හැකි බවත් ඒ සඳහා සියලු දෙනාගේම දායකත්වය ලැබිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

## 3. වෙනත් කරුණු

### 3.1 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

#### 3.1.1 මඩකලපුවේ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම

මේ සම්බන්ධව ජනතා විසින් දීර්ඝ කාලයක් පුරා ඉල්ලීම් කරන අතර මේ වන තෙක් ඒ සම්බන්ධව අවසන් තීරණයක් ලබා නොදීමේ හේතුව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මඩකලපුවේ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම සඳහා ගාන්ධි නගර් ප්‍රදේශයේ ස්ථානයක් හඳුනාගෙන ඊට අදාළ ක්ෂේත්‍ර පරීක්ෂාව දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂ සේවා කාර්යාලය සමඟ එක්ව මීට සතියකට පමණ පෙර සිදුකර ඇති බවත් මඩකලපුව දිස්ත්‍රික්කයේ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කටයුතු ප්‍රමාද වීමට හේතුව ඔසුසල ශාඛාව ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් සහ ගොඩනැගිල්ලක් සොයා ගැනීමට සැලකිය යුතු කාලයක් ගතවීම වන බව ද ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

කලවංචිකුඩි මූලික රෝහල තුළ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල තුළ සහ මඩකලපුව නගර සභා බල ප්‍රදේශය තුළ ද ඔසුසල ශාඛාව ස්ථාපිත කිරීමට ඉඩ පහසුකම් සලසා දිය හැකි බවත් කඩිනමින් මෙම කටයුතු අවසන් වනු ඇතැයි අපේක්ෂා කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 3.1.2 පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ හිඟය

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවල පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ දැඩි හිඟයක් පවතින බැවින් නැවත පත්වීම් ලබාදීමේ දී ඒ පිළිබඳව සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් 976 දෙනෙකු සඳහා පත්වීම් ලබාදීමට කටයුතු සූදානම් කර ඇති බවත් මාර්තු මාසය තුළ අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බවත් සෞඛ්‍ය අංශයේ අතිරේක ලේකම් (පාලන) - II විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 3.1.3 මඩකලපුව ශික්ෂණ රෝහලේ උපකරණ හිඟය

එම්ආර්අයි ස්කෑනර් යන්ත්‍ර, හෘද කැතීටකරණ ඒකක, සීටී ස්කෑන් යන්ත්‍ර, භෞතචිකිත්සක ඒකකවල හිඟයක් පවතින අතර ආසියානු සංවර්ධන බැංකුව මේ සඳහා ආධාර ලබාදෙන බව දැනුම් දී ඇති බැවින් එහි ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම්ආර්අයි ස්කෑනර් යන්ත්‍රයක් පවතින නමුත් එම ඒකකය ඉදිකිරීම සඳහා සැලසුම් අංශයේ අනුමතිය මෙතෙක් ලැබී නොමැති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නව ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව රු. මිලියන 250ක මුදලක් ලැබී ඇති බවත් මීට අදාළව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමතිය ලද විගස ප්‍රතිපාදන වෙන් කරගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ හැකි බවත් අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සිදුකිරීමට නියමිත ඉදිකිරීම් සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම්ගෙන් (ඉංජිනේරු සේවා) විමසීමක් කරන ලදී.

මඩකලපුව රෝහලේ හෘද රෝග ඒකකය ගොඩනැගිල්ල ඉදිකිරීම කටයුතු අවසන් අදියරේ පවතින බවත් පැරණි මිල ගණන් යටතේ වායු ඖෂධ (Medical Gas) ඒකකය සකස් කිරීමට නොහැකි බව කොන්ත්‍රාත්කරු දැනුම් දුන් බැවින් නැවත ප්‍රසම්පාදන කැඳවීමකින් පසුව එහි කටයුතු සිදුකිරීමට හැකි වන බවත් අතිරේක ලේකම්ගෙන් (ඉංජිනේරු සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වකුගඩු සත්කාර ඒකකය (Renal Care Unit) ඉදිකිරීම් කටයුතු 80%ක් පමණ අවසන් වී ඇති අතර ආර්ථික අර්බුදය හේතුවෙන් එහි ඉදිකිරීම් ද නවතා දමා තිබූ බවත් ඉතිරි එහි ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදු කිරීම මෙම වසරේ සිදු කිරීමට ඇති ව්‍යාපෘතියක් ලෙස ඉදිරිපත් කර ඇති බවත් අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආධාරවලින් ඉදිකරන ලද ශල්‍ය ඒකක ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති බව ද අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (Institute of Construction Training and Development - ICTAD) විසින් ආර්ථික අර්බුදය, කොරෝනා වසංගතය වැනි ගැටලු සම්බන්ධව විවිධ විසඳුම් හා නිර්දේශ ලබාදෙන බවත් කොන්ත්‍රාත්කරුවන් විසින් මෙවැනි ඉදිකිරීම් කටයුතු නවත්වා නව මිල ගණන් යටතේ ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කරන බැවින් එවැනි කොන්ත්‍රාත්කරුවන්ට විරුද්ධව නීතිමය පියවර ගන්නා ලෙස ගරු මොහොමඩ් සාලි නලීම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (Institute of Construction Training and Development - ICTAD) විසින් ලබා දෙන ඇතැම් උපදෙස් මෙම ඉදිකිරීම්වල පවතින ඇතැම් කරුණු සඳහා නොගැලපෙන බව අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වසරේදී ප්‍රමුඛතාවය හිමිවන්නේ අතරමග නවතා දමා ඇති ව්‍යාපෘති අවසන් කිරීම සඳහා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2025 ප්‍රසම්පාදන සැලැස්මට මඩකලපුව රෝහල සඳහා එම්ආර්අයි ස්කෑනර් යන්ත්‍රයක් ලබාදීමට ඇතුළත් කර ඇති බවත් ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී

## 3.2 යාපනය දිස්ත්‍රික්කයේ රෝහල්වල ඖෂධ හිඟය - ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

යාපනය දිස්ත්‍රික්කයේ රෝහල්වල සෑම වර්ගයකම ඖෂධවල හිඟයක් පවතින බැවින් එම ඖෂධ කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වසර කිහිපයක් තිස්සේ ඇතැම් ඖෂධ සඳහා ප්‍රසම්පාදන කැඳවීමේ ගැටලුවක් පවතින බවත් මේ වනවිට එම ගැටලුව යථා තත්ත්වයට පත් කර ගැනීමේ කටයුතුවල නිරතවන බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බැවින් දීර්ඝ කාලයක් පුරා පැවැති ඇතැම් ගැටලු සඳහා විසඳුම් සෙවීම ආරම්භ කර ඇති බවත් ඔසුසල වෙනුවෙන් සකස් කරන ලද නව ප්‍රසම්පාදන සැලැස්මක් පවතින බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ප්‍රසම්පාදන කමිටු මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කර අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා යම් කාලයක් ගත වනු ඇති බව ද ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 3.3 ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා

### 3.3.1 කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම

උතුරු පළාත තුළ විශේෂයෙන්ම කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය අනුව ඔසුසල ශාඛා ස්ථාපිත කර නොමැති නිසා ජනතාව පෞද්ගලික ඖෂධ අලෙවිසැල්වලින් ඖෂධ මිලදී ගන්නා බැවින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කළ හැකි ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කයේ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම සඳහා ස්ථානයක් පරීක්ෂා කළ නමුත් එම ස්ථානය අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපෙන බැවින් වෙනත් ස්ථාන පිළිබඳව සොයා බලන බවත් වවුනියාව දිස්ත්‍රික්කයේ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීමට සැලසුම් සකස් කර ඇති බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන පරීක්ෂා කරමින් පවතින බවත් සුදුසු ස්ථානයක් ලැබුණු පසු ඉදිරියේදී ඔසුසල ශාඛාවක් ස්ථාපිත කරන බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කිලිනොච්චි රෝහලේ අධ්‍යක්ෂවරයා සමඟ සිදුකළ සාකච්ඡාවේ දී රෝහල තුළ ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම සඳහා ඉඩ පහසුකම් ලබා දීමට එකඟ වූ බැවින් එම ස්ථානය සුදුසු නම් එහි ඔසුසල ශාඛාව ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඔසුසල ශාඛා පිහිටුවීමේ දී තිරසාර වීම, ප්‍රදේශයේ මහජනතාවට සේවය සැලසීමට හැකි වීම ආදී කරුණු පිළිබඳව සලකා බලන බවත් මේ වන විට කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි පෞද්ගලික ඖෂධ අලෙවිසැල් 04ක් පමණක් පැවතීම සම්බන්ධව දැනුවත් බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම සඳහා සුදුසුම ස්ථානය තෝරා ගැනීම සිදු කළ යුතු බවත් කිලිනොච්චි රෝහල් පරිශ්‍රය තුළ පිහිටි ස්ථානය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ඔසුසල ශාඛාව ස්ථාපිත කිරීම ආරම්භ කළ හැකි දිනයක් දැනුම්දිය හැකි බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීමේ නිර්ණායක පිළිබඳව ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා විසින් විමසීමක් කරන ලදී.

ගොඩනැගිල්ලක බිම් මහලේ වර්ග අඩි 800 – 1,200 දක්වා ඉඩ ප්‍රමාණයක් සහිත ජනතාවට ප්‍රවාහන පහසුකම් සපයා ගත හැකි ස්ථානයක් විය යුතු බැවින් වවුනියාව නගර මධ්‍යයේ පිහිටි ස්ථානයක් විය යුතු වන බවත් වාහන 2 - 3ක් පමණ නැවැත්විය හැකි වාහන නැවැත්වීමේ පහසුකම් සහිත ස්ථානයක් විය යුතු බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් ප. ව. 02.42ට කාරක සභා රැස්වීමේ මුලසුන ගන්නා ලදී.**

### 3.3.2 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනුමත සේවක සංඛ්‍යා සංශෝධනය

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය, අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම මහා භාණ්ඩාගාරය මගින් අනුමත කිරීම සහ ඊට ගතවන කාලය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

2017 - 2018 වර්ෂවල දී නිර්මාණය කරගත් අනුමත සේවක සංඛ්‍යාව සමඟ මේ වන විට රාජකාරී සිදු කරන බවත් මෙම වසරේ තුළ දී අනුමත සේවක සංඛ්‍යා සංශෝධනයක් සිදු කර අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වනවිට පවතින ආයතන සඳහා පමණක් නොව නවක උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් සේවයට බඳවා ගැනීම සඳහා ද අනුමත සේවක සංඛ්‍යාවක් අවශ්‍ය වන බවත් බොහෝ කාණ්ඩවල පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා ඒ සඳහා අයදුම් කරන සංඛ්‍යාව වැඩි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.3.3 මඩකලපුව අෂ්රෆ් අනුස්මරණ රෝහලේ කාන්දුකරණ යන්ත්‍ර

මඩකලපුව දිස්ත්‍රික්කයේ මාස කිහිපයකට පෙර පැවැති ගංවතුර තත්ත්වය හේතුවෙන් කල්මුණේ ප්‍රදේශයේ පිහිටි අෂ්රෆ් අනුස්මරණ රෝහලේ තිබූ කාන්දුකරණ යන්ත්‍ර 4න් එක් යන්ත්‍රයක් පමණක් ක්‍රියාත්මක වන බව ජනතාව විසින් දැනුම් දුන් බැවින් මේ සම්බන්ධව

යම් විසඳුමක් ලබා දිය හැකි ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 3.3.4 යාපනය ශික්ෂණ රෝහලේ ඇස් වාට්ටුව සම්බන්ධ ගැටලු

යාපනය ශික්ෂණ රෝහලේ ඇස් වාට්ටුවට තවත් වාට්ටු 02ක් සම්බන්ධ කිරීමට ගෙන ඇති තීරණය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

යාපනය ශික්ෂණ රෝහලේ ඇස් වාට්ටුවට ඉහළ මහලේ පිහිටි වාට්ටුවක් ප්‍රතිසංස්කරණය කිරීමට නැවත විවෘත කරන ලද බවත් වාට්ටු නොමැති විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙකුට එම නවීකරණය කරන ලද වාට්ටුව භාවිත කිරීමට ලබා දුන් බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වාට්ටුවක් නොමැති තවත් විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු සිටින බවත් ඔවුන් ඇස් වාට්ටුව ඉල්ලා සිටින බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එම ඇස් වාට්ටුව ලබාදිය නොහැකි බවත් එම වාට්ටුවේ ශල්‍ය වෛද්‍යවරයා මුළු දිවයිනටම සේවාව සපයන වෛද්‍යවරයකු බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

අනතුරු සහ දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වන වාට්ටුවක් හදිසි අනතුරු ඒකකය තුළ ස්ථාපිත කරන බවත් එය සකස් කළ පසු වාට්ටු නොමැති විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනාට එය ලබා දිය හැකි බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.3.5 සෞඛ්‍ය අංශයේ පරිපාලනමය කටයුතුවල යෙදෙන වෛද්‍යවරුන්ට දීමනාවක් ලබාදීම

සෞඛ්‍ය අංශයේ පරිපාලනමය කටයුතුවල යෙදෙන වෛද්‍ය නිලධාරීන් හට තම රාජකාරි වේලාවෙන් පසු වෛද්‍ය වෘත්තීයේ යෙදීමට නොහැකි බැවින් ඊට අදාළව දීමනාවක් ලබාදීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඒ සඳහා අනුමතිය ලබා ගත හැකි ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

2025 ලබාදීමට නියමිත දීමනාවලට අමතරව මෙම වසර තුළ වෙනත් දීමනා ලබා නොදෙන බවත් 2026 වර්ෂයේ අයවැය තුළට මෙය ඇතුළත් කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.3.6 යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ ලෙස වෛද්‍ය ටී. සත්‍යමූර්ති මහතා පත් කිරීම සම්බන්ධයෙන් විමසීම

අමාත්‍ය මණ්ඩල අනුමතිය යටතේ යාපනය ශික්‍ෂණ රෝහල සඳහා නිල නොලත් අයුරින් වෛද්‍ය ටී. සත්‍යමූර්ති මහතා පත් කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ විමසීමක් කළ ද ඒ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු බවත් වෛද්‍ය සභාවේ අනුමතියක් මෙම

පත්වීම සඳහා ලැබී නොමැති නම්, විශේෂ අනුමතිය යටතේ මෙවැනි පත්වීම් ලබාදෙනුයේ කවර පදනමක් මත ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තව ද, උතුරු සහ නැගෙනහිර පළාත්වල රෝහල් සඳහා වෛද්‍යවරුන්ට පත්වීම් ලබාදීමේ දී රජය විසින් වැඩි අවධානය යොමු කළ යුතු බවත් මෙම පත්වීම් සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත්කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට රට තුළ සිටින විශේෂඥ වෛද්‍යවරුන්ට රෝහල් කිහිපයක වැඩ ආවරණය කිරීමට අවස්ථාව ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙරට ශික්ෂණ රෝහල් 09ක් බලාත්මක කරන ලද රෝහල් (Enforced Hospitals) ලෙස පවතින බවත් යාපනය ශික්ෂණ රෝහල ද එයට ඇතුළත්වන අතර එවැනි රෝහලක සේවය කිරීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලීම හේතුවෙන් වෛද්‍ය ටී. සත්‍යමූර්ති මහතාට මෙම පත්වීම ලබා දී ඇති බැවින්, පවතින රෙගුලාසි අනුව එවැනි පත්වීමක් අවලංගු කිරීමට නොහැකි බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) - I විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රෝහල් අධ්‍යක්ෂවරයෙකු එම තනතුරේ දීර්ඝ කාලයක් සේවය කරන විට කල් ගතවත්ම එම රෝහල තුළ ගැටලු ඇති වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබාදීමෙන් මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබා ගැනීමට ගරු මන්ත්‍රීතුමාට හැකියාවක් ලැබෙන බැවින් ඒ සඳහා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.3.7 නුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂක තනතුරට සිදුකරන ලද පත්වීම සම්බන්ධ ගැටලුව

නුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂ තනතුර සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ නිලධාරියකු පත් කළ යුතු වුව මේ වනවිට දේශපාලන බලපෑම් මත එම තනතුර සඳහා නියෝජ්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරියෙකු පත්කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

රෝහල් වර්ගීකරණය අනුව නුවර ජාතික රෝහල, ජාතික රෝහලක් ලෙස වර්ගීකරණය කර තිබුණ ද රෝහල් අධ්‍යක්ෂ තනතුර සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය මෙතෙක් ලැබී නොමැති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.4 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

### 3.4.1 කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීම

කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා ඔසුසල ශාඛාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය තරම් ඉඩ පහසුකම් ලබාදිය හැකි බවත් ඉඩම් නොමැති බව පවසමින් මෙම කටයුතු කල් දැමීම සිදු නොකරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

අදාළ ස්ථාන පරීක්ෂා කිරීම සඳහා සති 02ක පමණ කාලයක් තුළ දී නිලධාරීන් යොමු කළ හැකි වුව ද ඔසුසල ස්ථාපිත කිරීම සඳහා යම් ඉදිකිරීමක් සිදුකිරීමට වුවහොත් අවශ්‍ය අනුමතියක් ලබාගෙන නිශ්චිත ක්‍රමවේදයන්ට අනුකූලව ඉදිකිරීම සඳහා මාස 04ක පමණ කාලයක් ගතවන බවත් ශාඛාවක් ස්ථාපිත කිරීම සඳහා මේ වන විට ඉදිකර ඇති ගොඩනැගිල්ලක් යෝජනා කළ හැකි නම් මාස 03ක පමණ කාලයක් ඇතුළත ආරම්භ කළ හැකි බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.4.2 කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ පවතින ගැටලු

වසර 04කට පමණ පෙර ඉදිකරන ලද කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා වෛද්‍ය උපකරණ ලබා දී ඇති නමුත් රෝහලට අවශ්‍ය වෛද්‍ය කාර්යමණ්ඩලය මේ වන තෙක් පත් කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පුදුකුඩිඉරිප්පු, මල්ලාවි, ඔච්චුසුඩාන් සහ මන්නාරම යන ප්‍රදේශවල ජනතාව මෙන්ම කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වීරාවිල්, මුලන්ගාවිල්, පුනාහරි, ධර්මපුරම් සහ විශ්වමඩු යන ප්‍රදේශවල ජනතාව ද ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මෙම රෝහල වෙත පැමිණෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා අති නවීන එක්ස් රේ යන්ත්‍රයක් තිබුණ ද මෙම රෝහලේ විකිරණවේදීන් නොමැති බැවින් වවුනියා රෝහලේ විකිරණවේදීන් සමඟ රෝගීන් පැමිණ මෙම එක්ස් රේ යන්ත්‍රය භාවිත කර අවශ්‍ය කටයුතු සිදුකරගෙන යන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම රෝහලට අවශ්‍ය කාර්යමණ්ඩලය ලබාදෙන්නේ ද යන්න පිළිබඳව සහ මෙම රෝහලේ පවතින යන්ත්‍රෝපකරණ මෙම රෝහල තුළම තබා ගැනීම සම්බන්ධව සහතික විය හැකි ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කාර්යමණ්ඩල ගැටලුව සම්බන්ධව 2025.03.03 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ බවත් උතුරු පළාතට පැමිණ එම රෝහල්වල අත්‍යවශ්‍ය අඩුපාඩු පරීක්ෂා කර බලා කාර්යමණ්ඩලය ලබාදීමට එහිදී එකඟතාවයකට පැමිණි බවත්

උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රෝහලේ පවතින යන්ත්‍රෝපකරණ සම්බන්ධව සලකා බැලීමේ දී මෙය යටිතල පහසුකම් සැපයීම පිළිබඳ ගැටලුවක් වන අතර කිලිනොච්චි රෝහල් පරිශ්‍රය අමාත්‍යාංශය වෙත භාරදෙනු ලැබුවේ මීට මාස 04කට පෙර නොව මෙම මාසයේ බවත් එදින පටන් මෙම උපකරණ භාරදීමේ යම් යම් ගැටලු පවතින බවත් උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

### 3.4.3 කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු ඒකකය

වසර 04කට පෙර කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු ඒකකය ඉදිකිරීම සඳහා අත්තිවාරම දමා ඇති නමුත් ඉන්පසු එහි ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

A9 මාර්ගයේ වවුනියාව සිට යාපනය දක්වා ඇති මාර්ගය තුළ පවතින එකම රෝහල මෙය වන බැවින් මෙම රෝහලේ හදිසි අනතුරු ඒකකය කඩිනමින් ඉදිකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ ද (සංවර්ධන) සහභාගිත්වය සහිතව අදාළ සමාගම සමඟ සාකච්ඡා කර එම අඩුපාඩු බොහෝමයක් මේ වන විට විසඳාගෙන ඇති බවත් මෙම ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී එය පූතික ටැංකියක් (Septic Tank) සමඟ සම්බන්ධ කර නොතිබීම හේතුවෙන් මේ වන විට ගොඩනැගිල්ල සහ පූතික ටැංකියක් (Septic Tank) සම්බන්ධ කරමින් පවතින අතර ඒ හේතුවෙන් ප්‍රමාදයක් මතු වී ඇති බවත් උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යාමේ දී වර්ෂාවෙන් දැඩි බාධා එල්ල වූ අතර පූතික ටැංකිය (Septic Tank) ආසන්නයේ ඇති පොකුණට වතුර පිරී එය පූතික ටැංකියට (Septic Tank) ගලා ඒමෙන් ගැටලුවක් මතුවී ඇති බවත් මීට සති 02කට පමණ පෙර පළාත් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයා ඇතුළු කණ්ඩායමක් එහි ගොස් නිර්දේශයක් ලබා දුන් බවත් උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කාන්තා සෞඛ්‍ය සේවා සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය (Center of Excellence for women's health Care) නැමති සමස්ත ලංකාවටම සේවය සැපයිය හැකි ආයතනයේ වෛද්‍ය කාර්යමණ්ඩලය සඳහා නිලධාරීන් යාපනයේ ශික්ෂණ රෝහලෙන් සහ යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් සපයා ගැනීමට අදාළව කටයුතු සිදු කරමින් පවතින බවත් මෙම සියලු කටයුතු ඉදිරි මාස 02 - 03 ඇතුළත සිදු කිරීමට හැකි වනු ඇති බවත් උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගොඩනැගිල්ල භාවිත නොකළ ද අදාළ වෛද්‍ය උපකරණවල වගකීම් කාලය කල්ඉකුත් වීමට ද ආසන්න වන බැවින් මෙම රෝහල නැවත යථා තත්ත්වයට ක්‍රියාකාරී වනතුරු මෙය යාපනය ශික්ෂණ රෝහල

වෙත සායන පැවැත්වීම සඳහා භාර දිය හැකි ද යන්න පිළිබඳව ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධව ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ පවතින වෛද්‍ය උපකරණ යාපනය ශික්ෂණ රෝහල වෙත මාරු කිරීම සඳහා මෙතෙක් කිසිදු තීරණයක් ගෙන නොමැති බවත් පසුගිය සතියේ දී යාපනය දිස්ත්‍රික්කයේ සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවේ දී පැවැත්වූ සාකච්ඡාවන්ට අනුව යාපනය ශික්ෂණ රෝහලේ මානව සම්පත් කිලිනොච්චි රෝහල වෙත යොදා ගෙන එහි කාන්තා සෞඛ්‍ය සේවා සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානයේ (Center of Excellence for women's health Care) කටයුතු ආරම්භ කිරීමට තීරණය කළ බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා වෛද්‍යවරුන්, හෙද කාර්යමණ්ඩලය පමණක් නොව විකිරණවේදීන්, තාක්ෂණ ශිල්පීන් ඇතුළු කාර්යමණ්ඩලයක් අවශ්‍ය වන අතර යාපනය ශික්ෂණ රෝහලේ එක් තාක්ෂණ ශිල්පියෙක් පමණක් සිටින බවත් අනෙකුත් තාක්ෂණ ශිල්පීන් දෙදෙනා වවුනියාව රෝහලේ සහ මන්නාරම රෝහලේ සිට ස්වේච්ඡාවෙන් පැමිණෙන බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

බඳවා ගන්නා නව කණ්ඩායමෙන් අවම වශයෙන් එක් නිලධාරියෙකු හෝ මෙම රෝහලේ කටයුතු ආරම්භ කිරීම සඳහා යොදා ගන්නා බව ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.5 ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

### 3.5.1 නෙදර්ලන්ත රජයේ ආධාර මත ඉදිකරන ලද වෛද්‍ය ඒකක සඳහා කාර්යමණ්ඩලය නොමැති වීම

වවුනියා දිස්ත්‍රික් මහ රෝහලේ හෘද රෝග හා වකුගඩු රෝග ඒකකය, මුලතිව් දිස්ත්‍රික්කයේ මාන්කුලම් මූලික රෝහලේ වෛද්‍ය පුනරුත්ථාපන චිකිත්සක සහ මානසික සෞඛ්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ කාන්තා සෞඛ්‍ය සේවා සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය (Center of Excellence for women's health Care) සහ පේදුරුතුඩුව මූලික රෝහලේ ශල්‍යාගාරය, විකිරණ අංශය ඇතුළු ඒකක කිහිපයක් නෙදර්ලන්ත රජයේ ආධාර මත ඉදිකර ජනතා අයිතියට පත්කරන ලද නමුත් එහි සේවය කිරීම සඳහා මානව සම්පත්වල හිඟයක් පවතින බැවින් මෙම රෝහල් සහ අංශවල කටයුතු ආරම්භ කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

යාපනයේ ශික්ෂණ රෝහලේ කාර්යමණ්ඩලය සූදානම් බවත් ඉහත සඳහන් කරන ලද අනෙකුත් රෝහල් සඳහා නව කාර්යමණ්ඩල පත් කිරීමට කාලය ගතවන බැවින් පවතින මානව සම්පත රෝහල් අතර බෙදා ගනිමින් කටයුතු කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වෛද්‍ය ඒකක පළාත් සෞඛ්‍යය කාර්යාලය වෙත භාරදී මේ වනවිට වසරකට ආසන්න කාලයක් ගතවී තිබෙන බවත් මෙම ඒකකවල පවතින වෛද්‍ය උපකරණ වෙනත් රෝහල් වෙත ලබා දෙන බවට අසත්‍ය පුවත් පැතිරෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 3.5.2 වවුනියාව දිස්ත්‍රික් රෝහලේ පවතින ගැටලු

මෙම රෝහලේ හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා ඇති බවත් එහි ඉදිකිරීම් අවසන් කිරීම සඳහා තවත් රු. මිලියන 600ක පමණ ඇස්තමේන්තු ගත මුදලක් අවශ්‍ය වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අවම වශයෙන් මෙහි වහලය ඉදිකිරීම සඳහා රු. මිලියන 100ක් පමණ වැය වන අතර එසේ නොමැති වුවහොත් ජල කාන්දුවීම් ආදිය සිදුවී මෙය විනාශ වී යා හැකි බැවින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර කඩිනමින් පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.5.3 වවුනියාව දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන්

වවුනියාව දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් විශාල සංඛ්‍යාවක් සිටින අතර ඔවුන් සඳහා ප්‍රතිකාර කිරීමට වකුගඩු රෝග ඒකකයක් ඇතුළු සියලු පහසුකම් පවතින බවත් රෝගීන් 150ක් පමණ සහ චෙට්ටිකුලම් ප්‍රදේශයේ රෝගීන් 30ක් පමණ කාන්දුකරණය (Dialysis) ප්‍රතිකාර ලබා ගන්නා බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වවුනියාව රෝහලෙන් කාන්දුකරණය ප්‍රතිකාර සිදුකර ගැනීම සඳහා පදවිය, මැදවච්චිය ආදී ප්‍රදේශවලින් ද රෝගීන් පැමිණෙන අතර දිනකට නව රෝගීන් සැලකිය යුතු ප්‍රමාණයක් ද එකතු වන බවත් මෙම රෝගීන්ට කාන්දුකරණ ප්‍රතිකාරය සිදුකිරීම සඳහා ප්‍රමාණවත් කාන්දුකරණ යන්ත්‍ර සංඛ්‍යාවක් නොපවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එබැවින්, තවත් කාන්දුකරණ යන්ත්‍ර 03ක් පමණ හෝ ලබාදෙන ලෙස මෙම ප්‍රජාව ඉල්ලීම් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මන්නාරම, මැදවච්චිය ආදී ප්‍රදේශවලින් නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට අමතරව වකුගඩු අකර්මණ්‍ය වූ රෝගීන් වවුනියාව දිස්ත්‍රික් රෝහල වෙත රැගෙන එන බවත් කාන්දුකරණ යන්ත්‍ර 03ක් හෝ ලබාදුන් විට රෝගීන්ට ප්‍රතිකාර කිරීම කළමනාකරණය කරගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට පවතින කාන්දුකරණ යන්ත්‍රවලින් යන්ත්‍ර 02ක් පමණ කැඩී ඇති අතර යන්ත්‍ර 13ක් පමණක් ක්‍රියාත්මක වන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.6 ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා

### 3.6.1 පොතුවිල් මූලික රෝහලේ සේවක පුරප්පාඩු

පොතුවිල් මූලික රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, සේවා සහයක වැනි තනතුරුවල පුරප්පාඩු රාශියක් පවතින බැවින් එම පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පොතුවිල් මූලික රෝහල මධ්‍යම රජයට පවරා ගත් බවත් එහි පාලන කටයුතු එක්වරම මධ්‍යම රජයට සිදුකළ නොහැකි බැවින් දැනට එහි කටයුතු පළාත් සභාවේ සහය ඇතිව සිදුවන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පොතුවිල් මූලික රෝහල ක්‍රමෝපායිකව වැදගත් වන බැවින් එය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.6.2 අක්කරෙපත්තුව රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් පානම රෝහලේ පවතින හදිසි ප්‍රතිකාර ඒකකය අක්කරෙපත්තුව රෝහලට නිදහස් කර දී ඇති අතර මේ සම්බන්ධව රේඛීය අමාත්‍යාංශය හරහා ද කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.6.3 Imipramine ඖෂධ හිඟය

Imipramine ඖෂධය ඖෂධහල්වල නොමැති අතර රෝහල්වල ද සීමිත ප්‍රමාණයක් පමණක් පැවතීම නිසා රෝගීන් දැඩි පීඩාවකට ලක් වී ඇති බැවින් එම ඖෂධය එම පළාතේ රෝහල්වලට හා පුද්ගලික ඖෂධහල්වලට ද ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය වර්ෂ 03හිදීම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටලු පැවතීම ඔසුසල්වල ඖෂධ නොමැති වීමට හේතුව වී ඇති බවත් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතින ගැටලු විසඳීම සඳහා කමිටු පත් කර ඒ හරහා විසඳුම් සෙවීමට කටයුතු කරමින් පවතින බැවින් ඉදිරි මාස 03න් පසු ඖෂධ ලැබෙනු ඇති බවත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.6.4 කොවිඩ් වසංගතය හේතුවෙන් මිය ගිය මුස්ලිම් ප්‍රජාව ආදාහනය කිරීම

ආදාහනය කරන ලද මුස්ලිම් ජනතාවගේ නම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.7 උතුරු පළාතේ විකලාංග දන්ත වෛද්‍යවරුන්ගේ (Orthodontist) හිඟය - ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

උතුරු පළාතේ විකලාංග දන්ත වෛද්‍යවරුන්ගේ (Orthodontist) හිඟයක් පවතින බවත් අනුමත විකලාංග දන්ත වෛද්‍යවරුන්ගේ

සංඛ්‍යාව යාපනය සහ වවුනියා දිස්ත්‍රික්කවලට පමණක් සීමාවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යාපනය දිස්ත්‍රික්කයේ විකලාංග දන්ත වෛද්‍යවරුන් විසින් උතුරු පළාතේ ඇති අනෙකුත් දිස්ත්‍රික්කවල රෝගීන්ට ද සේවාව සපයන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තෙලිප්පලේ මූලික රෝහලේ සහ මන්නාරම මූලික රෝහලේ ද විකලාංග දන්ත වෛද්‍යවරුන් සිටින නමුත් කිලිනොච්චි රෝහලේ විකලාංග දන්ත වෛද්‍යවරුන් නොමැති බවත් මුලතිව් සහ මන්නාරම ප්‍රදේශවලින් පැමිණෙන රෝගීන්ට යාපනය ශික්ෂණ රෝහලට යාමට වඩා කිලිනොච්චිය රෝහල වෙත ළඟාවීම පහසු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කිලිනොච්චිය, මුලතිව් සහ මන්නාරම යන ප්‍රදේශවල රෝගීන්ට සේවා සැපයූ යාපනය ශික්ෂණ රෝහලේ සේවය කළ විකලාංග දන්ත වෛද්‍යවරයා මහියංගණයට මාරු කර ඇති බැවින් එම වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලබාගත් රෝගීන් දැඩි අපහසුතාවයකට ලක්ව සිටින බවත් ඒ හේතුවෙන් දිගු පොරොත්තු ලේඛනයක් සැකසී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ජනතාව විසින් කිලිනොච්චි දිසා රෝහල වෙත විකලාංග දන්ත වෛද්‍යවරයෙකු ලබා දෙන ලෙස ඉල්ලීම් කරන බැවින් මේ පිළිබඳව සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

යාපනය ශික්ෂණ රෝහලේ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරයා වාර්ෂික ස්ථාන මාරුවීම් හරහා මහියංගණයට ස්ථානමාරු වී ඇති බවත් වාර්ෂික ස්ථාන මාරුවීම් අනුව වවුනියාව රෝහලේ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරයා අනිවාර්යයෙන්ම යාපනය ශික්ෂණ රෝහලේ වැඩබාරගත යුතු බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහියංගනය රෝහල වෙත ස්ථාන මාරු වූ යාපනය ශික්ෂණ රෝහලේ සේවය කළ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරයා කිලිනොච්චිය රෝහලේ සේවය කිරීමට කැමැත්ත පළකළ බවත් කිලිනොච්චිය රෝහල වෙත වෙනත් විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරයකු පත් කරන තෙක් මහියංගනය රෝහල වෙත ස්ථානමාරු වූ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරයා සතියට දින 02ක් කිලිනොච්චි රෝහලේ සේවයට යෙදවීමට කටයුතු කරන බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ස්ථාන මාරුවීම් මත මහියංගනය රෝහල වෙත ස්ථානමාරු වූ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරයාට මහියංගනය රෝහලේ සහ යාපනය රෝහලේ යන රෝහල් දෙකේම සතියකට දින 02ක බැගින් සේවය කිරීමට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම අපහසු බැවින් එක් සතියක් මහියංගනය රෝහලේ හා එක් සතියක් යාපනයේ රෝහලේ සේවය කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.8 ගරු මොහොමඩ් සාලි නලීම් මහතා

### 3.8.1 එරාවූර් මූලික රෝහලේ පැරණි විදුලි ජනන යන්ත්‍රය

එරාවූර් මූලික රෝහල සඳහා නව විදුලි ජනන යන්ත්‍රයක් ලැබීමට නියමිත බැවින් මෙම රෝහලේ ඇති පැරණි විදුලි ජනන යන්ත්‍රය දිස්ත්‍රික් ආයුර්වේද රෝහල වෙත ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එරාවූර් මූලික රෝහල සඳහා විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාළ සියලු කටයුතු සිදු කර ඇති බවත් පසුගිය වසරේදී මේ සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් මෙම වසරේ දී නැවතත් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති අතර මේ වන විට විදුලි ජනන යන්ත්‍රය ගෙන්වා ඇති නමුත් ඒ සඳහා මුදල් ගෙවීමට නොහැකි බැවින් මෙතෙක් එම විදුලි ජනන යන්ත්‍රය රෝහල වෙත ලබා නොදුන් බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.8.2 එරාවූර් මූලික රෝහලේ පවතින ගැටලු

එරාවූර් මූලික රෝහලේ වෛද්‍යවරුන්ගේ සහ හෙද කාර්යමණ්ඩලයේ හිඟයක් පවතින බැවින් විශේෂඥ වෛද්‍යවරුන් 04 දෙනෙකු, වෛද්‍ය නිලධාරීන් 22 දෙනෙකු, දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු සහ හෙද කාර්යමණ්ඩලය අවශ්‍ය බැවින් මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක වීන රජයේ ආධාරවලින් ඉදිකරන ලද ගොඩනැගිල්ලක් නැගෙනහිර පළාත් හිටපු ආණ්ඩුකාරවරයා විසින් විවෘත කර වසරක් පමණ ගත වී ඇති නමුත් මෙම ගොඩනැගිල්ල භාවිත කර නොමැති බැවින් එම ගොඩනැගිල්ල ඵලදායී කටයුත්තක් සඳහා යොදාගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වෛද්‍ය අපද්‍රව්‍ය දාහකයක් එරාවූර් මූලික රෝහලේ නොමැති බැවින් මෙම රෝහලට වෛද්‍ය අපද්‍රව්‍ය දාහකයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.9 තිරුක්කෝවිල් මූලික රෝහලේ පවතින ගැටලු - ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

වසර 120ක් පමණ පැරණි තිරුක්කෝවිල් මූලික රෝහල වෙත ලැබිය යුතු අනුමත සේවක සංඛ්‍යාව ලබා දී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශේෂඥ වෛද්‍යවරුන් 07 දෙනෙකු සිටිය යුතු වුව ද මේ වන විට එහි එක් වෛද්‍යවරයෙක් පමණක් සිටින බවත් වෛද්‍ය නිලධාරීන් 26 දෙනෙකු සිටිය යුතු අතර මේ වන විට 06 දෙනෙකු පමණක් සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තිරුක්කෝවිල් මූලික රෝහලේ ගොඩනැගිලි පහසුකම් නොමැති බවත් ඇතැම් වෛද්‍ය උපකරණ සහ යන්ත්‍ර භාවිත නොකරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, අම්පාර දිස්ත්‍රික්කයේ ඇති අනෙකුත් රෝහල් විදේශ ආධාරවලින් දියුණු කර ඇති නමුත් මෙම තිරුක්කෝවිල් රෝහල පමණක් කිසිදු සංවර්ධනයක් සිදු නොකර අත්හැර දමා ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම රෝහලේ සේවයට පැමිණෙන නිලධාරීන් ද ස්ථාන මාරු සකස් කරගෙන වෙනත් රෝහල් වෙත යන බවත් දිනකට රෝගීන් 700 - 800ක් පමණ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා බාහිර රෝගී අංශයට පැමිණෙන අතර නිසි ප්‍රතිකාර සිදුකිරීමට නොහැකි වීමෙන් ඇතැම් රෝගීන් මිය යන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම ගැටලු පිළිබඳව අවධානය යොමුකර 2026 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මගින් මෙම රෝහල සංවර්ධනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නැගෙනහිර පළාතේ සෑම රෝහලකම පාහේ පුරප්පාඩු පවතින බවත් විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා වෛද්‍ය නිලධාරීන්ගේ විශාල හිඟයක් පවතින බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 30ක් මේ වන විට පවතින බවත් මීට පෙරදී එම නිලධාරිනියන් ප්‍රදේශවලට බෙදීමේදී යම් විෂමතාවක් පැවතී තිබෙන බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට මඩකලපුව දිස්ත්‍රික්කයේ තනතුරු 60ක පුරප්පාඩු පවතින අතර ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දී මෙම ගැටලුවම පවතින බවත් කල්මුණේ රෝහල වෙත නිලධාරීන්ට පත්වීම් ලබාදී ඇති බැවින් ඔවුන්ව නැවත වෙනත් රෝහල් වෙත මාරු කිරීම අපහසු නමුත් මෙම වසරේ වාර්ෂික ස්ථානමාරු වීම් හරහා මෙය සිදු කළ හැකි ද යන්න පිළිබඳව පරීක්ෂා කරන බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් නොමැතිවීම සහ සම සෞඛ්‍ය නිලධාරීන්ගේ විශේෂයෙන්ම තාක්ෂණික නිලධාරීන්ගේ හිඟයක් පවතින බවත් එම තනතුරු සඳහා පත් කිරීම් ලබා දෙන තෙක් එම සේවාවන් ලබාදීම අපහසු බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

තිරුක්කෝවිල් රෝහල B ශ්‍රේණියේ මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණි ගත කර ඇති අතර මේ වන විට එහි විශේෂඥ වෛද්‍යවරුන් කිසිවෙකුත් නොමැති බවත් වෙනත් රෝහලක වෛද්‍යවරයෙක් ලවා වැඩ අවරණය කළ නොහැකි බැවින් තිරුක්කෝවිල් රෝහලට නව වෛද්‍යවරයෙක් පත්කර එවන තෙක් සිටිය යුතු බවත් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

තිරුක්කෝවිල් රෝහල සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ඒ සම්බන්ධව කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

දිස්ත්‍රික්කය තුළ පවතින රෝහල්වලට හෙද නිලධාරීන් බෙදීයාම සම්බන්ධව ගැටලුවක් පවතින බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.10 ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

### 3.10.1 කලවාන මූලික රෝහලේ වෛද්‍යවරුන්ගේ හිඟය

රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන මූලික රෝහලේ මාස ගණනාවක සිට විශේෂඥ කායික වෛද්‍යවරයෙක්, විශේෂඥ ළමා වෛද්‍යවරයෙක්, විශේෂඥ සර්වාංග වෛද්‍යවරයෙක් සහ විකිරණවේදියෙක් නොමැති අතර මීට සති දෙකකට පමණ පෙර විශේෂඥ කායික වෛද්‍යවරයා සේවයට වාර්තා කළ බවත් රෝහලේ ගිලන් රථවල මාසික ඉන්ධන වියදම රු. මිලියන 02ක් පමණ වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, කලවාන මූලික රෝහලේ පවතින වෛද්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.10.2 වාර්ෂික ස්ථාන මාරුවීම් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම

වෛද්‍යවරුන් වෙත වාර්ෂික ස්ථාන මාරුවීම් ලබාදීමේ දී ඇතැම් වෛද්‍යවරුන් ස්ථාන මාරුවීම් ලද රෝහල වෙත වාර්තා නොකර වෘත්තීය සමිති මැදිහත්වීම් හරහා සේවයේ යෙදී සිටි ස්ථානයේම සේවය කරන බැවින් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේ දී තෙවන පාර්ශවයකට මැදිහත් වීමට ඉඩ නොදෙන ලෙසත් රේඛීය අමාත්‍යාංශය හරහා අදාළ ස්ථාන මාරුවීම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් ගැටලු ඇතිවන බවත් ස්ථාන මාරුවීම් හරහා ඇතැම් ආයතනවලින් වෛද්‍යවරුන් මුදා හැරීමේ දී එම ආයතනවල පවතින සේවා අවශ්‍යතාව අනුව එම මාරුවීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) - II විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොවන බව දන්වමින් පැමිණිලි ලදහොත් ඒ සම්බන්ධව පරීක්ෂා කර බලන බවත් මේ වන විට 2025 වර්ෂය සඳහා වන ස්ථාන මාරුවීම් ද ක්‍රියාත්මක කර ඇති බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) - II විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉදිරියේ දී පශ්චාත් සීමාවාසික පත්වීම් ද ලබාදීමට කටයුතු කරන බවත් මෙම වසරේ ඉදිරි මාස කිහිපය තුළ ඒ සඳහා කටයුතු කරන අතර එම අවස්ථාවේ දී අදාළ වර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමටද බලාපොරොත්තු වන බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) - II විසින් දැනුම් දෙන ලදී.

රත්නපුර ශික්ෂණ රෝහල වෙත ස්ථාන මාරුවීම් ලද එක් වෛද්‍යවරයකු රත්නපුර ශික්ෂණ රෝහල වෙත නොපැමිණෙන බවත් හැකි දෙයක් කරන ලෙස ප්‍රකාශ නිකුත් කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවැනි සිදුවීම් වේ නම් ඔවුන්ගේ තොරතුරු ලබාගෙන ඒ සම්බන්ධව පරීක්ෂා කර නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරින් වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.11 ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කිරීම - ගරු ජගත් මනුවර්ණ මහතා

මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි ගලහා, දෙල්තොට, තලාතුඔය ආදී සියලු රෝහල්වල බොහෝ අඩුපාඩු පවතින බවත් වෛද්‍යවරුන් නොමැතිවීම, වෛද්‍ය උපකරණ නොමැති වීම, පානීය ජල පහසුකම් නොමැති වීම ආදී බොහෝ ගැටලු පවතින අතර ඇතැම් රෝහල් වසා දැමීමට පවා ආසන්න බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අතීතයේදී වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වී පැවැති වෛද්‍ය මධ්‍යස්ථාන මේ වන විට වසා දමා ඇති අතර එම ගොඩනැගිලි ද අබලන්ව ගොස් ඇති බවත් ප්‍රතිකාර ගැනීම සඳහා වතු ආශ්‍රිත ප්‍රජාව ද මෙම ප්‍රාදේශීය රෝහල් වෙත පැමිණෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට වෛද්‍යවරුන්ගේ දැඩි හිඟයක් පවතින බවත් ප්‍රාදේශීය රෝහලක අනුමත වෛද්‍ය සංඛ්‍යාව 04 දෙනෙකු වුව ද වතු ආශ්‍රිත රෝහල්වල සහ පවරාගත් රෝහල්වල ද වෛද්‍යවරුන් දෙදෙනෙකු පමණක් සේවය කරන බවත් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය වර්ෂවල දී ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන් යටතේ ගලහා ප්‍රාදේශීය රෝහලට සහ දෙල්තොට ප්‍රාදේශීය රෝහලට හෙද නිලධාරින් පත් කිරීම, වෛද්‍ය උපකරණ ලබාදීම, ගොඩනැගිලි අලුත්වැඩියා කරදීම වැනි කටයුතු සිදුකළ බවත් ඇතැම් අවස්ථාවල දී උපරිම සේවාවක් සැපයීමට නොහැකි වීමේ ගැටලු මතුවන බවත් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

එම රෝහල් වෙත ලබා දුන් වෛද්‍ය උපකරණ රෝහල තුළ ස්ථානගත කිරීමේ අපහසුතාවය මත රෝහලේ එක් එක් ස්ථානවල ගොඩ ගසා ඇති බවත් අදාළ වෛද්‍ය උපකරණ ක්‍රියාත්මක කිරීමට හැකි කාර්යමණ්ඩලයක් නොමැතිවීම වැනි ගැටලු පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එවැනි ගැටලු හේතුවෙන් ජනතාව නගරයේ පවතින රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණීමේ දී එම රෝහල්වල ද තදබදයක් ඇතිවන බවත් ප්‍රාදේශීය රෝහල්වල ට පවතින පහසුකම් සුළු ප්‍රමාණයකින් හෝ වැඩි කිරීමෙන් නගරබද රෝහල්වල පවතින තදබදය ද අවම කරගත හැකි වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන්වලදී හදිසි ප්‍රතිකාර ඒකක සංකල්පයට (ETU Concept) අනුව හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපිත කළ බවත් ඇතැම් අවස්ථාවන්හිදී ගිලන් රථ නොමැතිවීමෙන් රෝගීන් අපහසුතාවයට පත්වන අවස්ථාද පවතින අතර වෛද්‍යවරුන් 02 පමණක් සිටින රෝහල්වල එක් වෛද්‍යවරයෙකු නිවාඩු ලබා ගත්විට වෙනත් වෛද්‍යවරයකු ලවා හෝ සේවාවන් සැපයීමට කටයුතු කරන බවත් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය රෝහල්වල වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බවත් වෛද්‍යවරුන් ලෙස නව පත්වීම් ලබාදීමේදී මෙම ප්‍රාදේශීය රෝහල් වෙත වෛද්‍යවරුන් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කර ඇති බවත් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

### 3.12 ගාල්ල ජාතික රෝහලේ පවතින ගැටලු - ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගාල්ල ජාතික රෝහලේ හෘද රෝග ඒකකය සහ හෘද උරස් රෝග (Cardiothoracic) ඒකකය සම්බන්ධව ගැටලු පවතින බවත් හෘද රෝග ඒකකයේ එන්ජියෝග්‍රෑම් යන්ත්‍රය අක්‍රීය තත්ත්වයේ පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොහෝ රෝගීන් සංඛ්‍යාවක් ප්‍රතිකාර ගැනීමට පැමිණෙන බවත් හෝල්ටර් මොනිටර් පද්ධති (Holter Monitoring System) 02ක්, Exercise ඊසීජී යන්ත්‍ර 01ක් හෝ 02ක් කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන බැවින් මේ සම්බන්ධව කඩිනම් පියවරක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, මෙම රෝහලේ හෘද උරස් රෝග ඒකකයේ හෘද උරස් රෝග නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන්ගේ (Cardiothoracic Consultant Anaesthetist) හිඟයක් පවතින අතරින් පවතින පුරප්පාඩු අනිවාර්යයෙන් පිරවිය යුතු බවත් එසේ නොවුණහොත් මීට අදාළ සැත්කම් සිදුකිරීමේ ප්‍රමාදයක් ඇතිවිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගාල්ල ජාතික රෝහලේ ස්වසන රෝග විශේෂඥ වෛද්‍යවරයා විසින් Sleep studies කිරීම සඳහා යොදා ගන්නා යන්ත්‍රයක් අත්‍යවශ්‍ය බව එම වෛද්‍යවරයා විසින් දැනුම් දී ඇති බැවින් මේ සම්බන්ධව කඩිනම් පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගාල්ල කරාපිටිය ජාතික රෝහලට හෘද කැතීටකරණ ඒකකයක් ලබාදීමට මෙම වසරේ සැලසුම්වලට ඇතුළත් කර ඇති බවත් හෘද උරස් රෝග නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන්ගේ (Cardiothoracic Consultant Anaesthetist) දැඩි හිඟයක් දිවයින පුරා රෝහල්වල පවතින අතර විදේශ පුහුණුවීම් අවසන්ව පැමිණෙන වෛද්‍යවරුන් අනුව මේ සඳහා තීරණයක් ලබාදිය හැකි බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සීමාවාසික පත්වීම් ලබා දීම හරහා වෛද්‍ය නිලධාරින් පිළිබඳ ගැටලුව විසඳිය හැකි බව ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම වසරේ ප්‍රසම්පාදන සැලැස්මට කරාපිටිය ජාතික රෝහලට හෝල්ට මොනිටර් පද්ධති (Holter Monitoring System) සහ Exercise ඊසීජී යන්ත්‍ර ලබාදීම ඇතුළත් කර ඇති බවත් හෘද කැතීටකරණ ඒකකයක් ලබාදීමට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණය අපේක්ෂාවෙන් සිටින බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.13 ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

### 3.13.1 වලස්මුල්ල මූලික රෝහලේ රසායනාගාරයට අවශ්‍ය යන්ත්‍ර ලබා දීම

වලස්මුල්ල මූලික රෝහලේ රසායනාගාරයේ පවතින යන්ත්‍ර දිගින් දිගටම අක්‍රිය වන අතර එම රෝහලේ Biochemistry Analyser, Tissue Processor සහ Coagulation analyzer යන යන්ත්‍ර නිසි පරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන්, මෙම රසායනාගාරය මඟින් රෝගීන්ට අවශ්‍ය පරීක්ෂණ කටයුතු නිසි වේලාවට සිදුකර ගැනීමට නොහැකිව ඇති බව එම රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දුන් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින් මෙම රෝහලට අවශ්‍ය රසායනාගාර යන්ත්‍ර ලබා දී මෙම ගැටලුව විසඳීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර විසඳුම් ලබාදීමට කටයුතු කරන බව දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.13.2 තංගල්ල මූලික රෝහල සඳහා සී.ටී.ස්කෑනර් යන්ත්‍රයක් (CT scanner) ලබාදීම

තංගල්ල මූලික රෝහලේ ප්‍රතිකාර කටයුතු සඳහා සී.ටී.ස්කෑනර් යන්ත්‍රයක අවශ්‍යතාවයක් පවතින බැවින්, එම අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වියදමට සාපේක්ෂව ප්‍රතිඵලදායී නොවන බැවින් ප්‍රතිපත්තිමය වශයෙන් මූලික රෝහල් සඳහා සී.ටී.ස්කෑනර් යන්ත්‍ර ලබා නොදෙන බව දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.14 ගරු චමින්ද ලලිත් කුමාර මහතා

### 3.14.1 මීරිගම රෝහලට අවශ්‍ය භෞතික සම්පත් ලබා දීම

මීරිගම රෝහලේ අඩුපාඩුකම් රැසක් පවතින අතර, එම රෝහලේ පවතින ගිලන්රථ 02ම නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඒවා අලුත්වැඩියා කිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා ප්‍රතිලාභ ලබාදෙන ලෙස හෝ බාහිර සම්පත් දායකයන්ගේ සහභාගිත්වයෙන් මෙම ගිලන්රථ

අලුත්වැඩියා කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, මෙම රෝහලේ පරිගණක උපාංගවල හිඟයක් පවතින බැවින් එම උපාංග ලබාදීමට කටයුතු කරන ලෙසත් ජපන් ආධාර යටතේ රෝහල් භූමි පරිශ්‍රයේ ඉදිකිරීම් ආරම්භ කල ගොඩනැගිල්ලේ වැඩකටයුතු නිම කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සෞඛ්‍ය සේවා අංශ මඟින් මෙම ගිලන්රථ අලුත්වැඩියා කිරීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමතිය ලබාගෙන අදාළ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා යම් කාලයක් ගතවන බවත් ගිලන්රථ අලුත්වැඩියාව සඳහා බාහිර පාර්ශවයන්ට ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බස්නාහිර පළාත තුළ සෞඛ්‍ය රියදුරන් 49ක හිඟයක් පැවතීම විශාල ගැටලුවක් බව බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මීරිගම රෝහලේ Online USP උපකරණ ගැටලුව විසඳීමට කොස්ගම රෝහලේ තිබූ Online USP උපකරණ 02ක් ලබා දුන් අතර ඉදිරියේ දී නව Online USP යන්ත්‍ර ලබාදීමට කටයුතු කරන බවත් චීන ආධාර යටතේ මීරිගම රෝහලේ ඉදිකරනු ලබන ශල්‍ය ඒකකය නුදුරේදීම විවෘත කිරීමට කටයුතු කරන බවත් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

බස්නාහිර පළාතේ පමණක් නොව තලාතුඔය රෝහලේ ගිලන්රථ සම්බන්ධයෙන් ද මෙවැනි ගැටලු පවතින බව මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු ජගත් මනුවර්ණ මහතා විසින් ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

වාහනවල ඇතිවන කුඩා ප්‍රමාණයේ නඩත්තු කටයුතු සිදු කිරීමට කුඩා නඩත්තු ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.14.2 මීරිගම පදිංචි අන්ධ පුද්ගලයෙකුට රජයෙන් වන්දි මුදල් ලබාදීම

කොවිඩ් කාල සීමාව තුළ දී වැරදි ඖෂධයක් ලබා දීම හේතුවෙන් අන්ධභාවයට පත් වූ මීරිගම ප්‍රදේශයේ තරුණයෙකුගේ නම වන්දි ලබාදීමේ ලේඛනයට ඇතුළත් කර නොමැති බැවින් ඒ සම්බන්ධව සාධාරණ පරීක්ෂණයක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අදාළ පුද්ගලයාගේ පියා දැනුවත් කර ඇති බවත් එම අන්ධභාවයට පත් පුද්ගලයාට අවශ්‍ය ප්‍රතිකාර ඉන්දියාවේ දී ලබා දීමට අමාත්‍යාංශය මඟින් සහයෝගය දැක් වූ බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.15 ඩෙංගු මර්දන ව්‍යාපාරයේ නියුතු සෞඛ්‍ය සේවකයන්ගේ වෘත්තීමය ගැටලු විසඳීම - ගරු අශෝක ගුණසේන මහතා**

ඩෙංගු මර්දන ව්‍යාපාරයේ නියුතු සෞඛ්‍ය සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිසි අවධානය යොමු කර නොමැති බැවින්, තම රැකියාව සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පවතින බවට එම සේවකයන් විසින් චෝදනා කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය සේවය තුළ 7000ක පමණ පිරිසක් මෙම තත්ත්වයේ සිටින බවත් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් මඟින් ඔවුන්ගේ රැකියා සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට තවත් මාස 03කට වැඩි කාලයක් ගතවනු ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.16 ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**

**3.16.1 කුරුණෑගල ශික්‍ෂණ රෝහලේ වාර්ෂික ස්ථාන මාරුවීම්**

කුරුණෑගල ශික්ෂණ රෝහලේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා යම් වෘත්තීය සමිතියක් මඟින් බලපෑම් සිදුකරන බවට එම රෝහලේ වෛද්‍යවරුන් විසින් චෝදනා කරනු ලබන බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර මෙම ගැටලුව විසඳීමට පියවර ගන්නා බව සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.16.2 කුලියාපිටිය ශික්ෂණ රෝහලට අවශ්‍ය භෞතික සම්පත් ලබාදීම**

කුලියාපිටිය ශික්ෂණ රෝහල තුළ ඇසේ සුද ඉවත් කිරීමේ සැත්කම් (Cataract Surgery) සිදුකිරීම සඳහා භාවිත කරන Phacoemulsification යන්ත්‍රය (Phaco machine) කල් ඉකුත්වීම හේතුවෙන් එම සැත්කම් නතර කිරීම නිසා රෝගීන් දැඩි අපහසුතාවට පත්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම Phacoemulsification යන්ත්‍රය (Phaco machine) අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පවතින බවත් මේ සඳහා නව යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා මෙම වසරේ දී ප්‍රතිපාදන ලබාදිය හැකි නමුත් ඒ සඳහා යම් කාලයක් ගතවන බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.17 රටේ පවතින ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාවන් දියුණු කිරීම - ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**

රජරට සේවය වැනි ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාවන් දියුණු කිරීම සම්බන්ධයෙන් ගුවන් විදුලි සංස්ථාව සතුව යම් සැලසුමක් පවතී ද යන්න පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම, රජරට ප්‍රදේශයේ සිටින සම්පත්දායකයින්ට මෙන්ම රජරට ප්‍රදේශයේ පාසල්වල ජනමාධ්‍ය ඒකකවල සිටින දක්ෂතා සහිත සිසුන්ට, රජරට ගුවන් විදුලි සේවය හා නිල වශයෙන් සම්බන්ධ වීමට සැලසුමක් සකස් කරන ලෙසත් නිර්මාණශීලීත්වය වැඩි කිරීම තුළින් ගුවන් විදුලි සංස්ථාව වෙත ජනතාව ආකර්ෂණය කර ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාවන් අහෝසි කිරීමට සහ ඇතැම් ගුවන්විදුලි සේවාවන් ඒකාබද්ධ කිරීමට යම් කාලයකට පෙර තීරණය කර තිබුණ ද මෙම සේවාවන්හි අවශ්‍යතාවය මත තවදුරටත් ඒවා පවත්වාගෙන යන බවත් වර්තමානයේ ද පාසල් ජනමාධ්‍යය ඒකක හා සම්බන්ධ වෙමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර රජරට සේවය වැනි ප්‍රාදේශීය සේවාවන් දියුණු කිරීමට මේ වන විටත් සැලසුම් සකස් කරමින් සිටින බවත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සේවක හිඟය, දේපල කළමණාකරණය, අතරමඟ නවතා දමා තිබූ ඉදිකිරීම් ආදී ගැටලු පවතින අතර ගැටලු මධ්‍යයේ බාහිර සම්පත්දායකයින්ගේ ද සහභාගීත්වයෙන් මාධ්‍ය ඇකඩමි පවත්වාගෙන යාම සිදු කරන බවත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ද දායක කරගනිමින් ප්‍රවීණයින්ගේ සහ පාසල් ජනමාධ්‍ය ඒකකවල ද සහය ලබා ගනිමින් රජරට සේවය දියුණු කිරීමට හා එය තරුණ ප්‍රජාව අතරට ගෙන යාමටත් හැකි බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රජරට සේවය දියුණු කිරීම සඳහා ඒ වෙනුවෙන්ම කැපවී සිටින එම ප්‍රදේශයේ පුද්ගල කණ්ඩායම්, සම්පත් ආදිය යොදාගැනීම සඳහා නිල ව්‍යුහයක් සකස් කර දෙන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පාසල් ජනමාධ්‍ය ඒකක සම්බන්ධ කරගනිමින් රජරට සේවයේ ව්‍යාපෘති ක්‍රියාත්මක වන නමුත් ඊට අදාළ කටයුතුවලට සහභාගී වීමට එක් වාහනයක් හෝ නොමැති බව ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රජරට සේවයට පමණක් නොව සියලුම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවා දියුණු කිරීමට සැලසුම් සකස් කරන ලෙසත් ස්වාධීන රූපවාහිනී සේවය සතුව විකාශන අයිතිය ඇති වැඩසටහන් වෙනත් යූටියුබ් නාලිකාවල ප්‍රදර්ශනය කිරීම සිදුවන බැවින් එය වැළැක්වීමට පියවර ගන්නා ලෙසත් ගරු ජගත් මනුවර්ණ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

විකාශය කරනු ලබන වැඩසටහන් සඳහා ස්වාධීන රූපවාහිනිය සතුව මීට වසර 05කට පෙර ඩිජිටල් අයිතිය නොතිබූ නමුත් මේ වන විට සියලුම වැඩසටහන් සඳහා ඩිජිටල් අයිතිය ලබාගෙන ඇති බැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර එවැනි ක්‍රියාකාරකම් වැළැක්වීමට පියවර

ගන්නා බව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, ගුවන් විදුලි සංස්ථාවේ විකාශන කටයුතු සිදු කිරීමට විශාල භූමි අවකාශයක් අවශ්‍ය නොවන බැවින් ගුවන් විදුලි සංස්ථාව පිහිටා ඇති ස්ථානයේ පවතින භූමි ප්‍රමාණය වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට පියවර ගන්නා ලෙස ගරු ජගත් මනුවර්ණ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගුවන් විදුලි නාලිකා 14ක් ඇතුළුව රටේ සියලුම ගුවන් විදුලි නාලිකා මෙහෙයවන ගුවන් විදුලි ජාලය මෙම ආයතනය සතු වන බැවින් ගුවන් විදුලි සංස්ථාවට අයත් දේපළ යොදා ගනිමින් විවිධ ව්‍යාපෘති දියත් කිරීමට සැලසුම් කර ඇති බව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතුව පවතින ජංගම විකාශන යන්ත්‍ර සංඛ්‍යාව පිළිබඳව ගරු ජගත් මනුවර්ණ මහතා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතුව පවතින ජංගම විකාශන යන්ත්‍ර 02ක් පවතින බවත් ඒවායේ තත්ත්වය දුර්වල මට්ටමක පවතින බවත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට රජය සතුව පවතින මාධ්‍ය ආයතන ඉතා පහළ මට්ටමක පවතින බවත් අනෙකුත් පුද්ගලික අංශයේ මාධ්‍ය නාලිකාවල විකාශනය කරනු ලබන වැඩසටහන්වල ශ්‍රේණිගතකිරීම් (Ratings) ආදිය සම්බන්ධව සැලකීමේ දී රජයේ මාධ්‍ය ආයතනවලට ඒවා සමඟ තරඟ කිරීම අපහසු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය අංශයේ මාධ්‍ය ආයතනවලින් ද ගුණාත්මක තත්ත්වයේ වැඩසටහන් විකාශය කරන්නේ නම් ශ්‍රේණිගතකිරීම් (Ratings) වැඩිකරගත හැකි බව ගරු රුවන් මාපලගම මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.18 සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ විෂය පථය පුළුල් බව - ගරු රුවන් මාපලගම මහතා**

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය යන ක්ෂේත්‍ර 02 තුළම විශාල ගැටලු සංඛ්‍යාවක් පවතින අතර පැය 02ක පමණ කාලයක් තුළ එම ගැටලු සියල්ලම සාකච්ඡා කළ නොහැකි බැවින් සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව සාකච්ඡා කිරීමට එක් දිනයක් සහ ජනමාධ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව සාකච්ඡා කිරීමට එක් දිනයක් යන ලෙසින් දින 02කදී සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පැවැත්වීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා සහ ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා විසින් ද අදහස් පළ කරනන ලදී.

මීළඟ අමාත්‍යාංශයීය උපදේශ කාරක සභාව තුළ සෞඛ්‍ය හා ජනමාධ්‍ය යන ක්ෂේත්‍ර දෙක සම්බන්ධව වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කිරීමට

කටයුතු කරන බවත් ගරු මන්ත්‍රීවරුන් සතු බොහෝ ගැටලු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මඟින් විසඳා ගැනීමට හැකියාව පවතින බැවින්, ජාතික මට්ටමේ ගැටලු පමණක් මෙම කාරක සභාවේ දී සාකච්ඡා කිරීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.19 රජයේ රෝහල් හරහා ආදායම් උත්පාදනය - ගරු රවී කරුණානායක මහතා**

පෞද්ගලික අංශයේ රෝහල්වල පවතින යන්ත්‍ර සූත්‍ර හා සමාන යන්ත්‍ර සූත්‍ර රජයේ ඇතැම් රෝහල්වල පවතින බැවින්, එවැනි රජයේ රෝහල් පැය 24 පුරා ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම තුළ විශාල ආදායමක් උපයාගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රජයේ රෝහල් තුළ සාමාන්‍ය සේවා සපයන වේලාවන් වලින් පසු හෘද ශල්‍යකර්ම, ඉන්ද්‍රිය බද්ධ කිරීම් වැනි දෑ සිදු කිරීමට සාකච්ඡා කර ඇති බවත්, තම සේවා කාලයෙන් පසුව රාජකාරී කටයුතුවල නිරත වන රෝහල් කාර්යමණ්ඩලය සඳහා ජනාධිපති අරමුදලින් මුදල් ලබාදීමට සැලසුම්කර තිබෙන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව 04.20 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**පරිසර කටයුතු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 05**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (සභාපති)
ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍ය)
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු මනෝජ් රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා
ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
ගරු නලින් හේවගේ මහතා
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු තනුර දිසානායක මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු ඊ. එම්. බස්නායක මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු දේවානන්ද සුරවීර මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2022 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව**
(2025.01.21 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2022 වර්ෂය සඳහා ජී. එස්. එම්. බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව**
(2025.01.21 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.3 2022 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව**
(2025.02.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.4 2023 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.5 2023 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.6 2023 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
(2025.01.22 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය

සාධන වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ ජල සම්පත් මණ්ඩලය යන භාණ්ඩාගාරය මඟින් මුදල් ලබා ගෙන ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන මෙන්ම භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා ක්ල්යිමේට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ රාජ්‍ය දැව සංස්ථාව යන ස්වයං මූල්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන වලින් පරිසර අමාත්‍යාංශය සමන්විත වන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2025 අයවැය තුළින් පරිසර අමාත්‍යාංශය සම්බන්ධයෙන් මාර්තු 15 වැනි දින සාකච්ඡා කිරීමට නියමිත බවත් මෙම අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් එහිදී වැඩිදුරටත් තොරතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තව ද, මෙම ආයතන තුළ පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යවස්ථාපිත අරමුදල් ලෙස කැලෑ දෙපාර්තමේන්තු අරමුදල සහ වනජීවී සංරක්ෂණ අරමුදලත්, අමාත්‍ය මණ්ඩල අනුමතිය යටතේ පිහිටුවන ලද අරමුදල් ලෙස සත්වෝද්‍යාන සුබසාධක සහ සංවර්ධන අරමුදල, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ වෙරළ සංරක්ෂණ ත්‍යාග අරමුදල යන අරමුදල් පිහිටුවා ඇති බවත් මෙකී අරමුදල් තවදුරටත් භාවිත කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමඟ මේ වන විට සාකච්ඡා පවත්වන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙහිදී, පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධව කෙටි හැඳින්වීමක් සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් එකී ආයතනවල ප්‍රධානීන්හට දැනුම් දෙන ලදී.

ඒ අනුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වන සංරක්ෂණ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය සහ ජල සම්පත් මණ්ඩලය පිළිබඳව එම ආයතනවල සභාපතිවරුන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂ ජනරාල් (රා.අ), ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව පිළිබඳව එම ආයතනවල අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.), සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම පිළිබඳව එම ආයතනයේ ජ්‍යෙෂ්ඨ භූවිද්‍යාඥ, රාජ්‍ය දැව සංස්ථාව සම්බන්ධයෙන් එම ආයතනයේ සාමාන්‍යාධිකාරී/

ප්‍රධාන විධායක නිලධාරී, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පිළිබඳව එහි කළමනාකරු (මෙහෙයුම්) රා.ඉ සහ ශ්‍රී ලංකා ක්ල්යිමේට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එම ආයතනයේ සත්‍යාපන විධායක, සහකාර කළමනාකරු (වැ.බ.) විසින් ද දැනුවත් කිරීම් සිදු කරන ලදී.

## 3. වෙනත් කරුණු

### 3.1 මඩකලපුව වාහර ප්‍රදේශයේ ගොවීන්ගේ වගා භූමි සම්බන්ධ ගැටලුවට විසඳුම් ලබා දීම - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

වසර 30ක පමණ කාලයක සිට වගා කටයුතු සිදු කරන මඩකලපුව වාහර ප්‍රදේශය, වන සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස සඳහන් කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින් විසින් එම ප්‍රදේශයේ වගා කරන ලද ගොවීන්ට තර්ජනය කර අමානුෂීය ලෙස සලකමින් ඔවුන්ගේ වගාවන් විනාශ කිරීමට කටයුතු කර ඇති බැවින්, එම සිදුවීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම සහ පොලිසිය දැනුවත් කර ඉඩම් නිදහස් කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කළ ද ඒ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාර නොලැබුණ බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වර්තමාන රජය විසින් රටේ දේශීය නිෂ්පාදනය වැඩිකිරීමට උත්සාහ දරන පසුබිමක් තුළ මෙවැනි ක්‍රියාකාරකම් එයට බාධාවක් වන බැවින්, මෙවැනි ක්‍රියාකාරකම් වැළක්වීමට සහ මෙම අගතියට පත් ගොවීන්ට සහනයක් ලබා දීමට පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වාහර ප්‍රදේශයේ පමණක් නොව මඩකලපුව දිස්ත්‍රික්කය තුළ බොහෝ ස්ථානයන්හි මෙම ගැටලුව සුලබව පවතින බැවින් එම ගැටලු විසඳීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ වන සංරක්ෂණ නිලධාරින් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් අවශ්‍ය බවත් මෙම නිලධාරින්ගේ ආකල්පමය වෙනසක් සිදුවිය යුතු බවත් ගරු අරුන් හේමචන්ද්‍ර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වනාන්තර තුළ පිහිටි වනාන්තර නොවන භූමි හඳුනාගෙන, වන සංවරණ සහ වන සංරක්ෂණ කටයුතුවලට බාධා නොවන පරිදි එම භූමි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් බැහැර කිරීමට කටයුතු කරන බවත් මෙම ගොවීන්ට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් සොයා බලා ඔවුන්ට සහනයක් සැලසීමට කටයුතු කරන බවත් වන සංරක්ෂණ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.2 ගරු අරුන් හේමචන්ද්‍ර මහතා

#### 3.2.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම් සඳහා විසඳුම් ලබාදීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම් බහුලව පවතින බැවින් එයට විද්‍යාත්මක විසඳුමක් සොයා ගැනීමට පරිසරවේදීන් වැනි බාහිර

පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට වඩාත් ප්‍රායෝගික විසඳුම් ලබාදිය යුතු බවත් මෙම ගැටලුවට එක් විසඳුමක් ලෙස මඩකලපුව දිස්ත්‍රික්කය තුළ වනජීවී කලාපයක් (Wild Life Range) ඇති කිරීමට කටයුතු කළ හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් එම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සේවාවන් ලබා ගැනීමේ දී ජනතාව අපහසුතාවයට පත්වන්නා සේම වන ජීවීන්ට ද හානි සිදුවන බැවින් මෙම ගැටලුව සම්බන්ධව සලකා බලන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ 50%ක සේවක මණ්ඩලයක් පමණක් රාජකාරියේ නියුතු බවත් දැනට සිටින සේවක පිරිස දිවයින පුරා අලි මිනිස් ගැටුම් ඇති ස්ථානවල සේවයේ යෙදෙන බැවින් එම කාර්යන්හි යෙදීමේ දී ප්‍රායෝගික ගැටලු පැන නගින බවත් වනජීවී අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම මානව සම්පත වැඩි කර ගැනීමට හැකියාව ලදහොත් අදාළ ප්‍රදේශවල කාර්යාල සඳහා වැඩි සේවක පිරිසක් අනුයුක්ත කළ හැකි බව ද වනජීවී අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් දැනුම් දෙන ලදී.

### 3.2.2 මඩකලපුව දිස්ත්‍රික්කය තුළ වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

පසුගිය සමයේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ නීති විරෝධී වැලි කැණීම් වළක්වාලීමට කටයුතු කිරීම හේතුවෙන් වැලි හිඟයක් ඇති වූ බැවින්, මෙම ප්‍රදේශයේ වැලි කැණීම සඳහා බලපත්‍ර ලබා දීමේ දී අදාළ පාර්ශවයන් (stake holders) සමඟ සාකච්ඡා කොට වඩාත් නීත්‍යානුකූල ලෙස විනිවිදභාවයකින් යුක්තව එම කාර්ය සිදු කළ යුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.2.3 නැගෙනහිර පළාත තුළ ඛනිජ වැලි ගවේෂණය හා කැණීම් විධිමත් කිරීම

පසුගිය කාලය තුළ නැගෙනහිර පළාතේ ඛනිජ වැලි ගවේෂණය සහ කැණීම සඳහා බලපත්‍ර ලබා දීමේ දී එම ක්‍රියාවලීන් මඟින් සිදුවන පරිසර හානි සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු නොකරන ලද බැවින්, මෙතෙක් නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන් නැවත සලකා බැලීමට කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, මෙම ගැටලුව ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලට පමණක් නොව දිවයින පුරා විවිධ ස්ථානවලට ද අදාළ වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

**3.3 ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි ප්‍රමාදයකින් තොරව සැපයීම - ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**

පරිසර පද්ධතියට සිදුවන හානි අවම කිරීමට අනවසර වැලි කැණීම් සහ ගංභාවලින් වැලි ගොඩ දැමීම් නතර කිරීම හේතුවෙන්, වැලි මිල ඉහළ යාමෙන් ඉදිකිරීම් කර්මාන්තය පසුබෑමකට ලක්ව ඇති බැවින් මෙම ගැටලුවට විකල්ප විසඳුමක් ලෙස මුහුදු වැලි ගොඩ දැමීම සිදු කිරීම සඳහා අවසර ලබා ගැනීමේ දී භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් ඒ සඳහා කාර්යක්ෂමව ප්‍රතිචාර නොදැක්වීම විශාල ගැටලුවක් බවට පත්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, පරිසර පද්ධතිය සුරකිමින්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ කටයුතුවලට ප්‍රමාණවත් ලෙස අවම මිලකට වැලි සැපයීම සඳහා ප්‍රමිතියකට අනුව වැලි ගොඩ දැමීම මෙන්ම එය නියාමනය කිරීම සම්බන්ධයෙන් මේ වන විට පවතින පනත් සක්‍රීය කිරීමටත්, මුහුදු වැලි ඉහළ ධාරිතාවයකින් යුතුව ගොඩ දැමීමට අවශ්‍ය ඉඩකඩ ලබා දීමටත් මෙම අමාත්‍යාංශය විසින් මැදිහත්වීම් සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පාරිසරික ගැටලු ඇතිවීම වැළක්වීමේ අරමුණින් ගංභාවලින් වැලි ගොඩ දැමීම සඳහා ලබා දෙන බලපත්‍ර සීමා කළ බවත් මෙම ගැටලුව විසඳීමට අදාළ සියලුම පාර්ශව සමඟ සාකච්ඡා කර කෙටිකාලීන සහ දිගු කාලීන විසඳුම් සහිත සැලසුමක් සකස් කර ඇති බවත් භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ සාකච්ඡා කර මුහුදු වැලි ගොඩ දැමීමට අවසර ලබා දීම සම්බන්ධව ඇති ක්‍රියාවලිය වේගවත් කිරීමටත් 5%ක් පමණ වන මුහුදු වැලි භාවිතය 20 - 25% අතර ප්‍රමාණයකින් ඉහළ දැමීමට සහ ගංභාවලින් ලබා ගන්නා වැලි ප්‍රමාණය 50%කින් පමණ අඩු කිරීමටත් ක්‍රමානුකූලව පියවර ගැනීමට සැලසුම් කර ඇති බව භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**3.4 අම්පාර තිරුක්කෝවිල් වෙරළ ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම - ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

අම්පාර තිරුක්කෝවිල් වෙරළ ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා ඕස්ට්‍රේලියානු සමාගමක් වන "දම්සිලා" ආයතනයට අවසර දී තිබූ බවත් වැලි කැණීම් හේතුවෙන් විශාල පාරිසරික බලපෑමක් සිදුවන බැවින් එම ප්‍රදේශයේ ජනතාව ඒ සඳහා විරෝධය දක්වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෙරළ තීරයේ කැණීම් සිදු කිරීම හේතුවෙන් 15,000ක පමණ ජනතාවක් ජීවිකාව වශයෙන් සිදු කරන සංචාරක කර්මාන්තයට බාධා සිදුවන බවත් සුනාමි අවස්ථාවක් ඇති වුවහොත් එහිදී විශාල හානියක් සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම කැණීම් හේතුවෙන් මත්ස්‍යයන් බිත්තර දමන කොරල්පරවලට හානි සිදුවීමෙන් මත්ස්‍ය කර්මාන්තයට බාධා සිදු වී එම කර්මාන්තයේ නිරතවන පවුල් 8,000 - 10,000 අතර ප්‍රමාණයකට තම ජීවනෝපාය අහිමිවන බවත් කඩොලාන ආශ්‍රිත වගාවන්වලට ලුණු සහිත ජලය මිශ්‍රවීමෙන් එම වගාවන් විනාශ වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තව ද, මෙම ව්‍යාපෘතිය සඳහා එවකට අවසර ලබා දුන් රාජ්‍ය නිලධාරියා වර්තමානයේ "දම්සිලා" ආයතනයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරන බැවින් ඒ සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින් මෙම ගැටලුව විසඳීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වසර 10කට පමණ පෙර "දම්සිලා" ආයතනයට ඛනිජ වැලි ගවේෂණ බලපත්‍රයක් ලබා දී ඇති බවත් එය අවසන් වූ පසු වසර 02ක් ඇතුළත එම සමාගම විසින් කැණීම් බලපත්‍රයක් ලබා ගත යුතු බවත් භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා ඉඩමේ අයිතිය ලබා ගැනීම මෙන්ම සම්පූර්ණ පාරිසරික වාර්තාවක් ඉදිරිපත් කිරීම ද අවශ්‍ය වන බවත් එම අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළහොත් එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තම ආයතනය ඉදිරියට කටයුතු නොකරන බවත් භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

පාරිසරික බලපෑම් සිදුවන කිසිදු අවස්ථාවක ඛනිජ වැලි කැණීමේ බලපත්‍ර ලබා නොදෙන බවත් නීත්‍යානුකූල නොවන කැණීම් කටයුතු වළක්වාලීමේ පියවරක් ලෙස කැණීම් සිදුවන ඕනෑම ස්ථානයක නීත්‍යානුකූල බව තහවුරු කර ගැනීමට, එම ස්ථාන සිතියම් ගත කර ඇති යෙදවුමක් (App) නිර්මාණය කිරීම ආරම්භ කර ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා ඛනිජ වැලි ගවේෂණය සම්බන්ධයෙන් ද දත්ත ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව සම්බන්ධයෙන් ලිඛිතව තොරතුරු ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

### 3.5 භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කාර්යභාරය - ගරු දේවානන්ද සුරවීර මහතා

වසර 30ක පමණ කාලයක් මුළුල්ලේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ක්‍රියාත්මක වන බැවින් මෙරට ඛනිජ වැලි ගවේෂණය සහ කැණීම් සම්බන්ධයෙන් මෙන්ම රටෙහි ආර්ථිකය දියුණු කිරීමට එම ඛනිජ සම්පත් උපයෝගී කරගැනීම සම්බන්ධයෙන් මෙම කාර්යාංශය මඟින් මෙතෙක් සිදු කරන ලද සමීක්ෂණ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තව ද, 2005 වර්ෂයේ දී පමණ තිරුවානා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නිකුත් කරන ලද බවත් එහි තිරුවානා ටොන් එකක මිල රු. 310/-ක් බැගින් වන අතර අගය එකතු කළ විට (value added) එම අගය වැඩි විය යුතු වුව ද මේ වන විට ද තිරුවානා ටොන් එකක මිල රු. 310/- අගයේම පවත්වාගෙන යන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආයෝජන සඳහා පැමිණෙන විදේශකයන්ගේ බලපත්‍ර අලුත් කිරීම් වැනි කටයුතු මෙම කාර්යාංශය මඟින් සිදු නොකරන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

රටේ දියුණුව වෙනුවෙන් විශාල දායකත්වයක් සැපයිය හැකි මෙවැනි ආයතනයක් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

රටෙහි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කරන වැලි ප්‍රමාණය සහ එම වැලි භාවිත කළ හැකි කාලසීමාව යනාදී කරුණු ඇතුළත් මෙරට භූගත සම්පත් සම්බන්ධයෙන් පවතින අධ්‍යයනයන් පිළිබඳව මෙන්ම භූගත සම්පත් සම්බන්ධයෙන් ඇති ගැටලුවලට භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් ලබා දෙන විසඳුම් සම්බන්ධයෙන් ගරු ඊ. එම්. බස්නායක මහතා විසින් විමසීමක් කරන ලදී.

භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වැඩකටයුතු වඩා ඵලදායි ලෙස සිදු කිරීම සඳහා එම ආයතනය ප්‍රතිව්‍යුහගත කළ යුතු බවට යෝජනාවක් ඉදිරිපත් වී ඇති බවත් මෙම ආයතනයේ ඉදිරි කාර්යයන් සම්බන්ධයෙන් තීරණය කිරීමට කමිටුවක් පත් කර තිබෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ලෝකයේ ඛනිජ හැසිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමට සහ දැනට රේඛීයව සිදු කරන ඛනිජ හිමිකාරිත්වය සඳහා කරනු ලබන අය කිරීම් (Royalty), ලෝකයේ සම්මත ක්‍රමය වන චක්‍රාකාරයෙන් සිදු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය තුළ හෝ භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය තුළ ඛනිජ බුද්ධි ඒකකයක් (mineral intelligence unit) පිහිටුවීමට කටයුතු කරන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

තිරුවානා සඳහා අගය එකතුකර පවතින මිල වන රු. 310/-ට වඩා ඉහළ මිලක් ලබා දීමට කටයුතු කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශයීය මට්ටමින් උපදේශක කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඛනිජ සම්පත්වල භාවිතය සහ ඒවායේ මිල මෙන්ම ආයෝජකයන්ගේ බලපත්‍ර අලුත් කිරීම ආදී ගැටලු සඳහා විසඳුම් ලබා දීමට මේ වන විටත් පියවර ගනිමින් සිටින බව භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.6 වනජීවීන් කළමනාකරණය - ගරු සුදත් බලගල්ල මහතා

වන අලි ඇතුළු වනජීවීන්ගේ ගැටලු හේතුවෙන් තම ප්‍රදේශය තුළ දේපළ හානි මෙන්ම ජීවිත හානි ද සුලභව සිදුවන බැවින් ඒ

සම්බන්ධයෙන් පුළුල්ව සාකච්ඡා කර මෙම ගැටලුව විසඳීමට සුදුසු පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනජීවීන් සංරක්ෂණයට කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් මෙන්ම අප රටේ පරිසර පද්ධතියට ගැළපෙන පරිදි වනජීවීන් කළමනාකරණය සඳහා වැඩි අවධානය යොමු කළ යුතු බවත් වනජීවීන් සහ මිනිසුන් අතර පවතින මෙම ගැටුම් විසඳීමට කෙටිකාලීන, මැදිකාලීන මෙන්ම දිගුකාලීන පියවරයන් ගත යුතු බවත් ගරු සුසන්ත කුමාර නවරත්න මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වන අලි, මොනරු, දඬු ලේනුන් සහ රිළව් ආදී සතුන්ගෙන් වගාවට සිදුවන හානි වැළක්වීමට ගොවීන් විසින් විවිධ වූ අවිධිමත් ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් වන සතුන්ගේ ජීවිතවලට හානි වීමේ ප්‍රවණතාවක් පවතින බැවින් සත්ත්ව ගහනය අඩු කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මැදිහත්වීම් සිදු කරන ලෙස ගරු ජගත් මනුවර්ණ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

මහනුවර දිස්ත්‍රික්කයේ වන සතුන්ගෙන් සිදුවන වගා හානි බහුලව දැකිය හැකි බැවින්, මෙම සතුන් සම්බන්ධයෙන් යම් සංගණනයක් පවතී ද යන්න පිළිබඳව සහ මොනරු, රිළව්, ඌරන් සහ ඉත්තෑවන් වැනි සතුන් කළමනාකරණය සඳහා ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගරු ඊ. එම්. බස්නායක මහතා විසින් විමසීමක් කරන ලදී.

කඳුකර කොටි ගහනය සම්බන්ධයෙන් පවතින ගැටලුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු 03කදී ඉදිරිපත් කළ ද ඒ සම්බන්ධයෙන් සාකච්ඡාකර තීරණ ගැනීම සඳහා වගකිවයුතු නිලධාරියෙකු එම රැස්වීමට සහභාගී නොවූ බැවින් එම ගැටලුවට විසඳුමක් ලබා ගැනීමට එම අවස්ථාවේ දී නොහැකි වූ බව ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තම ආයතනය ලාභ උපයන ආයතනයක් බවත් මෙම ආයතනය තුළ පවතින සේවක ඌනතාවය හේතුවෙන් වනජීවීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ දී ගැටලු පැන නැගී ඇති බවත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වනජීවීන් සම්බන්ධ ගැටලුවල දී එකිනෙකා හා සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතු ආයතන කිහිපයක සම්බන්ධීකරණය නොමැති වීමෙන් මෙම ගැටලුවලට නිසි විසඳුම් ලබා දීමට නොහැකි වී ඇති බව ද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් දැනුම් දෙන ලදී.

කඳුකර කොටීන්ගේ වාසභූමි ඛණ්ඩනය වීම (habitat fragmentation) හේතුවෙන් මෙම සතුන් වගා ප්‍රදේශවලට පැමිණෙන බවත් මෙම ගැටලුව විසඳීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ මීට අදාළ අනෙකුත් ආයතන ද ඒකාබද්ධවී කටයුතු කළ යුතු බවත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් දැනුම් දෙන ලදී.

වනජීවී සංරක්ෂණය ඉතා පුළුල් විෂය පථයක් වන අතර එහිදී වඳ වී යන සතුන් සහ ශාකවල ගහණය ඉහළ දැමීමට සහ අනෙකුත් වනජීවීන්ගේ ගහනය පාලනය කිරීම සිදු කළ යුතු බවත් මෙම කටයුතු කිරීමේ දී ප්‍රතිපත්තිමය සහ නීතිමය කරුණු කාරණා සැලකිල්ලට ගත යුතු බවත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

රාජ්‍ය දැව සංස්ථාව මඟින් අනුරාධපුර කහටගස්දිගිලිය ප්‍රදේශයේ වනාන්තර ඉවත් කර ආර්ථික වටිනාකමක් සහිත "කායම්" නම් ශාක විශේෂය අක්කර 75ක වගා කරන බැවින් එමඟින් සිදුවන පාරිසරික බලපෑම සැලකිල්ලට ගනිමින් මේ ආකාරයෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනවල එකතුවෙන් වනජීවීන්ගේ පෝෂණ අවශ්‍යතා සඳහා අවශ්‍ය ශාක වගා කිරීමේ "පරිසර සුපෝෂණ" වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසත් ගරු සුසන්ත කුමාර නවරත්න මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

රිළවුන් වැනි වනජීවීන්ගෙන් සිදුවන හානි වැළක්වීම සඳහා දීර්ඝ කාලීන විසඳුමක් ලෙස යොදාගත හැකි අපද්‍රව්‍යය කළමනාකරණය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරන ලෙස ගරු ජගත් මනුවර්ණ මහතා විසින් ද ඉල්ලීමක් කරන ලදි.

මේ වන විට වනජීවීන් පලවා හැරීමට විවිධ තාක්ෂණික උපකරණ වාණිජ මට්ටමින් නිෂ්පාදනය කර ඇති බවත් එම උපකරණ නිෂ්පාදකයින් සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් මෙම උපකරණ භාවිතා කරමින් වඩාත් ඵලදායී විසඳුම් ලබා ගත හැකි බව ගරු අසෝක සපුමල් රන්වල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වඳුරන්, රිළවුන් වැනි වනජීවීන් සම්බන්ධ ගැටලු කෘෂිකාර්මාන්තයට මෙන්ම සාමාන්‍ය ජන ජීවිතයට ද බලපෑම් සිදු කරන බැවින් මේ සම්බන්ධ දැනුම ඇති පාර්ශවයන් මෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් මෙම ගැටලුව සඳහා කඩිනම් විසඳුම් ලබා දීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.7 ගරු තනුර දිසානායක මහතා

### 3.7.1 පාසල් ආශ්‍රිතව පිහිටා තිබෙන අනතුරුදායක ගස් ඉවත් කිරීම

පාසල් ආශ්‍රිතව පිහිටා තිබෙන අනතුරුදායක ගස් ඉවත් කිරීමේ දී රාජ්‍ය දැව සංස්ථාව මඟින් ගනු ලබන ක්‍රියාපටිපාටිය සඳහා යම් කාලයක් ගත වන බැවින් වඩාත් කාර්යක්ෂමව මෙම කටයුතු සිදු කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.7.2 හුණුගල් ආශ්‍රිත කර්මාන්ත සඳහා බලපත්‍ර ලබා ගැනීම

හුණුගල් ආශ්‍රිත කර්මාන්ත සඳහා ඛනිජ බලපත්‍ර රාශියක් මෙන්ම එම නිෂ්පාදන ප්‍රවාහනය සඳහා ද බලපත්‍ර ලබා ගැනීමට සිදුවීමෙන් දේශීය කර්මාන්ත සඳහා විශාල බලපෑමක් ඇති වී තිබෙන බැවින් මෙම

ගැටලුව සම්බන්ධයෙන් කරුණු සොයා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.7.3 මල් වර්ග ආනයනය නියාමනය කිරීම**

රට පුරා විවිධ සැරසිලි සඳහා භාවිත කළ හැකි මල් වර්ග විශාල ප්‍රමාණයක් පවතින බැවින් මල් වර්ග ආනයනය කිරීම නියාමනය සඳහා රේඛීය අමාත්‍යාංශය මඟින් ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

**3.7.4 අත්අඩංගුවට ගනු ලබන නීති විරෝධී දැව අලෙවිය**

නීති විරෝධී දැව අත්අඩංගුවට ගෙන නඩු භාණ්ඩ ලෙස තබා ගැනීමේ දී කාලයත් සමඟ දිරාපත් වන බැවින්, එම දැව වෙන්දේසිකර එමඟින් ලැබෙන මුදල් රජයේ බැංකු ගිණුමක තැන්පත් කිරීමෙන් පසු අදාළ නඩු ක්‍රියාවලිය අවසානයේ ජයග්‍රහණය කරනු ලබන පාර්ශවයට එම මුදල ලබා දීමට කටයුතු කිරීමේ නෛතික හැකියාවක් පවතී ද යන්න සම්බන්ධයෙන් සොයා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.8 වන අලි හානි සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබා දීම - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ වන අලින්ගෙන් සිදුවන වගා හානි වැළැක්වීම සඳහා මේ වන විට තාවකාලික විසඳුම් ලෙස මානව සම්පත් යොදා ගනිමින් වන අලි පලවා හැරීම සහ එම වන අලි සම්බන්ධව පසු විපරමක් කිරීම, අලි වැට ක්‍රියාත්මක කිරීම සහ වගා හානි වූ ගොවීන් සඳහා වන්දි ලබා දීමට කටයුතු කිරීම යන සමෝධානික ක්‍රියාවලියක් ඔස්සේ මේ වන විට යහපත් ප්‍රතිඵල ලබා ගෙන ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.9 වන අලි ගහනය තුලනය කිරීම - ගරු චන්දන තෙන්නකෝන් මහතා**

ගල්ගමුව වැනි කලාප තුළ වන අලි 50කට පමණක් ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබුණ ද එහි අලි ගහනය 300ක් පමණ වන බැවින්, මෙම අලි ගහනය තුලනය කිරීමට විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.10 පරිසරය ආරක්ෂා කිරීමට නීති පද්ධතියක් ස්ථාපිත කිරීම - ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

හපුතලේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති "සොරගුණේ" දේවාලයට අයත් අක්කර 650ක පමණ වනාන්තර ප්‍රදේශයක් පසුගිය සමයේ ගෝල්ෆ් පිටියක් ඉදිකිරීම සඳහා එළිපෙහෙළි කිරීම තුළින් එම වනාන්තර ප්‍රදේශය තුළ ජීවත් වූ සතුන් සහ ශාක විනාශ වූ බවත් මෙවැනි ක්‍රියාකාරකම් තුළින් ස්වභාවික පරිසරය තුළ පවතින ආහාර දාම විනාශ වී සත්ත්ව ගහනයන් වෙනස් වන බැවින් එවැනි ක්‍රියාකාරකම් මෙන්ම නීති විරෝධී මැණික් ගැරීම් වැනි පරිසරයට හානි සිදු කරන ක්‍රියාකාරකම් වැළක්වීමට නීති රීති පැනවිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.11 අලි මිනිස් ගැටුම් වළක්වාලීම - පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායක, ගරු සජිත් ප්‍රේමදාස මහතා**

අලි මිනිස් ගැටුම් සහ වන සතුන්ගෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවල ඒකාබද්ධතාවයෙන් සැලසුම් කරන ලද ජාතික වැඩපිළිවෙලක් ඔස්සේ විධිමත් ලෙස කටයුතු කරන ලෙස පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, පසුගිය දිනවල දී දුම්රියෙහි ගැටීමෙන් වන අලි මිය යාම සම්බන්ධයෙන් රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව සහ වන සතුන්ගෙන් සිදුවන හානි හේතුවෙන් විනාශවන මිනිස් ජීවිත, වගාවන් සහ දේපළ සඳහා ලබා දෙන රක්ෂණාවරණ සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

ආහාර සහ ජල අවශ්‍යතා සපුරා ගැනීමට වන සතුන් වගා ප්‍රදේශවලට පැමිණෙන බැවින් එය වැළැක්වීම සඳහා රක්ෂිත ප්‍රදේශ සහ ඒවා තුළ පවතින අලිමංකඩ ආදිය ආරක්ෂා කිරීමටත්, මෙම ගැටලු විසඳීමට කටයුතු කළ යුතු ආයතනවල කාලයක් පුරාවට පවතින පිරිස් බල හිඟතාවය සම්බන්ධ ගැටලුවට විසඳුම් ලෙස බහු කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තු, සිවිල් ආරක්ෂක බලකාය වැනි ආයතනවල නිලධාරීන් යොදාගැනීමට මෙන්ම මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධ ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් ස්ථිර කර ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, වන අලි සහ අනෙකුත් සත්ත්ව විශේෂ සම්බන්ධයෙන් සංගණන සිදු කිරීම ඉතා වැදගත් බවත් එමඟින් මෙම සතුන් සංඛ්‍යාව පිළිබඳව දැනුවත් වීම තුළින් ඔවුන් පාලනය කිරීම විධිමත් ලෙස සිදු කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කළ හැකි බවත් පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

වන අලි පලවා හැරීමට භාවිත කරන විදුලි වැට සඳහා වන අලි මේ වන විට අනුවර්තනය වී ඇති බැවින් ඒ වෙනුවට බාධක කිහිපයකින් යුක්ත අලි වැටක් යෙදීමට කටයුතු කරන බවත් දුම්රියේ අලි ගැටීමේ සිදුවීමත් සමඟ ගරු අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන්, දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීන් සහ පරිසරවේදීන් සමඟ මෙම ගැටලුව විසඳීම සඳහා ගත හැකි පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර ඒ සඳහා සාධනීය විසඳුම් රාශියක් ඉදිරිපත් වූ බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, රියදුරුට දුම්රිය මාර්ගයේ ඉදිරිය පෙනෙන ආකාරයට දුම්රිය මාර්ගය දෙපස කැලෑ එළි පෙහෙළි කිරීමටත් මේ වන විට දුම්රිය එන්ජින්වල පවතින එක් දිශාවක් පමණක් පෙනීම වෙනුවට සෑම දිශාවක්ම පෙනෙන ආකාරයට දුම්රිය එන්ජින් වෙනස් කිරීමට මෙන්ම දුම්රිය මාර්ගය ගල් දමා පිරවීමට සහ දුම්රිය කාලසටහන් වෙනස් කිරීමට ද පියවර ගන්නා බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාමාර්ගවලට අමතරව අමාත්‍යාංශ ලේකම්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති ද ඇතුළත්ව තාක්ෂණික කමිටුවක් පත්කර ඇති බවත් එහිදී මීටර් 500ක් ඇතුළත දුරක දී වන අලි හඳුනාගැනීම සඳහා තාප රූප සහිත කැමරා (Thermal images) දුම්රිය එන්ජින් සඳහා සවිකිරීමට යෝජනා වූ බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නැගෙනහිර ප්‍රදේශයේ ධාවනය වන දුම්රිය හතර සඳහා පළමුව මෙම කැමරා සවි කිරීමට කටයුතු කරන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අමතරව දුම්රිය පැමිණීමේදී විදුලි ආලෝකය (light and flashers) දැල්වීමටත් දුම්රිය මාර්ගයේ අලි සිටිනා බව රියදුරාට සහ එම දුම්රිය ස්ථානය දෙපස පිහිටා ඇති දුම්රිය ස්ථානවලට දැනුම් දීමට අඩු වියදමකින් නිපදවිය හැකි නව නිපැයුම් රාශියක් තරුණ ප්‍රජාව විසින් හඳුන්වා දුන් බවත් එම නව නිපැයුම් ඉදිරි මාස කිහිපය ඇතුළත හඳුන්වා දීමට බලාපොරොත්තු වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පරිසරය ආරක්ෂා කිරීම ප්‍රතිපත්තියක් ලෙස පැහැදිලිවම සඳහන් කරමින් වන සතුන් සඳහා අවශ්‍ය ජලය ලබා දීමට වැව් සෑදීම වැනි කටයුතු සඳහා මෙවර අයවැය තුළින් රු. බිලියන 640ක් වෙන්කර තිබෙන බවත් වන සතුන්ගෙන් සිදුවන හානි වැළැක්විය යුතුය යන අරමුණ ඇතිව වන සත්ත්ව හානි සඳහා ලබා දෙනු ලබන වන්දි මුදල දෙගුණයක් කිරීමට තීරණය කර තිබෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

තව ද, වන අලියකු සඳහා දිනකට කිලෝග්‍රෑම් 150ක පමණ ආහාර අවශ්‍ය වන බවත් ඒ සඳහා ඔවුන් කිලෝමීටර් 05 - 20ත් අතර දුර ප්‍රමාණයක් සංක්‍රමණය වන බැවින්, ඔවුන්ට සංක්‍රමණය සඳහා අවශ්‍ය මාර්ග පිළිසකර කිරීමටත් වනාන්තර සුපෝෂණය කිරීමටත් කටයුතු කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මේ වන විට පැවැත්වීමට සූදානම් කර තිබෙනුයේ සත්ත්ව සංගණනයක් නොව සතුන් පිළිබඳ සමීක්ෂණයක් පමණක් බවත් මෙමඟින් ලැබෙන තොරතුරු 100% නිවැරදි නොවන නමුත් එමඟින් සතුන්ගේ සංඛ්‍යාව පිළිබඳව යම් තක්සේරුවක් ලබා ගැනීමේ හැකියාවක් ලැබෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ ආකාරයෙන් අලි සම්බන්ධයෙන් ද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සමීක්ෂණයක් සිදුකර තිබෙන බවත් එහිදී ලැබුණු තොරතුරු නුදුරේදීම ප්‍රකාශයට පත් කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

බොහෝ රාජ්‍ය නිලධාරීන් පරිසරය සුරැකීමේ අභිලාෂයෙන් යුක්තව අවංකව තම රාජකාරි කටයුතු සිදු කරන බවත් එසේ නොවන අවස්ථා හඳුනාගෙන ඒවා විසඳීමට කටයුතු කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පරිසරයේ පවතින අන්තර් සම්බන්ධතාවලට බාධා නොවන පරිදි ජනතාවගේ ආකල්ප සහ සංස්කෘතිය යන සියලු දේ සැලකිල්ලට ගනිමින් මෙම ගැටලුව විසඳීම සඳහා පියවර ගන්නා බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.12 පරිසරය සුරැකීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල දායකත්වය - ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

පරිසරය සුරැකීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාකරන සියලුම රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ පරිසර අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයකින් යුක්තව කටයුතු කිරීම තුළින් බොහෝ පාරිසරික ගැටලුවලට සාර්ථක විසඳුම් ලබා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවර අයවැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන තුළින් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක වන කාර්යන් සම්බන්ධයෙන් ඉදිරියේ දී දැනුම් දෙන බවත් ඒ අනුව එම කටයුතු සඳහා සම්පත්දායකයින් සම්බන්ධ කරගැනීමටත් ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමටත් හැකියාව ලැබෙනු ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහනුවර දිස්ත්‍රික්කය තුළ වන සතුන්ගෙන් වගාවන්ට සහ සාමාන්‍ය ජනතාවට සිදුවන හානි වැළැක්වීමට පරිසරවේදීන්, ගොවිජන සේවා නිලධාරීන්, වනජීවී නිලධාරීන් සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළත් කමිටුවක් පත් කර සැලසුම් සකස් කළ ද වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වන සතුන් සහ ශාක සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වගකීම පැවරී ඇති බැවින්, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට මෙම කමිටුවට කිසිඳු බලයක් නොමැති වූ බවත් මේ සම්බන්ධයෙන් වගකීම භාර ගැනීමට කිසිඳු ආයතනයක් සූදානම් නොවූ බවත් ජගත් මනුවර්ණ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා වගකීම පැවරී ඇති ආයතනය විසින් මැදිහත්වීමක් සිදු නොකරන තුරු කිසිඳු පියවරක් ගත නොහැකි බව ද ගරු ජගත් මනුවර්ණ මහතා විසින් දැනුම් දෙන ලදී.

මොනරා, දඬුලේනා ආරක්ෂිත සතුන් වන නමුත් ඉත්තෑවා, වල් ඌරා සහ රිළවා යන සතුන් ආරක්ෂිත නොවන සතුන් වන බැවින් ප්‍රතිපත්තිමය සහ නීතිමය තත්ත්වයන් යටතේ කටයුතු කිරීමේ දී පවතින නීති රීති උල්ලංඝනය කළ නොහැකි වීම හේතුවෙන් විද්‍යාත්මක දැක්මක් ඔස්සේ සමාජයීය වශයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවත් ඒ සඳහා පුළුල් ලෙස සාකච්ඡා කොට ප්‍රතිපත්තිමය තීන්දු ගෙන එම තීරණවලට අනුවකූලව නීති සකස් කළ යුතු බවත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (රා.අ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.13 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් පවරා ගැනීම - ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**

තම පළාතේ දොරගල ප්‍රදේශයේ වසර 30 - 40ක් පමණ කාලයක් මුළුල්ලේ වගා කරන ලද ඉඩම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු සිදු කිරීමේ දී ගැටලු මතු වී ඇති බැවින් සහ ගම්පොළ උඩ පළාත, හුණුගල ආදී ග්‍රාම සේවා වසම් 19කට අයත් ප්‍රදේශ ද මෙලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අත්පත් කර ගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටින බැවින් මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවලට හෝ යොමු කර නිවැරදි නිර්දේශ මත එම ඉඩම් නැවත අත්පත් කරගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ගැටලුව සම්බන්ධයෙන් ලිඛිත තොරතුරු ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත උපදෙස් ලබාදෙන ලදී.

**3.14 වයඹ පළාත තුළ ජාතික පාරිසරික පනත බලාත්මක කිරීම - ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**

රට පුරා ක්‍රියාත්මක වන ජාතික පාරිසරික පනත වෙනුවට වයඹ පළාත තුළ පරිසර ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වීම තුළින් මෙම පළාතේ ඇතිවන පාරිසරික ගැටලු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියට මැදිහත් විය නොහැකි වීමෙන් විශාල බාධාවක් මතුවී ඇති බැවින් රට පුරා ඒකීය නීතියක් ක්‍රියාත්මක කරමින් වයඹ පළාත තුළ ද ජාතික පාරිසරික පනත බලාත්මක කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

වයඹ පළාත මඟින් සමගාමී ලැයිස්තුව යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය පළාත තුළ ක්‍රියාත්මක වීම හේතුවෙන් පැන නැගී ඇති ගැටලුමය තත්ත්වය විසඳීම සඳහා නීතිපති උපදෙස් සහිතව වයඹ පළාත තුළ ජාතික පාරිසරික පනත බලාත්මක කිරීම සඳහා යෝජනාවලියක් සකස්කර, අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීමට යොමු කර ඇති බව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.15 කාලානුරූපීව භූගත ජල මට්ටම් අඩුවීම - ගරු ටී. කේ. ජයසුන්දර මහතා**

සිංහරාජය වැනි ශාක ගහනය බහුලව පවතින ප්‍රදේශවල ද වර්තමානයේ පවතින කාලගුණ තත්ත්වය යටතේ කෙටි කාලයක් තුළ වර්ෂාව නොලැබුණහොත් භූගත ජලය හිඟවී වගාවන් සහ ජල ප්‍රභව වියළීයාම සිදුවන බැවින් ප්‍රජා ජල ව්‍යාපෘති ඔස්සේ ජනතාවට ජලය ලබා දීම සඳහා විශාල මුදලක් වැය වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය වසර 10ක කාල සීමාවක් තුළ සංවේදී කලාප ආශ්‍රිතව පවතින භූගත ජල මට්ටම් සම්බන්ධයෙන් නිමාන පද්ධති හරහා ලබා ගත් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී මෙම කලාප තුළ භූගත ජල මට්ටමේ දීර්ඝකාලීන වෙනස්කම් දැකිය නොහැකි නමුත් කාලානුරූපීව සිදු වී ඇති වෙනස්කම් දැකිය හැකි වූ බවත් මෙම ලබා ගත් දත්ත

ඇසුරින් භූගත ජලය කෘත්‍රිමව ප්‍රතිආරෝපණය කිරීමට සැලසුම් සකස් කර ප්‍රජා ජල ව්‍යාපෘති ඔස්සේ ස්ථාන 03ක නියමු ව්‍යාපෘති දියත් කරන ලද අතර වෙනත් ස්ථානවල ද එම ව්‍යාපෘති සිදු කිරීමට සැලසුම් කර ඇති බවත් ජල සම්පත් මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගෝලීය උණුසුම හේතුවෙන් පසුගිය වසර 30ක පමණ කාලයක් තුළ ජල වාෂ්පීකරණය ඉහළ යාම හේතුවෙන්, වර්ෂාව ලැබී ඉතා කෙටි කාලයක් තුළ ජල හිඟයක් ඇති වීම හේතුවෙන් එම තත්ත්වය යටතේ උග්‍ර ජල අතිරික්තයක් හා ජල හිඟයත් අතර විශාල ගැටලු රාශියකට මුහුණ පෑමට සිදුවී ඇති බවත් මෙම ගැටලු විසඳීම සඳහා පාරම්පරිකව සිදු කරනු ලබන කන්න වගා ක්‍රමය වෙනුවට නව කෘෂිකාර්මික තාක්ෂණ ක්‍රම භාවිතා කිරීමට සිදුවන බැවින්, ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මෙන්ම වෙනත් ආයතන මඟින් ද මේ වන විට විවිධ පර්යේෂණ සිදු කරන අතර මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී සාකච්ඡා කර මෙකී ගැටලු සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 12.50ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 05**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා (සභාපති)
ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය)
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ක්‍රිෂ්නන් කලෙයිවෙල්වි මෙනෙවිය
ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු ලාල් ප්‍රේමනාත් මහතා
ගරු සුනිල් බියන්විල මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු අශෝක ගුණසේන මහතා
ගරු නීතීඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

**1. ගරු සභාපතිතුමාගේ නිවේදන**

රේඛීය අමාත්‍යාංශයේ විෂය පථය සම්බන්ධයෙන් කෙටි හැඳින්වීමක් සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දෙන ලදී.

2024.11.25 වැනි දින නිකුත් කරන ලද අංක 2412/08 ගැසට් නිවේදනයට අනුව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට ආයතන 29ක් අයත් වන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල, ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව යන ආයතන දැනට ඈවර කිරීමට යෝජනා කර ඇති බවත් එම ආයතන භෞතික වශයෙන් දැනට ක්‍රියාත්මක නොවන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

තේ, රබර් සහ පොල් යන වැවිලි බෝගවලට මෙන්ම කුරුඳු වැනි අපනයන බෝග සඳහා ද ප්‍රමුඛත්වය ලබාදී ඇති බවත් කරාබු නැටි, කෝපි, කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් යන අපනයන බෝග සම්බන්ධ කටයුතු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 262.15ක් බවත් 2025 වර්ෂයේ දී එම ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 275ක් දක්වා ඉහළ නංවාගැනීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයට වැඩි දායකත්වයක් සපයන්නේ කුඩා තේ වතු හිමිකරුවන් බැවින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් තේ කිලෝග්‍රෑම් මිලියන 400ක් නිපදවීම සඳහා ඉලක්කයක් ලබා දී ඇති බැවින් 2030 වර්ෂය වන විට එම ඉලක්කය සපුරාගැනීම සඳහා බලාපොරොත්තු වන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දේශගුණික විපර්යාස මත රබර් නිෂ්පාදනයෙහි අඩුවීමක් දක්නට ලැබෙන නමුත් 2025 වර්ෂයේ දී රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 78ක් දක්වා ඉහළ නැංවීමට උත්සාහ කරන බවත් මෙම වර්ෂයේ දී වව්නියාව දිස්ත්‍රික්කයේ රබර් වගාව ආරම්භ කිරීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ දී පොල් අස්වැන්න අඩුවීමට සතුන්ගෙන් වන හානි, පළිබෝධක හානි මෙන්ම පොල් පොහොර නොයෙදීම යන කරුණු හේතු වූ බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

2024 වර්ෂයේ දී පොල් ගෙඩි මිලියන 2,791ක අස්වැන්නක් ලැබී තිබූ බවත් 2025 වර්ෂයේ දී එම ඉලක්කය පොල් ගෙඩි මිලියන 2,875ක් දක්වා ඉහළ දැමීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න ඉහළ නැංවීම සඳහා උතුරු පොල් ත්‍රිකෝණයේ පොල් අක්කර 16,000ක් නැවත වගා කිරීමට අයවැය මඟින් රු. මිලියන 500ක ප්‍රතිපාදන වෙන් කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පොල් වතු කැබලි කිරීමේ දී අක්කර 30 - 40 දක්වා වූ බිම් කොටස් සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා බවත් අදාළ ආයතන එම ඉඩම් වෙනත් ව්‍යාපෘති සඳහා යොදාගන්නේ නම් ඊට සමාන භූමි ප්‍රදේශයක පොල් පැළ වගා කිරීමට නියම කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

විදුලිබල ව්‍යාපෘති සඳහා අනුමතිය ලබාදීමේ දී ඉඩම්වල තත්ත්වය නිරීක්ෂණය කිරීමෙන් පසු අනුමතිය ලබා දෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට දැනුම් දුන් බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ දී ලෝක ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ රුසියානු සමූහාණ්ඩුවෙන් පොහොර මෙට්‍රික් ටොන් 27,500ක ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශයට ලැබුණු බවත් එම පොහොර මිශ්‍ර කර පොල් වගා කරන ගොවීන්ට සහනාධාර මිලක් යටතේ ලබා දීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශය යටතේ වූ වැවිලි සමාගම් සතු ඌණ උපයෝජිත ඉඩම් හෙක්ටයාර 13,000ක ප්‍රමාණයක් ආයෝජකයන්ට ලබාදෙන බවත් ඒ සඳහා අයවැය මඟින් රු. මිලියන 250ක මුදලක් වෙන් කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීමට අදහස් කරන නිවාස දස දහසේ ව්‍යාපෘතිය මඟින් නිවාස 4,700ක් මේ වර්ෂයේ දී ඉදිකිරීමට බලාපොරොත්තු වන බවත් නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීම විනිවිදභාවකින් යුක්තව සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් තෝරාගන්නා බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

රු. මිලියන 1,300ක පමණ මුදලක් නිවාස සහ සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් වෙන් කර ඇති බව ද අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**2. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**2.1 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තා**
(2025.01.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**2.2 2022/2023 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව**
(2025.02.20 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**3. වෙනත් කරුණු**

**3.1 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**3.1.1 මඩකලපුව ප්‍රදේශයේ කජු වගාව දියුණුකිරීම**

මඩකලපුව දිස්ත්‍රික්කයේ කජු බෝගය වගා කිරීමට ඇති හැකියාව පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම ප්‍රදේශය තුළ වගා නොකරන ලද ඉඩම් බොහෝ ප්‍රමාණයක් තිබෙන බවත් ඒවා කජු වගාවට ඉතා සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2025 වර්ෂයේ තම ආයතනය වෙත ලබාදී ඇති ප්‍රතිපාදන අවම කර රු. මිලියන 30ක් පමණක් ලබා දී ඇති බවත් ලැබෙන ප්‍රතිපාදන අවම වීම හේතුවෙන් මෙම වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමේ ගැටලු ඇතිවී තිබෙන බවත් කජු සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මඩකලපුව දිස්ත්‍රික්කයේ මාංගානි (Mangani) ප්‍රදේශයේ කජු වගාව සඳහා ඉඩම් ඇති බැවින් එම ඉඩම් දිගු කාලීන බදු පදනම මත කජු වගාව සඳහා ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් ඌන උපයෝජිත ඉඩම් මේ වර්ෂය තුළ වගා කටයුතු සහ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දේශීය කජු අවශ්‍යතාව සපුරාගැනීමට පවා ප්‍රමාණවත් අස්වැන්නක් කජු වගාවෙන් නොලැබෙන බවත් පවතින ඉඩම් යොදාගෙන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගය මත කජු වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.1.2 මඩකලපුව ප්‍රදේශයේ පොල් වගාව දියුණුකිරීම**

පසුගිය වර්ෂයේ දී පළිබෝධක හානි (සුදු මැස්සා) සහ පොල් පොහොර සහනාධාර නොලැබීම හේතුවෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ පොල් අස්වැන්න අඩු වූ බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශයේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා පොහොර සහනාධාර ලබා දෙන ලෙසත් හානි වූ පොල් වගාවන් සඳහා යම් රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම දිස්ත්‍රික්කය තුළ සිටින කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරිගැන්වීමට යොදාගන්නා සංවර්ධන වැඩපිළිවෙළ පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මාර්තු මාසයේ දී කිලෝග්‍රෑම් 50ක පොහොර මිටියක් රු. 4,000/-ක මිලක් යටතේ පොහොර සහනාධාරයක් ලෙස ලබාදීමට බලාපොරොත්තු වන බවත් එහිදී මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා ද මෙම ආධාර ලබා දෙන බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පොල් වගාව සඳහා රක්ෂණාවරණයක් මේ අවස්ථාවේ දී ක්‍රියාත්මක නොවන බවත් එය වැදගත් යෝජනාවක් බැවින් ඉදිරියේ දී ගරු අමාත්‍යතුමා හා සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පොල් වගාව ව්‍යාප්ත කිරීමට සුදුසු ඉඩම් සොයා බැලීම සඳහා ප්‍රාදේශීය කළමනාකරුවන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් හා සාකච්ඡා කළ බවත් මඩකලපුව දිස්ත්‍රික්කයේ පොල් වගා කිරීමට සුදුසු ඉඩම් පිළිබඳව ද එම ප්‍රදේශයට පැමිණ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

උතුරු නැගෙනහිර පළාත්වල නව පොල් පැළ මිලියනයක් සිටුවීමේ ව්‍යාපෘතියක් සඳහා කටයුතු සූදානම් කර ඇති බව ද පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් එම දිස්ත්‍රික්කයේ බටහිර ප්‍රදේශයේ පොල් වගා කිරීමට සුදුසු භූමියක් යෝජනා කරන ලද බැවින් ඉදිරි කටයුතු සිදුකිරීමේ දී ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2025 වර්ෂයේ අක්කර 36,000ක පොල් වගාව කිරීමට සැලසුම් කර ඇති බවත් එයින් අක්කර 16,000ක් උතුරු පොල් ත්‍රිකෝණයට අයත් බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෙනත් දිස්ත්‍රික්ක සඳහා අක්කර 20,000ක් වෙන්කර ඇති බැවින් ඉන් කොටසක් මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා ද වෙන් වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පොල් පැළ මිලියන 2.5ක් වගා කිරීමට සැලසුම් සකස් කර ඇති බැවින් මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා සුදුසු යෝජනා ඇත්නම් එම යෝජනා කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

රුසියාවෙන් ලැබුණු එම් ඕ පී පොහොර මෙට්‍රික් ටොන් 55,000න් මෙට්‍රික් ටොන් 27,500ක් භාවිත කර මිශ්‍ර පොහොර සකස් කිරීමට අදහස් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වෙළෙඳපොළ මිල රු. 9,500/-ක් පමණ වන කිලෝග්‍රෑම් 50ක පොහොර මිටිය රු. 4000/-ක සහන මිලකට ලබාදීමට කටයුතු සූදානම් කර ඇති බවත් දැනට එම පොහොර අක්කර 5ට අඩු පොල් වතු හිමිකරුවන්ට ලබාදීමට අදහස් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වර්ෂා කාලයට පෙර පොල් පොහොර බෙදා දීම වැදගත් බව ගරු නීතීඥ හිරුනි විජේසිංහ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.2 කුඩා හා මධ්‍ය පරිමාණ තේ වතු හිමිකරුවන් සඳහා පොහොර සහනාධාර ලබාදීම - ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**

වී වගාවට සහ පොල් වගාවට ලබාදුන් පොහොර සහනාධාරය කුඩා පරිමාණ තේ වතු හිමිකරුවන් සඳහා ද ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය වර්ෂවල එක් පොහොර සැපයුම්කරුවකු සමඟ පමණක් ගිවිසුම් ගත වූ නමුත් මෙම වර්ෂයේ දී වෙනත් සැපයුම්කරුවන්ට ද අවස්ථාව ලබා දෙන බවත් තේ වගාව සඳහා පසුගිය වර්ෂයේ දී රු. 8,500/-ක් වූ පොහොර මිටිය රු. 4,500/-ක මුදලකට ලබා දුන් බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ දැනට ක්‍රියාත්මක කරන පොහොර සහනාධාර ක්‍රමය මාර්තු මාසයෙන් අවසන් වන බවත් නව ගිවිසුමකට ඇතුළත් වූ පසු පොහොරවල මිල රු. 4,000/-කින් අඩු කිරීමට බලාපොරොත්තු වන බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පොහොර ලබාගැනීමට එක සැපයුම්කරුවෙක් පමණක් සම්බන්ධ කර ගැනීමෙන් පැන නැඟුණු ප්‍රමිතියේ ගැටලු හා ප්‍රමාදවීම් මඟහරවා ගැනීමට සැපයුම්කරුවන් කිහිපදෙනෙකු සම්බන්ධ කර ගැනීමට අමාත්‍යාංශයේ ද අවධානය යොමුව ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය වර්ෂයේ පොහොර සඳහා රු. බිලියන 02ක් වෙන් කර තිබූ බවත් මෙම වර්ෂයට අදාළව ප්‍රථම අදියර සඳහා අයවැය මඟින් රු. මිලියන 800ක මුදලක් වෙන් කර ගත් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.3 මන්නාරම දිස්ත්‍රික්කයේ තල් සහ පොල් වගාවන් සම්බන්ධ ගැටලු - ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

මන්නාරම ප්‍රදේශය තල් වගාව බහුල ප්‍රදේශයක් වුවත් තල් ආශ්‍රිත නිෂ්පාදන (තල් අල, තල් පිනාටු (කොට්ටකිලංගු), තල් කොළ, තල් අතු) අලෙවි කර ගැනීමට නිසි වෙළෙඳපොළක් නොමැති වීම නිසා කර්මාන්තකරුවන් දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උත්සව අවස්ථාවල දී පමණක් මෙම නිෂ්පාදන අලෙවි කරන බැවින් මේ සඳහා නිසි වෙළෙඳ ප්‍රචාරණයක් අවශ්‍ය බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පැරණි තල් ගස් ඉවත් කිරීම මේ වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අත්හිටුවා ඇති බැවින් තල් දැව ආශ්‍රිත කර්මාන්තය ජීවනෝපාය කරගත් ජනතාවගේ අදායම් මාර්ග අහිමි වී තිබෙන නිසා ඒ පිළිබඳව සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මන්නාරම් ප්‍රදේශයේ ඇති පැරණි සහ යුද සමයේ හානියට ලක් වූ පොල්ගස් වෙනුවට නව පොල් පැළ වගා කිරීම සඳහා පොල් පැළ මුදලට හෝ නොමිලේ ලබා දීමට වැඩපිළිවෙළක් අවශ්‍ය බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය 300% කින් ඉහළ නංවා ඇති බවත් දේශීය වෙළෙඳපොළ තුළ අලෙවි අවස්ථා 30%කින් පමණ ඉහළ නැංවීම සඳහා කටයුතු කර ඇති බවත් තල් සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තල් ගස් කැපීම වෙනුවට තල්ගෙඩි සහ තල් පිති ආශ්‍රිත නිෂ්පාදන දිරිමත් කිරීමෙන් තල් ගස් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම වැදගත් බවත් අවුරුදු 5කට අධික කාලයක් තිස්සේ තල් ගස් කැපීමට ඉල්ලීම් ඉදිරිපත් වන බැවින් ඉදිරියේ දී තල් ගස් ඉවත් කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට අදහස් කරන බවත් තල් සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පොල් සංවර්ධන පනත යටතේ තල් වගාව සම්බන්ධව ඇතුළත් වී තිබෙන බැවින් එම පනත සංශෝධනය කිරීමට අවශ්‍ය බව තල් සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

**3.4 අම්පාර දිස්ත්‍රික්කයේ කොරායි වත්ත සම්බන්ධ ගැටලු - ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

අම්පාරේ පිහිටි කොරායි වත්ත (Korai) නම් පොල් සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩම් තුළ කොටසක රටකජු සිටුවීමට අවසර ලබා දී ඇති බවත් එහි ජල නල සවිකොට ඉදිරි වැඩ කරගෙන යාමට අවසර ලබා නොදීම නිසා එම වගා කටයුතු ඉදිරියට කරගෙන යාමට බාධා මතුව තිබෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් අක්කර 469ක ප්‍රමාණයකින් යුතු මෙම ඉඩම තුළ පොල් වගාව සහ කජු වගාව සිදු කරන බවත් මේ පිළිබඳ වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය පියවර ගන්නා බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පොල් ඉඩම්වල වෙනත් වගාවන් සිදු කිරීමට තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයෙන් අවසර ගත යුතු බවත් ජනතාවට එම ඉඩම්වල වෙනත් වගාවන් සිදුකිරීමට ඇති හැකියාව පිළිබඳ විමසා බලන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.5 තේ වගාව සම්බන්ධ ගැටලු - ගරු වී. කේ. ජයසුන්දර මහතා**

තේ වගා බිම්වල නැවත තේ වගා කිරීම (replanting) පිළිබඳව සහ තේ පර්යේෂණ ආයතනය මඟින් නිපදවන තේ ප්‍රභේද ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රචලිත කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තේ අස්වැන්න ඉහළ නැංවීම සඳහා අධි ඝනත්ව තේ වගාව (High Density Tea Planting) වෙත යොමුවීමේ වැදගත්කම සහ එවැනි වගාවක් බිම් මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා සිදු කරන වැඩපිළිවෙළ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම වර්ෂය සඳහා හෙක්ටයාර 1,200ක පැළ මිලියන 276ක් නැවත වගා කිරීමට ද හෙක්ටයාර 40ක් සඳහා පැළ මිලියන 5.6ක නව වගාවක් වශයෙන්

ආරම්භ කිරීමට ද පාළු සිටුවීම (in filling) සඳහා පැළ මිලියන 20ක් යොදාගැනීමට ද බලාපොරොත්තු වන බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පවතින තේ පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව කඩිනමින් සම්පූර්ණ කළ යුතු බව ගරු නිශාන්ත පෙරේරා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට සමස්ත රාජ්‍ය සේවය තුළම නිලධාරීන්ගේ හිඟයක් පවතින බැවින් ඉදිරියේ දී සියලුම අංශ සඳහා නිලධාරීන් 30,000ක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට කටයුතු කරන බවත් එහිදී අත්‍යාවශ්‍ය පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අමාත්‍යාංශවලට අවස්ථාව දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.6 ගරු ලාල් ප්‍රේමනාත් මහතා

### 3.6.1 වගා කිරීමට සුදුසු තේ ප්‍රභේද නොමැතිවීම

රත්නපුර, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්කවල වගා කිරීමට සුදුසු තේ පැළ නොමැති වීම හේතුවෙන් නැවත වගාව අඩපණ වී ඇති බැවින් ඒ සම්බන්ධව තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තේ ප්‍රභේද වශයෙන් ආයු කාලය වැඩි අස්වැන්න අඩු 4049 ක්ලෝනය ද (TRI Clone 4049) ආයු කාලය අඩු අස්වැන්න වැඩි 2023 ක්ලෝනය ද (TRI Clone 2023) නිර්දේශ කළ හැකි නමුත් මෙම ප්‍රභේද වගාකරුවන්ට ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු නිශාන්ත පෙරේරා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මව් ශාක වගා කරන ඉඩම් ප්‍රමාණය වර්ධනය කිරීම, වැවිලිකරුවන්ට ඉඩම් ලබාදීම වැනි කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු බවත් තේ රිකිලි ඉක්මනින් ලබා ගැනීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය බලාපොරොත්තු වන බවත් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වාණිජ තවාන් 1,200ක් සහ ආයතනික තවන් 10ක් තුළ තේ පැළ මිලියන 200ක් වගා කිරීමට බලාපොරොත්තු වන බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

තේ පර්යේෂණ ආයතනය මඟින් නව ප්‍රභේද නිෂ්පාදනය කිරීමට අමතරව මව් ශාක වගා කිරීමේ ව්‍යාපෘතියක් අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කරන බව තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ප්‍රථම අදියර යටතේ නව මව් ශාක ප්‍රභේද හෙක්ටයාර් 22ක වගා කිරීමට කටයුතු කර ඇති බව තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

දෙවන අදියර යටතේ හෙක්ටයාර 14ක් තුළ මව් ශාක ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන බවත් 4049 ක්ලෝනය (TRI Clone 4049) ඒ සඳහා බහුල වශයෙන් යොදා ගන්නා බවත් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

මෙම නව මව් ශාක ව්‍යාපෘතිය යටතේ අලුත් ප්‍රභේද හැකිතාක් ව්‍යාප්ත කිරීමට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් යොදාගත් බවත් 2027 වර්ෂයේ දී දෙවන අදියර නිමා කිරීමට බලාපොරොත්තු වන බවත් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

නැවත තේ වගාකිරීමට වතු සමාගම් කටයුතු නොකිරීම හේතුවෙන් සමාගම් වතුවල තේ නිෂ්පාදනය අඩු වී ඇති බව ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එයට පිළියම් ලෙස ජනතාවට එම ඉඩම් වගා කිරීම සඳහා ලබාදීමට කටයුතු කරන ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.6.2 මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය රජයේ මූලික රෝහල වෙනත් ස්ථානයක ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනීම

මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි දෙනියාය රජයේ මූලික රෝහල නිතර නායයාමට ලක්වන භූමියක ඉදිකර ඇති බැවින් එය වෙනත් ස්ථානයක ඉදිකළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තලවකැලේ වැවිලි සමාගම විසින් ඒ සඳහා ඉඩමක් ලබාදීමට එකඟත්වය පළ කර තිබුණ ද එම ස්ථානය සම්බන්ධයෙන් නඩුවක් පවතින බැවින් වැවිලි සමාගම් සමඟ සාකච්ඡාවකට එළැඹෙන ඉදිරි දිනයක දී මේ පිළිබඳව ද සාකච්ඡාවට ලක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා ප්‍රමුඛ පිරිස සහ මන්ත්‍රීවරුන් සම්බන්ධ වී සිදුකළ සාකච්ඡාවේ දී රේඛීය අමාත්‍යාංශය මැදිහත්ව එම ඉඩම නිරවුල් කර දීමට පියවර ගැනීමට එකඟ වූ බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මෙම ගැටලුව පිළිබඳ සාකච්ඡා කර අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමතිය ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 3.7 බදු පදනම මත වැවිලි සමාගම් වෙත ලබා දුන් වතු ආශ්‍රිත ගැටලු - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා

පුද්ගලික සමාගම්වලට බදු වශයෙන් පවරා දී තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඇතැම් වතු බදු දීමේ දී කිසිඳු විද්‍යාත්මක පදනමකින් තොරව ලබාදී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පවරා ගත් වතු නිසි ලෙස සංවර්ධනය කිරීම සහ ඒවායේ බදු කුලිය ගෙවීම පිළිබඳ යම් පසුවිපරමක් කර ඇති ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

නිශ්චිත අරමුණකින් තොරව බදු දීම හේතුවෙන් වගා කටයුතු සිදු නොකෙරෙන වතු සහ ඇතැම් ව්‍යාපෘති සඳහා බදු දුන් වතු පිළිබඳව පරීක්ෂාවට ලක් කරන බව ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බදු ගිවිසුම්වල සඳහන් ආකාරයෙන් තොරව කටයුතු කර ඇති ආයතනවලට නඩු පැවරීමටත් එම වතු නැවත මෙම ආයතනය වෙත පවරා ගැනීමටත්

කටයුතු කරන බව ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය විසින් ද මේ පිළිබඳව අදහස් පළ කරන ලදී.

**3.8 වැවිලි සමාගම් සඳහා ලබා දුන් වතු නැවත වගා කිරීම සම්බන්ධ ගැටලු - ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

නැවත තේ වගාවක් ආරම්භ කිරීමේ කොන්දේසිය මත 1992 වර්ෂයේ දී වැවිලි සමාගම් 22කට රජයේ වතු බදු දීමක් සිදු කළ ද වර්තමානයේ දී ඒවායේ නැවත වගාවක් සිදු නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ඒ සඳහා පවත්වාගෙන ආ පැළ තවාන් (Nurseries) නිසි ලෙස නඩත්තු නොවන බැවින් ඒවා ද නැවත ආරම්භ කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තේ පර්යේෂණ ආයතනයේ බදුල්ල පස්සර ආයතනය නැවත ආරම්භ කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වගා නොකළ රාජ්‍ය වැවිලි සමාගම්වලට අයත් ඉඩම් කඩිනමින් වගා කිරීමට හෝ නිසි ක්‍රමවේදයකට බදු දීමට රජය මැදිහත් විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

වර්තමානයේ රට තුළ පවතින තේ කර්මාන්තශාලා 198ක පමණ ප්‍රමාණය දියුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

රාජ්‍ය වැවිලි සමාගම්වල (ජනතා වතු සංවර්ධන මණ්ඩලය, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව) ඇති ඌණ උපයෝජිත ඉඩම් ලබාදීමට සුදුසු ආයෝජකයින් පුවත්පත් දැන්වීම් පළකොට තෝරා ගැනීමට කටයුතු කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය වැවිලි සමාගම් එකිනෙකට වෙනස් වූ කොන්දේසි සහිත ගිවිසුම් වර්ග 05ක් සඳහා අත්සන් කර ඇති බවත් මෙම ගිවිසුම් 2048 පමණ වනතුරු වලංගු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

සියලුම වැවිලි සමාගම්වල විධායක නිලධාරීන් ගෙන්වා රාජ්‍ය අංශය සහ වැවිලි සමාගම් යන දෙපාර්ශවයටම වාසිදායක ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කිරීම සඳහා පඩි පාලක සභාව සමඟ සාකච්ඡා පවත්වා ඇති බවත් එහි ඉදිරි පියවර සඳහා වතු සමාගම් නිලධාරීන් සමඟ තවදුරටත් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

වතු කම්කරුවන්ගේ ආරක්ෂණය සම්බන්ධ ගැටලු මතුව ඇති බැවින් ඇතැම් වතු සමාගම් ක්‍රියාත්මක කරන පිටත වර්ධන පද්ධතියක් (Out Grow

System) රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීමට බාධා මතුව ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය වැවිලි සමාගම්වලින් ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයට අවම දායකත්වයක් ලැබීම නිසා සේවක සුභසාධනය ආරක්ෂා කරගනිමින් මෙම කර්මාන්ත වඩා ලාභ ලබන ආයතන බවට පත් කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.9 කුරුඳු වගාව සංවර්ධනය කිරීම සහ ඒ ආශ්‍රිත ගැටලු - ගරු නිශාන්ත පෙරේරා මහතා**

කුරුඳු වගාව සංවර්ධනය සහ කුරුඳු අපනයනය යන කාරණා පදනම් කරගෙන කුරුඳු සංවර්ධන පනත කඩිනමින් හඳුන්වා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කුරුඳු සංවර්ධනයට අදාළ කාර්යයන් ද ගැසට් කර ඇති බැවින් කුරුඳු වගාවට අදාළ කටයුතු එම අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කිරීමට අපේක්ෂා කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කුරුඳු සංවර්ධන පනත් කෙටුම්පත සකස් කිරීම අවසන් අදියරයේ පවතින බවත් රේඛීය අමාත්‍යාංශය යටතේ එන පර්යේෂණ ආයතන රැසක 1,800ක පමණ වූ සේවක පුරප්පාඩු සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් පිහිටුවා ඇති කමිටුව වෙත දැනුම් දී ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

කුරුඳු වගාව සංවර්ධනය කිරීම පිළිබඳ කටයුතු එක් ආයතනයක් යටතට ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය ආයතනවල ව්‍යුහය වෙනස්කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමිය සමඟ සාකච්ඡාවක් පවත්වන බවත් එහිදී කුරුඳු සංවර්ධනය පිළිබඳ සියලුම කටයුතු එක් අමාත්‍යාංශයක් යටතට ගැනීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.10 පොල් වගාව සංවර්ධනය කිරීම - ගරු සුනිල් බියන්විල මහතා**

විශාල පොල් වතු හිමියන් විසින් පොල් පොහොර නිසි ලෙස යෙදුව ද අක්කර 05ට අඩු වගාකරුවන් විසින් පොල් වතු සඳහා පොහොර යෙදීමට උනන්දු නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා උනන්දුව ඇති කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ පළිබෝධක අවම කිරීම සඳහා ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

2024 වර්ෂයේ දී පොල් අස්වැන්න 10% ප්‍රමාණයකින් අඩු වී ඇති බවත් පසුගිය වසර කිහිපය තුළ නිසි පරිදි පොහොර යොදා නොතිබීම ද අස්වැන්න අඩුවීමට හේතුවක් වූ බැවින් අක්කර 05ට අඩු පොල් වතු වගාකරුවන් වෙත පොහොර විධිමත්ව බෙදා හැරීමට කටයුතු කරන බවත් පොල් පර්යේෂණ ආයතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වගාකරුවන් උනන්දු කිරීම සඳහා මාධ්‍ය මඟින් සහ ප්‍රාදේශීය කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් පොහොර යෙදීමේ වැදගත්කම පිළිබඳව ප්‍රචාරණයක් ලබාදීමට සහ පසුවිපරම් කිරීමක් සිදු කිරීමට බලාපොරොත්තු වන බව පොල් පර්යේෂණ ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පොල් පර්යේෂණ ආයතනය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය එක්ව ඒකාබද්ධ වැඩසටහනක් ලෙස රෝග සහ පළිබෝධ මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරන බවත් ඒ සම්බන්ධයෙන් නිර්දේශ සහ තාක්ෂණික උපදෙස් ලබා දෙන බවත් පොල් පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශාල ප්‍රදේශයක එක්වර පළිබෝධ ව්‍යාප්තිය සහ රෝග ඇතිවීම නිසා පොල් වගාවේ පළිබෝධකයන් සහ රෝග මර්දනය තරමක් අපහසු කාර්යක් වුවත් පොල් වගාකිරීමේ මණ්ඩලය සහ ප්‍රජා සහයෝගීත්වය ඇතිව මෙම කටයුතු කරගෙන යෑමට උත්සහ කරන බව පොල් පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

කාලගුණික සාධක මත පළිබෝධක හානිවල අඩු වැඩිවීම් වාර්තා වන බවත් පසුගිය වර්ෂයේ දී ප්‍රධානතම රෝගයක් වූ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය මේ වන විට පාලනය කිරීමට කටයුතු කර ඇති බවත් පොල් පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම මර්දන ක්‍රියාවලිය තරමක් ගැටලුකාරී වී ඇත්තේ ජනතාව මර්දන කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය නොදැක්වීම නිසා බව ද පොල් පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

සුදු මැස්සා නම් පළිබෝධකයා පාලනය කිරීමට ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් හඳුන්වා දුන් පරපෝෂිතයන් ඇතැම් ප්‍රදේශවල වර්ධනය කර ගැනීමේ අපහසුව මත මෙම මර්දන කටයුතු තරමක් දුරට අඩපණ වී ඇති බව පොල් පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පළිබෝධ මර්දනය කිරීම සඳහා ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත බැවින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති බවත් රු. මිලියන 100ක් පමණ ප්‍රතිපාදන ඒ සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, වැලිගම කොළ මැලවීමේ රෝගයේ දී හානියට ලක්වූ පොල් ගස් ඉවත් කළ යුතු බැවින් ඒ සඳහා එක් අයෙකුට රු. 10,000/-ක මුදලක් ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය සහ පස්ගොඩ ප්‍රදේශවල පොල් සංවර්ධන නිලධාරීන් විසින් සුදු මැස්සා මර්දනය සඳහා දියරයක් නිෂ්පාදනය කර ඇති බැවින් ඒ සඳහා යම් සහයෝගයක් ලබාදෙන ලෙස ගරු ලාල් ප්‍රේමනාත් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පොල් සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 3.11 ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

### 3.11.1 වතු නිවාස ගිනි ගැනීම

පසුගිය මාස කිහිපයේ වරින් වර වතු ආශ්‍රිතව ඇති වතු නිවාස ගිනි ගැනීම් වාර්තා වී ඇති බවත් මේ සඳහා වැවිලි සමාගම් සහ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කර මෙම ලැයිම් නිවාස පරීක්ෂාවට ලක් කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

හැටන් ප්‍රදේශයේ වතු නිවාස ගිනිගැනීම් නිසා 38 දෙනෙකු පමණ අවතැන් වී ඇති බවත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු නිවාස ගිනිගැනීම් 10 – 12 ප්‍රමාණයක් වාර්තා වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වතු ආශ්‍රිතව පිහිටා ඇති වසර 150 - 200ක් පමණ පැරණි වතු නිවාස සඳහා විදුලි පහසුකම් ලබාදීමේ දී එම සම්බන්ධතා නිසිලෙස ආරක්ෂිතව ස්ථාපිත කර නොමැති බව පෙනී යන හෙයින් ලංකා විදුලිබල මණ්ඩලය දැනුවත් කර එම ගැටලු විසඳාගත යුතු බව වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, හැටන් ප්‍රදේශයේ ෂැනන් වත්තේ ඇති ගිනිගත් වතු නිවාස සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරීන් ද සහභාගී කරගනිමින් නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී එම ස්ථානයේ අලුතින් ඉදිකරන නිවාස ව්‍යාපෘතිය තුළ එම ගින්නෙන් අවතැන් වූ ජනතාව පදිංචි කිරීම සඳහා කටයුතු කරන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වතු නිවාස ගිනි ගැනීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ග්‍රාම නිලධාරි, පොලිසිය සහ විදුලිබල මණ්ඩලය සම්බන්ධ කරගෙන අනාරක්ෂිත ස්ථාන හඳුනාගැනීමට කටයුතු කිරීම සුදුසු බව ගරු මංජුල සුරවීර ආරච්චි මහතා විසින් යෝජනා කරන ලදී.

ලංකාවේ වතුකර පවුල් 250,000ක් පමණ ජීවත් වන බවත් ප්‍රායෝගිකව එම පවුල් ජීවත් වන සියලුම නිවාස පරීක්ෂාවට ලක් කිරීමට නොහැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, ප්‍රතිපාදන පිළිබඳ සලකා බලා ගිනි ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.11.2 සුදුසුකම් සපුරා නොමැති අයට නිවාස ලබාදීම

පසුගිය සමයේ ක්‍රියාත්මක වූ ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ දී (Indian Housing Project) සුදුසුකම් නොමැති පිරිසට නිවාස බෙදාදීම සහ නීත්‍යානුකූල නොවන ලෙස එම නිවාස විකිණීම පිළිබඳව නිසි පරිදි අධීක්ෂණයට ලක් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී හැටන් ප්‍රදේශයේ දික්ඔය ඇන්ෆීල්ඩ් වත්ත (Annfield Estate) තුළ වැවිලි මානව සංවර්ධන භාරය මැදිහත්ව නිවාස 15ක් බෙදා දීමේ දී මෙවැනි අක්‍රමිකතාවයක් සිදුව ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

ඇන්ෆීල්ඩ් වත්ත (Annfield Estate) තුළ ඇති නිවාස තම ආයතනයෙන් නොව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ලබාදෙන බවත් මෙවැනි අක්‍රමිකතා සම්බන්ධව පැමිණිල්ලක් තම ආයතනයට ඉදිරිපත් කළහොත් සොයා බැලීමට හැකි බවත් වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බගවන්තලාවේ බොගවාන වත්තේ ද නිවාස හිමි තැනැත්තන්ට නව නිවාස ලබා දීම් සහ එම නිවාස වෙනත් පුද්ගලයන්ට විකිණීම් පිළිබඳව වාර්තා වී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම නිවාස ලබාදුන් තැනැත්තන්ගේ තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමිය විසින් වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරීන්ගෙන් විමසීමක් කරන ලදී.

එම තොරතුරු ලබාදීමට කටයුතු කරන බවත් තම ආයතනයේ නිලධාරීන් එම තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් විමසා බලන බවත් වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරීන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට සහභාගී නොවීමේ ගැටලු ඇතොත් ප්‍රාදේශීය ලේකම් සහ අමාත්‍යාංශ ලේකම් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ලබාදුන් නිවාස නීත්‍යානුකූල ලෙස විකිණීමට නොහැකි නමුත් මුදල් ගනුදෙනු සිදුකර ඒවායේ වෙනත් පුද්ගලයන් පදිංචි වී ඇති බවත් කැප්පෙටිපොළ ප්‍රදේශයේ ද මෙවැනි සිදුවීම් වාර්තා වී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉන්දීය නිවාස යෝජනා ක්‍රමය (Indian Housing Project) යටතේ මෙම වර්ෂය සඳහා නිවාස 4,700ක් සෑදීමට යෝජනා කර ඇති බවත් ආපදාවන්ට ලක් වූ සහ ඉතා පැරණි නිවාසවල ජීවත් වන ජනතාව සඳහා නිවාස ලබා දීමට නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් තොරතුරු රැස් කළ බවත් අතිරේක ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, සුදුසුකම් සපුරන ලද ප්‍රතිලාභීන් 5,000ක පමණ ලැයිස්තුවක් සකස් කර ඇති බව ද අතිරේක ලේකම් විසින් දැනුම් දෙන ලදී.

වාර්තා වී ඇති නිවාස විකිණීම් කර ඇති පුද්ගලයින්, කුලියට දෙන ලද සහ පදිංචිකරුවන් නොමැති නිවාස හිමි පුද්ගලයන් පිළිබඳව නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව අතිරේක ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික්ක 12ක පවතින බොහෝ නිවාස සම්බන්ධ තොරතුරු සොයාගැනීමේ දුෂ්කරතාවයක් පවතින බැවින් මෙවැනි අක්‍රමිකතා සම්බන්ධයෙන් අමාත්‍යාංශයට පැමිණිලි කිරීම වැදගත් බව ද අතිරේක ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ කරන ලද අධික ලෙස නායයන ස්ථානවල වාසය කරන 3,700 පමණ ජනතාව මෙම නිවාස

ලබාදීමේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට රේඛීය අමාත්‍යාංශය විසින් තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වර්තමානයේ දී මෙම නිවාස ලබා දීම විනිවිදභාවයකින් යුක්තව සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ තෝරාගත් අඩු පහසුකම්ලාභී වතු නිවාස 75ක ප්‍රතිසංස්කරණය සඳහා කටයුතු සූදානම් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එම පිළිසකර කිරීම් සඳහා පුහුණු ශ්‍රමික ගෙවීම් සහ අවශ්‍ය අමුද්‍රව්‍ය රේඛීය අමාත්‍යාංශය මඟින් සපයන බව ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

යටිතල පහසුකම් යටතේ වෙන් වූ ප්‍රතිපාදන යොදවා දැඩි ලෙස ගිනිගැනීමේ අවදානම් තත්ත්වයක පවතින වතු නිවාස පිළිසකර කළ හැකි බැවින් ඒ පිළිබඳ රේඛීය අමාත්‍යාංශයට දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.12 අපනයන බෝගවලට අධික ලෙස රසායනික යෙදීම නිසා හටගෙන ඇති ගැටලු - ගරු අසෝක සපුමල් රන්වල මහතා

අධික ලෙස රසායනික පොහොර සහ උත්තේජක (stimulators)යෙදීම නිසා කුරුඳු සහ තේවල ඇති ගුණාත්මකභාවය පිළිබඳව ගැටලු ඇතිවී තිබෙන බවත් ඒ හේතුවෙන් අපනයනය සඳහා පිළියෙළ කරන ලද තොග ප්‍රතික්ෂේප වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යුරෝපයට අපනයනය කිරීම සඳහා සකස් කරනු ලබන කුරුඳු තොග පරීක්ෂා කිරීමේ දී ඊයම් වැනි බැර ලෝහ පවතින බවට නිරීක්ෂණය වී ඇති බැවින් අධික ලෙස ග්ලයිෆොසේට් සහ එප්පාවල රොක් පොස්පේට් භාවිතා කිරීම පාලනය කළ යුතු බවත් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අධික ලෙස භූමිය සෝදාපාළුවට ලක්වීම නිසා පස සාරවත් කිරීම සඳහා කාබනික පොහොර නිර්දේශ කර හිතකර ක්ෂුද්‍ර ජීවී බයෝම පද්ධතියක් (Microbiology Biome) වගා බිම්වල වර්ධනය කරගත යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කාබනික පොහොර යෙදීම සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම සඳහා ද රු. ලක්ෂ 40ක පමණ අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් තේ පර්යේෂණ ආයතනය මැදිහත් වී කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තේ කර්මාන්තයේ ඵලදායීතාව වැඩි කරගැනීමට අධි ඝනත්ව තේ වගාව (High Density Tea Planting) සඳහා යොමු විය යුතු බව ගරු ටී. කේ. ජයසුන්දර මහතා විසින් යෝජනා කරන ලදී.

ඒ සඳහා තේ පර්යේෂණ ආයතනය විසින් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගරු ටී. කේ. ජයසුන්දර මහතා විසින් විමසීමක් කරන ලදී.

පසේ සාරවත් බව රඳා පවත්වා ගැනීමටත්, පසේ සෝදාපාළුව අවම කරගැනීමටත්, පසේ කාබනික ද්‍රව්‍ය මට්ටම ඉහළ නැංවීමටත් තේ පර්යේෂණ ආයතනයෙන් අවශ්‍ය නිර්දේශ නිකුත් කර ඇති නමුත් තේ වගාකරුවන් නිර්දේශ නිසි ලෙස නොපිළිපැදීම මත පසේ සාරවත් බව අඩු වී

ඇති බව තේ පර්යේෂණ ආයතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අධි ඝනත්ව තේ වගාවේ දී (High Density Tea Planting) වැඩි යෙදවුම් ප්‍රමාණයක් අවශ්‍ය බවත් එම වගා ක්‍රමය නිර්දේශ කළ හැක්කේ යහපත් කාලගුණ තත්ත්වයක් ඇති පරිසර කලාපවලට බවත් තේ පර්යේෂණ ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

රෝග පාලනය කිරීමට, ජල සම්පාදනයට සහ නැවත වගා කිරීමට අධික වියදම් දැරීමට සිදුවීම මත ද මෙම තේ වගා ක්‍රමය ප්‍රචලිත කිරීමේ අපහසුතා පවතින බව තේ පර්යේෂණ ආයතනයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

විදේශ වෙළෙඳපොළට යැවීමේ දී ප්‍රතික්ෂේප වන නිෂ්පාදන සම්බන්ධයෙන් දත්ත ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අපනයන පත්‍රිකා පරීක්ෂා කර අදාළ අපනයනකරු හඳුනාගැනීමට හැකියාව තිබෙන බවත් වර්තමානයේ දී ජපානයට අපනයනය කරන ලද තේ නිෂ්පාදනවල ග්ලයිෆොසේට් (Glyphosate) සහ ඩයිරෝන් (Diuron /DCMU) වැනි රසායන අඩංගු බව නිරීක්ෂණය වන බවත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැවත වගාව සඳහා ආධාර මුදල් ලබාදීමට කල් ගත වන බැවින් වගාකරුවන්ට තේ පර්යේෂණ ආයතන විසින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වන බවත් අධික ලෙස රසායනික පොහොර යොදා සෞඛ්‍යාරක්ෂිත නොවන ආකාරයෙන් තේ දළු නිපදවීම වැළැක්වීමට තේ පර්යේෂණ ආයතනය මැදිහත් විය යුතු බවත් ගරු නිශාන්ත පෙරේරා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැවත වගාවට මුදල් ප්‍රතිපාදන ලබාදීමට ප්‍රමාද වීම සහ විද්‍යාත්මක වගාවක් ක්‍රියාත්මක නොකිරීමට හේතු පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

අනුගමනය කළ යුතු කෘෂිකාර්මික ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමෙන් පසු මුදල් ලබාදීම සිදුකරන බවත් මුදල් ගෙවීමේ ක්‍රමවේදයේ ප්‍රමාදයක් නොමැති බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී .

යථා තත්ත්වයට පත්වන විදේශ වෙළෙඳපොළ ආරක්ෂා කිරීම සඳහා සුදුසු නීතිරීති පැනවිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විද්‍යානුකූල වගා කටයුතු දියුණු කිරීම සඳහා ගැප් ක්‍රමය (Good Agricultural Practices) අනුගමනය කිරීම වෙනුවෙන් සහතිකයක් ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට අදහස් කරන බවත් ඉදිරියේ දී මෙම සහතිකය ලබා ඇති පිරිසට පමණක් සහනාධාර ලබාදීමට කටයුතු කරන බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රමිතියෙන් යුතු පොහොර මිලදී ගැනීමට ප්‍රමාණවත් ආර්ථික ශක්තියක් නොතිබීම හේතුවෙන් ගොවීන් අඩු ප්‍රමිතියෙන් යුතු පොහොර ලබා ගන්නා බවත් ඒ හේතුවෙන් නැවතත් නිෂ්පාදනය පහත වැටෙන බවත් ගරු සුනිල් බියන්විල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු ටී. කේ. ජයසුන්දර මහතා ද මේ සම්බන්ධයෙන් අදහස් පළ කරන ලදී.

ගුණාත්මක තත්ත්වයේ පොහොර ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කරන බවත් පොහොර ප්‍රමිතිය හා සම්බන්ධ ගැටලු විසඳීම සඳහා අදාළ ආයතන සම්බන්ධ කරගනිමින් ජනතාව දැනුවත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට පොහොර මිටි 9,360ක් වැවිලිකරුවන්ට ලබා දී ඇති බවත් පොහොර මිටි 10,000ක් බෙදා හැරීමට ඉලක්ක කර ඇති බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්ටේට් ෆර්ටිලයිසර්ස් කම්පැනි ලිමිටඩ් ආයතනය (State Fertilizers Company Ltd.) මඟින් ලබාදුන් මෙම පොහොර තේ පර්යේෂණ ආයතනය මඟින් පරීක්ෂාවට ලක් කළ බවත් ඒවා නිසි ප්‍රමිතියෙන් යුතු බවට වාර්තා වූ බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.13 භූගෝලීය දර්ශක මත ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන ලියාපදිංචි කිරීම - ගරු නීතීඥ හිරුනි විජේසිංහ මහත්මිය**

2022 අංක 08 දරණ බුද්ධිමය දේපල (සංශෝධිත) පනතට අනුව භූගෝලීය දර්ශක (Geographical Indicators) මත නිෂ්පාදන ලියාපදිංචි කළ හැකි බවත් ලංකාවේ තේ සහ කුරුඳු නිෂ්පාදන ඒ යටතේ ලියාපදිංචි කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම නිෂ්පාදනවල ගුණාත්මකභාවය රඳා පවතින්නේ පසේ ගුණාත්මකභාවය සහ දේශගුණික තත්ත්වය මත බැවින් එම සාධක එලෙසම පවත්වා ගැනීමට උනන්දු විය යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සහ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මැදිහත් වී වෙනත් බෝග (උදා:-තල්, පොල්, කුළුබඩු) සඳහා ද මෙම භූගෝලීය දර්ශක මත නිෂ්පාදන ලියාපදිංචි කිරීම සිදු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

කුරුඳු සඳහා භූගෝලීය දර්ශක මත පදනම්ව යුරෝපා සංගමය තුළ ලියාපදිංචි වී ඇති බව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, තේ නිෂ්පාදන ලියාපදිංචිය සඳහා යොමු කරන ලද ඉල්ලුම්පත්‍රයට අනුමතිය ලැබී ඇති බව තේ පර්යේෂණ ආයතනයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තැඹිලි අපනයනය සඳහා භූගෝලීය දර්ශක මත ලියාපදිංචි වීමට අවශ්‍ය කරන ජානමය තත්ත්වය පිළිබඳ පර්යේෂණ සිදු කරමින් පවතින බව පොල් පර්යේෂණ ආයතනයේ සභාපති විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

රැස්වීම් වාරයට පෙර අදාළ යෝජනා ඉදිරිපත් කිරීමෙන් ඵලදායී පිළිතුරු ලබා ගැනීමට හැකි බැවින් කඩිනමින් අදාළ යෝජනා උපදේශක කාරක සභාව වෙත යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 4.05 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.